## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
## බස්නාහිර පළාතේ පළාත් සභාව

# 1991 අංක 07 දරන බස්නාහිර පළාතේ මෝටර් වාහන ප්‍රඥප්තිය

(බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතය සටහන් කළේ
1991 දෙසැම්බර් මස 9 වන දින)

බස්නාහිර පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් මිළ දී ගත හැක.

මිළ : රු. 25.00

## බස්නාහිර පළාතේ පළාත් සභාව

### මෝටර් වාහන ප්‍රඥප්තිය

***පළාත තුළ මෝටර් වාහන බලපත්‍ර නිකුත් කිරීම සහ පළාත ඇතුළත මෝටර් වාහන මගින් පාරවල් ඔස්සේ මගීන් ගෙන යාමේ සේවා සහ භාණ්ඩ ගෙන යාම විධිමත් කිරීම යන කරුණුවලට සම්බන්ධ වූ කරුණු සඳහා විධි විධාන සැලසීම පිණිස වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය වරින් වර සංශෝධිත 1951 අංක 14 දරන මෝටර් වාහන පනතේ සහ (203 වන අධිකාරය වූ) වාහන ආඥාපනතේ විධිවිධානවලට අනුකූලවේ.***

බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය 1991 අංක 7 දරන බස්නාහිර පළාතේ මෝටර් වාහන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේ ය. *(ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.)*

#### I වන කොටස
#### ආදායම් බලපත්‍ර

2. (1) නියමිත අධිකාරිය මගින් නිකුත් කරන ලද ආදායම් බලපත්‍රයක් බලාත්මකව නොමැත්තා වූ මෝටර් වාහනයක් කිසිම තැනැත්තකු විසින් පළාත තුළ පාරකට භාවිත කිරීම හෝ පාවිච්චි කිරීම නොකළ යුතු ය. *(ආදායම් බලපත්‍රයක් නොමැතිව මෝටර් වාහන පාරකට භාවිත කිරීම හෝ පාවිච්චි කිරීම නොකළ යුතු බව.)*

(2) මෙහි 1 වන උපවගන්තියේ කාර්යයන් සඳහා බස්නාහිර පළාතට අයත් මෝටර් වාහන සම්බන්ධව නියමිත අධිකාරිය වශයෙන් බස්නාහිර පළාතේ මෝටර් වාහන පළාත් කොමසාරිස් හෝ ඔහු විසින් බලය පවරන ලද ප්‍රාදේශීය ලේකම්වරු අදහස් වන අතර වෙනත් පළාත් සභාවකට අයත් වාහන සම්බන්ධයෙන් එකී පළාත් සභාවේ මෝටර් වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීම සඳහා බලයලත් අධිකාරිය ඇතුළත් වේ.

(3) යම් මෝටර් වාහනයක් ලියාපදිංචි කිරීමේ දී බලපත්‍ර අධිකාරිය වශයෙන් මෝටර් රථ රෙජිස්ට්‍රාර් හෝ මෝටර් රථ කොමසාරිස් හෝ ගම්පහ සහ කළුතර දිසාපතිවරුන් හෝ බස්නාහිර පළාත හෝ නියමකර ඇත්නම් එකී වාහනය බස්නාහිර පළාතට අයත් වාහනයක් සේ සැලකේ.

(4) මෝටර් වාහනයක තත්කාලයෙහි ලියාපදිංචි අයිතිකරු වන්නා වූ හෝ වරින් වර සංශෝධිත 1951 අංක 14 දරන මෝටර් වාහන පනතේ I වන කොටස යටතේ එලෙස සලකනු ලබන්නා වූ තැනැත්තා (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, ඊට පටහැනිව ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වාහනය පාරකෙහි ඇති බවට පූර්ව නිගමනය කරනු ලැබේ.

(5) පළාත තුළ මෝටර් වාහනයක වෙළෙන්දකු විසින්, විකිණීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද මෝටර් වාහනයක් ඔහු විසින් පාරකෙහි භාවිත කිරීම, ඒ වාහනය කොටිකුණ ඉතිරිව තිබෙන තාක් කල් සහ වෙළෙන්දෙකුගේ බලපත්‍රයක අධිකාරය යටතේ හැර, එය මගින් මගීන් පාවිච්චි නොකරන ලද තාක් කල් (1) වන උපවගන්තිය කඩ කිරීමක් නොවන ලෙස සලකනු ලැබිය යුතු ය.

1-CP 019404 – 2,500 (92/01)

(5අ) පළාත තුළ නිෂ්පාදකයකු විසින් විකිණීමේ කාර්ය සඳහා පළාත තුළ දී මෝටර් වාහනයක සන්තකය දැරීම, එම වාහනය නොවිකුණා තිබෙන තාක් සහ පළාත තුළ යම් මහා මාර්ගයක පාවිච්චි කරනු නොලබනතාක් කල් (1) වන උප වගන්තිය කඩ කිරීමක් නොවන ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) වෙළෙන්දකුගේ බලපත්‍රයක අධිකාරය යටතේ මෝටර් වාහනයක් නියාමනුකූල ලෙස පාවිච්චි කරනු ලබන්නේ නම් සහ තත් කාර්යය සඳහා නියම කරන ලද හැඳින්වීම් අංකයකින් එය හඳුනා ගනු ලබන්නේ නම් පමණක් මෝටර් වාහනයක් සන්තකයෙහි තබා ගැනීමට තත් කාලයෙහි හිමිකම් ඇති තැනැත්තකු විසින් මෝටර් වාහනයක් සන්තකයෙහි තබා ගැනීම (1) වන උපවගන්තිය කඩ කිරීමක් නොවන ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) මෝටර් වාහනයක් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ (වෙළෙන්දකු නොවන) තැනැත්තකු විසින්, ආදායම් බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් කරනු ලැබ ඇත්නම් සහ ඒ ඉල්ලීම අවසාන වශයෙන් තීරණය කරනු ලැබ නොමැති නම් පමණක්, ඒ තැනැත්තා විසින් මෝටර් වාහනය සන්තකයෙහි තබා ගැනීම (1) වන උපවගන්තිය කඩ කිරීමක් නොවන ලෙස සලකනු ලැබිය යුතු ය.

(8) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ මෝටර් වාහනයක් රේගු ස්ථානයෙන් ඉවත් කර ගෙන යාමේ කාර්යය සඳහා සහ ඒ අතර තුර දී, පමණක් මහා මාර්ගයක දී පාවිච්චි කිරීම (1) වන උපවගන්තිය කඩ කිරීමක් නොවන ලෙස සලකනු ලැබිය යුතු ය.

(9) පාවිච්චි නොකිරීමේ කාල සීමාව සම්බන්ධයෙන් 13 වන වගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබ ඇත්තා වූ මෝටර් වාහනයක්, යම් කාල සීමාවක් තුළ යම් ස්ථානයක දී පාවිච්චි නොකරනු ලැබුවහොත්, එම කාල සීමාව තුළ පමණක් යම් තැනැත්තකු විසින් ඒ වාහනය සන්තකයෙහි තබා ගැනීම (1) වන උපවගන්තිය කඩ කිරීමක් නොවන ලෙස සලකනු ලැබිය යුතු ය.

(10) අලුත්වැඩියා කිරීමේ කාර්යය සඳහා හෝ මේ ප්‍රඥප්තියේ යම් විධි විධානයක් අනුව ක්‍රියා කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් නියමිත කාර්යයක් සඳහා නියමිත දිනයක දී පළාත තුළ නියමිත ස්ථානයක සිට යම් මෝටර් වාහනයක් ගෙන යාමට බලය දෙමින් කොමසාරිස්වරයා විසින් අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි අතර, එසේ නිකුත් කරන ලද අවසර පත්‍රයකට අනුකූලව එසේ ගෙන යාමේ කාර්යය සඳහා එම මෝටර් වාහනය පාවිච්චි කිරීම (1) වන උපවගන්තිය කඩ කිරීමක් නොවන ලෙස සලකනු ලැබිය යුතු ය.

(11) මෝටර් වාහනක් සඳහා වූ ආදායම් බලපත්‍රය, 15 වන වගන්තිය යටතේ බල රහිත වූ විට, ඒ මෝටර් වාහනයේ අයිතිකරු, එම මෝටර් වාහනය වෙනුවෙන් අලුත් ආදායම් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කර ඇති නම් සහ ඒ ඉල්ලුම් පත්‍රය අවසානාත්මකව තීරණය කර නොමැති නම් හෝ 13 වන වගන්තිය යටතේ පාවිච්චි නොකිරීමේ කාල සීමාවක් පිළිබඳව දැන්වීම මිනු දී ඇත්නම් හෝ ඔහු එම මෝටර් වාහනයෙහි සන්තකය දැරීම (1) වන උපවගන්තිය කඩ කිරීමක් නොවන ලෙස සලකනු ලැබිය යුතු ය.

(12) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලය හෝ යම් ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලයක් විසින් මෝටර් කෝච් රථයක්, කුලී මෝටර් රථයක් හෝ

ලොරියක් සන්තකයේ තබා ගැනීම හෝ පාවිච්චි කිරීම, එම මෝටර් කෝච් රථය හෝ කුලී මෝටර් රථය හෝ ලොරිය ගාස්තු හෝ ප්‍රතිලාභ සඳහා තැනැත්තන් හෝ බඩු ගෙන යාම පිණිස යම් මහා මාර්ගයක ධාවනය නොකරන තාක් කල් (1) වන උප වගන්තිය කඩ නොකිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(13) කිසියම් මෝටර් වාහනයක බලපත්‍ර අධිකාරිය වෙනත් පළාතක සිට බස්නාහිර පළාතට මාරු වන අවස්ථාවක දී එකී වාහනයෙහි ලියාපදිංචි සහතිකයෙහි අවශ්‍ය සංශෝධන ලියාපදිංචි කිරීමේ කටයුතු අවසන් කරන තෙක් ආදායම් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර අදාළ ගාස්තුගෙවා ඇත්නම් එවැනි වාහනයක් සන්තකයෙහි තබා ගැනීම හෝ ධාවනය කිරීම (1) වන උපවගන්තිය කඩ නොකිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ආදායම් බලපත්‍ර පන්ති හෝ විස්තර.

3. (1) මෝටර් වාහනයක් සඳහා මේ කොටස යටතේ නිකුත් කරනු ලබන ආදායම් බලපත්‍රයක්, පහත දැක්වෙන විස්තරවලින් එකක හෝ එම විස්තරවලින් එකක හෝ වැඩි ගණනක සංයෝජනයක් වන හෝ බලපත්‍රයක් විය යුතු අතර එම වාහනය අයත් වන මෝටර් වාහන පන්තිය හෝ විස්තර සැලකිල්ලට ගෙන එය නිකුත් කරනු ලැබිය යුතුය. ඒ විස්තර නම්, මෝටර් රථ බලපත්‍රයක්, පෞද්ගලික කෝච් රථ බලපත්‍රයක්, බස් රථ බලපත්‍රයක්, මෝටර් ට්‍රයිසිකල් බලපත්‍රයක්, ලොරි බලපත්‍රයක්, මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ බලපත්‍රයක්, මෝටර් සයිකල් බලපත්‍රයක්, මෝටර් අවමංගල රථ බලපත්‍රයක්, මෝටර් ගිලන් රථ බලපත්‍රයක්, ආබාධිතයන් සඳහා වූ රථ බලපත්‍රයක්, අත් ට්‍රැක්ටර් බලපත්‍රයක්, ද්විත්ව කාර්යය බලපත්‍රයක්, ඉඩම් වාහන බලපත්‍රයක් හෝ වෙනත් මෝටර් වාහන බලපත්‍රයක්.

(2) 18 වන වගන්තිය යටතේ වෙළෙන්දෙකුගේ බලපත්‍ර හෝ 20 වන වගන්තිය යටතේ ආගන්තුකයකුගේ තාවකාලික බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ කිසිවකින් බලපෑමක් හෝ සීමා කිරීමක් වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

ලියාපදිංචි කිරීමේ සහතිකය සහ රක්ෂණ හෝ ඇප සහතිකය ඉදිරිපත් කිරීම.

4. (1) යම් වාහනයක අදාළ ලියාපදිංචි කිරීමේ සහතිකය ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, සහ ඒ අධිකාරියේ නම ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස සහ බලපත්‍රය සඳහා ඉල්ලීමෙහි ඇතුළත් විස්තර සහතිකයෙහි ඇතුළත් අනුරූප විස්තරවලට සමාන වන්නේ නම් මිස බලපත්‍ර නිකුත් කරන යම් අධිකාරියක් විසින් ඒ මෝටර් වාහනය සඳහා කිසිම ආදායම් බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද, යම් මෝටර් වාහනයක් සඳහා ඉකුත් වර්ෂය වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින් ආදායම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබූවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා වෙත යම් වර්ෂයක් වෙනුවෙන් මෝටර් කෝච් රථයක්, මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් හෝ ලොරියක් නොවන යම් මෝටර් වාහනයක් වෙනුවෙන් ආදායම් බලපත්‍රයක් නිකුත් කරනු ලබන විට සුදුසු යයි බලපත්‍ර අධිකාරි කල්පනා කරන්නේ නම් ඔහු විසින් ලියාපදිංචි කිරීමේ සහතිකය ඉදිරිපත් කිරීම අත්හැරිය හැකි ය.

(2) මෝටර් වාහනයකට අදාළව II වන කොටසේ නියමයන්ට අනුකූල රක්ෂණ සහතිකයක් හෝ ඇප සහතිකයක් ඉල්ලුම්කරු විසින් බලපත්‍ර නිකුත් කරන අධිකාරිය වෙත නිකුත් කරනු ලැබුවහොත් මිස, ට්‍රේලර් රථයක් නොවන යම් මෝටර් වාහනයක් සඳහා බලපත්‍ර නිකුත් කරන අධිකාරිය විසින් කිසිම ආදායම් බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

මගී රථ සහ පෞද්ගලික කෝච් රථ සඳහා බලපත්‍ර එවැනි අවසර පත්‍ර දරන්නන්ට පමණක් නිකුත් කළ යුතු බව.

**5.** (1) නියමිත අධිකාරිය විසින් නිකුත් කරන ලද මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් දරන්නකුට හැර මගී බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(2) පෞද්ගලික කෝච් රථයක් වශයෙන් ලියාපදිංචි වී ඇති කෝච් රථයකට හෝ මගී ප්‍රවාහන අවසර පත්‍රයක් ලබාගෙන නොමැති කෝච් රථයකට මේ කොටස යටතේ පෞද්ගලික කෝච් රථ බලපත්‍රයක් නිකුත් කළ යුතු ය.

මෝටර් කෝච් රථ ආදිය සඳහා ආදායම් බලපත්‍ර පරීක්ෂණයක් සහ සහතික කිරීමක් නොමැතිව නිකුත් කරනු නොලැබිය යුතු බව.

**6.** මෝටර් කෝච් රථයක්, ලොරියක්, මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක්, මෝටර් අවමංගල රථයක් හෝ මෝටර් සිලින් රථයක් වෙනුවෙන්, 98 වන වගන්තිය යටතේ යෝග්‍යතා සහතිකයක් නිකුත් කරනු ලැබ, එය බලාත්මකව පවතින්නේ නම් සහ එය ඉදිරිපත් කරනු ලබන්නේ නම් මිස, ඒ සඳහා කිසිදු ආදායම් බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

ආදායම් බලපත්‍ර සඳහා ඉල්ලීම.

**7.** (1) පළාත තුළ මෝටර් වාහනයක් වෙනුවෙන් (වෙළෙන්දෙකුගේ බලපත්‍රයක් හෝ ආගන්තුකයෙකුගේ තාවකාලික බලපත්‍රයක් නොවන) ආදායම් බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම —

(අ) බලපත්‍රය අවශ්‍ය වන්නේ යම් කාල සීමාවක් සඳහා ද ඒ කාලසීමාව තුළ දී මෝටර් වාහනය සාමාන්‍යයෙන් තබා තිබෙන ස්ථානය විෂයයෙහි බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය ;

(ආ) නියමිත ආකෘතිවලින් කාරණාවට යෝග්‍ය වන ආකෘතියට සමානුකූල විය යුතු අතර, එම මෝටර් වාහනයට අදාළ වන්නා වූ ද, එම ආකෘතියෙහි නියමිත කරුණු පිළිබඳ වූ ද එම මෝටර් වාහනයට අදාළ සියලු විස්තර එහි දක්වා තිබිය යුතු ය ;

(ඇ) මෝටර් වාහනයෙහි ලියාපදිංචි අයිතිකරු විසින් හෝ ලියාපදිංචි අයිතිකරු විසින් බලය පවරන ලද පුද්ගලයකු අත්සන් කර තිබිය යුතු ය ;

(ඈ) 8 වන වගන්තියේ දක්වා ඇති බලපත්‍ර ගාස්තුව ද සමග ඉදිරිපත් කර තිබිය යුතු ය ;

(ඉ) මෝටර් වාහනයක් සඳහා බලපත්‍රයක් අවශ්‍ය වන්නේ යම් වර්ෂයක් සඳහා ද එකී වර්ෂය තුළ වාහනය මුල්වරට ලියාපදිංචි කර ඇත්තේ යම් මාසයක යම් දවසක ද එකී මාසයේ එකී දවසේ සිට ආරම්භ වන හෙයින් (මෙහි මින් මතු බලපත්‍ර ගාස්තු ගෙවීමට නියමිත දිනය වශයෙන් සඳහන් කරනු ලබන) එකී මාසයේ එකී දවසට පෙර ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ;

(ඊ) ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලබන්නේ යම් වර්ෂයක් සඳහා ද එකී වර්ෂයට පෙර වර්ෂය සඳහා නිකුත් කරන ලද ආදායම් බලපත්‍රය ද සමග එවා තිබිය යුතු ය :

එසේ වුවද —

(i) වාහනය පාවිච්චි නොකිරීමේ කාල සීමාවක් පිළිබඳ දැන්වීමක් 13 වන වගන්තිය යටතේ දී ඇති යම් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වූ විට, ඉල්ලුම් පත්‍රය එම කාල සීමාව අවසන් වීමට පෙර ඉදිරිපත් කළ යුතු ය ;

(ii) වාහන පාවිච්චි නොකිරීමේ කාලසීමාවක් පිළිබඳ දැන්වීමක් 13 වන වගන්තිය යටතේ දී ඇත්තා වූ ද, 13 (5) වගන්තියේ විධිවිධාන හේතුවෙන් ඒ දැන්වීම ක්‍රියාත්මකව තිබීම අවසන් වන්නා වූ ද මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වූ විට, ඉල්ලුම් පත්‍රය, එම දිනයෙහි සිට දින තුනක් ඇතුළත දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ;

(iii) ප්‍රථම වතාවට ශ්‍රී ලංකාවෙහි ලියාපදිංචි කරන ලද මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වූ විට, එම වාහනය ලියාපදිංචි කිරීමේ දින සිට වැඩ කරන දින තුනක් ඇතුළත දී ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ;

(iv) මෝටර් වාහනයේ සන්තකයෙහි වෙනස්වීමක් හේතු කොට ගෙන එම මෝටර් වාහනය සඳහා වූ ආදායම් බලපත්‍රය බලරහිත වී ඇති නිසා, අලුත් ආදායම් බලපත්‍රයක් ඉල්ලුම් කරනු ලැබ ඇති මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වන විට එම වාහනයේ සන්තකය වෙනස් වීමේ දින සිට දින තිහක් ඇතුළත ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ;

(v) මෝටර් වාහනයෙහි ආදායම් බලපත්‍රය 15 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ බලරහිත වීම නිසා අලුත් ආදායම් බලපත්‍රයක් ඉල්ලුම් කරනු ලැබ ඇති මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වූ විට, එකී වාහනය නව අංකය යටතේ ලියාපදිංචි කරන ලද දිනයෙන් පසු දින තුනක් ඇතුළත දී ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ; සහ

(vi) මෝටර් වාහනය සඳහා වූ ආදායම් බලපත්‍රය මගින් බලය දී නොමැති කාර්ය වෙනුවෙන් එම මෝටර් වාහනය පාවිච්චි කිරීම නිසා, අලුත් ආදායම් බලපත්‍රයක් ඉල්ලුම් කරනු ලැබ ඇති මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වූ විට එම මෝටර් වාහනය පාවිච්චි කිරීමට අදහස් කරන දිනට පෙර දින තිහක් ඇතුළත ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(1අ) 15 වන වගන්තියේ හේතුවෙන් අවශ්‍ය වන අලුත් ආදායම් බලපත්‍රයක් සඳහා යම් මෝටර් වාහනයක් වෙනුවෙන් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, අලුත් බලපත්‍රයක් අවශ්‍ය වන හේතු දක්වෙන ප්‍රකාශයක් ද, එම වගන්තිය යටතේ බල රහිත වූ බලපත්‍රය හෝ මෝටර් වාහන ලියාපදිංචි කරන අධිකාරිය විසින් එම බලපත්‍රය අවලංගු කරන ලද බවට සහතිකයක් හෝ ඒ ඉල්ලුම් පත්‍රයට යාකර තිබිය යුතු ය.

(2) මෝටර් වාහනයක් වෙනුවෙන් ආදායම් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රය අවස්ථාවෝචිත පරිදි, (1) වන උපවගන්තිය යටතේ නියමිත යම් දිනයකට පෙර හෝ යම් කාල සීමාවක් ඉකුත් වීමට පෙර හෝ ඉදිරිපත් කරනු ලැබිය යුතු වූ ද, ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමෙහිලා ප්‍රමාදයක් සිදුවන්නා වූ ද, අවස්ථාවක, ප්‍රමාදය යම් ප්‍රමාද දෝෂයක්, පාඩුවක් හැතහොත් අනතුරක් නිසා සිදු වූ බවට බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා සෑහීමකට පත් වන පරිදි ඔප්පු කරනු ලැබ ඒ උපවගන්තිය යටතේ විධිමත් ලෙස කරන ලද ඉල්ලුම් පත්‍රයක් මත, බලපත්‍රයක් නිකුත් කරන ලද නම් ඒ බලපත්‍රය සඳහා මේ කොටස යටතේ ගෙවනු ලැබිය යුතුව තිබුණු බලපත්‍ර ගාස්තුවෙහි මුළු මුදල් ප්‍රමාණය ගෙවනු ලැබූ විට බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින්, ඔහු අභිමතය පරිදි, ආදායම් බලපත්‍රයක්, එය නිකුත් කරනු ලබන දිනයෙහි සිට බලාත්මක වනු ලබන පරිදි ප්‍රකාරිතව නිකුත් කරනු ලැබිය හැකි ය ;

තවද, යම් මෝටර් වාහනයක් සඳහා මේ උපවගන්තිය යටතේ ආදායම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් අවස්ථාවක, ඒ ප්‍රමාදය වූ කාල සීමාව තුළ දී එම වාහනය සම්බන්ධයෙන් 2 (1) වන වගන්තිය පිළිබඳ යම් කඩ කිරීමක් පිළිබඳ යම්

තැනැත්තෙකුට විරුද්ධව නඩු පැවරීමක් නොකළ යුතු ය ; තව ද ඒ ගෙවීම කරන ලද දිනයට පෙර නඩුවක් පවරනු ලැබ ඇති අවස්ථාවක මහේස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තා නිදහස් කරනු ලැබිය යුතු ය.

බලපත්‍ර ගාස්තුව.

8. (1) යම් පංතියකට හෝ විස්තරයකට අයත් මෝටර් වාහනයක් සඳහා යම් වර්ෂයකට බලාත්මකවන (වෙළෙන්දකුගේ බලපත්‍රයක් නොවන) වාර්ෂික ආදායම් බලපත්‍රයක් වෙනුවෙන් බලපත්‍ර ගාස්තුව, ඒ පංතියට හෝ විස්තරයට අයත් වාහන සඳහා නියමිත අනුප්‍රමාණයන් අනුව නිර්ණය කරන ලද බලපත්‍ර ගාස්තුව විය යුතු ය.

(2) වෙළෙන්දකුගේ බලපත්‍රයක් නොවන මෝටර් වාහනයක් සඳහා වූ යම් ආදායම් බලපත්‍රයක් යම් වර්ෂයක බලපත්‍ර ගාස්තු ගෙවීමට නියමිත දිනයට පසුව සහ එකී දිනයේ සිට ඉදිරියට මාස දෙකක කාලයක් තුළ බලාත්මක වන අවස්ථාවක ඒ බලපත්‍රය සඳහා ගෙවිය යුතු ගාස්තුවේ මුදල (1) වන උපවගන්තිය යටතේ එම මෝටර් වාහනය සඳහා වාර්ෂික ආදායම් බලපත්‍රයක් වෙනුවෙන් ගෙවිය යුතු මුදලම විය යුතු ය.

(3) (අ) මෝටර් වාහනයක් වෙනුවෙන් යම් වර්ෂයක දී පාවිච්චි නොකිරීමේ කාලසීමාවක් පිළිබඳ දැන්වීම 13 වන වගන්තිය යටතේ දෙනු ලැබ ඇති ඒ මෝටර් වාහනය සඳහා ආදායම් බලපත්‍රය සඳහා ඉල්ලීම 7 (1) වගන්තියේ අතුරු වගන්තියේ ඒ (i) අනු ඡේදය හෝ (ii) අනු ඡේදය යටතේ කරනු ලැබ එම වර්ෂයේ බලපත්‍ර ගාස්තු ගෙවීමට නියමිත දිනය සහ බලපත්‍රය බලාත්මක වනුයේ යම් දිනයක සිට ද ඒ දිනය අතර මෝටර් වාහනය නීත්‍යනුකූල නොවන ලෙස පාවිච්චි කරනු නොලැබූ බවට බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා සෑහීමට පත් වන අවස්ථාවක ; හෝ

(ආ) 15 වන වගන්තිය හේතු කොටගෙන අවශ්‍ය වන්නා වූ ද, යම් වර්ෂයක බලපත්‍ර ගාස්තු ගෙවීමට නියමිත දිනයට පසු බලාත්මක වන්නා වූ ද අලුත් ආදායම් බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක ;

එම බලපත්‍රය සඳහා ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුව, (2) වන උපවගන්තියේ අන්‍යාකාරයකින් විධිවිධාන සලසනු ලැබ ඇති පරිදි හැර, එම වර්ෂයේ බලපත්‍ර ගාස්තු ගෙවීමට නියමිත දිනයෙන් ආරම්භව, බලපත්‍රය බලාත්මක වන්නේ යම් මාසයක දී ද ඒ මාසයට ඉක්බිතිව වූ මාසයේ අවසාන දිනයෙන් අවසන් වන්නා වූ කාලසීමාවේ එක් එක් සම්පූර්ණ ලිත් මාසය සඳහා දොළහෙන් එක් පංගුවක් (1) වන උපවගන්තිය යටතේ වාර්ෂික බලපත්‍රයක් මත ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුවෙන් අඩු කළ විට ලැබෙන මුදල් ප්‍රමාණය විය යුතු ය ;

(ඇ) 1992 ජනවාරි මස 1 වන දින සහ මෝටර් වාහනයක බලපත්‍ර ගාස්තු ගෙවීමට නියමිත දිනයට අයත් මාසයේ අවසාන දිනය දක්වා අතර කාලය වෙනුවෙන් එක් එක් සම්පූර්ණ ලිත් මාසය සඳහා (1) වන උපවගන්තිය යටතේ සඳහන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවෙන් දොළහෙන් එක් පංගුව බැගින් ගාස්තුවක් ගෙවිය යුතු ය. මෙකී අන්තර් කාලය මාස හතරකට වැඩි වන අවස්ථාවක 1992 ජනවාරි මස 1 වන දින සිට මාස දොළහකට නොඅඩු කාලයක් සඳහා බලපත්‍ර ගාස්තු ගෙවිය හැකි ය.

(4) ශ්‍රී ලංකා ආණ්ඩුවට අයත් වන්නා වූ හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවේ සේවය සඳහාම පමණක් පාවිච්චි කරනු ලබන හෝ තත් කාර්යය සඳහා අන්‍යොන්‍ය වැඩ පිළිවෙළක් ඇතිකර ගැනීමෙන් පසු අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක කලින් කල නියමිතව සඳහන් කරනු ලැබිය හැකි යම් විදේශීය රාජ්‍යයක ආණ්ඩුවකට අයත් වන්නා වූ හෝ එසේ නියමිතව සඳහන් කරනු ලබන යම් විදේශීය

රාජ්‍යයක ආණ්ඩුවකට අයත් වන්නා වූ හෝ එසේ නියෝජිතව සඳහන් කරනු ලබන යම් විදේශීය රාජ්‍යයක ආණ්ඩුවක (කවර වූ හෝ නාමයකින්, අභිධානයකින් හෝ පදවි නාමයකින් හඳුන්වනු ලබන) ශ්‍රී ලංකාවේ සිටින නියෝජිතයාට හෝ එවැනි යම් ආණ්ඩුවක ශ්‍රී ලංකාවේ සිටින නියෝජිතයාට හෝ එවැනි යම් ආණ්ඩුවක ශ්‍රී ලංකාවේ සිටින වෙළෙඳ කොමසාරිස්වරයාට හෝ කොන්සල් නිලධාරියාට හෝ එවැනි යම් නියෝජිතයකුගේ හෝ කොමසාරිස්වරයකුගේ හෝ කොන්සල් නිලධරයකුගේ කාර්ය මණ්ඩලයේ තැනැත්තකට අයත් වන්නා වූ මෝටර් වාහනයක් සඳහා වූ ආදායම් බලපත්‍රයක් වෙනුවෙන් කිසිදු බලපත්‍ර ගාස්තුවක් ගෙවනු නොලැබිය යුතු ය.

(5) මෝටර් වාහනයක ආදායම් බලපත්‍රය සඳහා බලපත්‍ර ගාස්තුව බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා වෙත ගෙවනු ලැබ, එම බලපත්‍රය නිකුත් කරනු ලැබීමට පෙර එම මෝටර් වාහනයේ සන්නකය සම්බන්ධයෙන් වෙනසක් සිදු වන අවස්ථාවක, එම මෝටර් වාහනයේ අලුත් ලියාපදිංචි අයිතිකරු එම ගාස්තුව ගෙවීම සම්බන්ධයෙන් තුට්ටාන්තියක් ඉදිරිපත් කරන්නේ නම් ද බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින් පසතියකින් නිකුත් කරනු ලැබ නැති නම් ද එම ලියාපදිංචි අයිතිකරු විසින් කිසිදු බලපත්‍ර ගාස්තුවක් ගෙවනු නොලැබිය යුතු ය.

(6) යම් තැනැත්තකුට නිකුත් කරනු ලැබූ ආදායම් බලපත්‍රය සඳහා බලපත්‍ර ගාස්තුව වශයෙන් ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණය එම බලපත්‍රය සඳහා ගෙවිය යුතු සම්පූර්ණ මුදල් ප්‍රමාණයට අඩු වන අවස්ථාවක, බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, එහි නියමිතව සඳහන් මුදල එනම් එම ආදායම් බලපත්‍රය සඳහා ගෙවිය යුතු සම්පූර්ණ ගාස්තුව සහ එම බලපත්‍රය සඳහා සැබැවින්ම ගෙවනු ලැබූ ගාස්තුව අතර වෙනසට සමාන වන මුදල් ප්‍රමාණයක්, එහි නියමිතව සඳහන් දිනයෙහි හෝ ඊට පෙර ගෙවන මෙන් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

(7) (6) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට දෙන ලද දැන්වීමක නියමයක් අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තා පැහැර හැරියහොත් ඒ තැනැත්තා වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූවිට රුපියල් දෙසිය පනහක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය. තවද අධිකරණය විසින් නියම කරනු ලබන එවැනි යම් දඩයකට අතිරේකව එම දැන්වීමෙහි සඳහන් කරන ලද මුදල් ගෙවීමට අධිකරණය විසින් එම තැනැත්තාට ආඥා කළ හැකි අතර, ඒ අධිකරණයෙන් නියම කරන ලද දඩයක ආකාරයෙන්ම ඒ මුදල අය කර ගත හැකි ය.

9. මෝටර් වාහනයක් සඳහා (වෙළෙන්දකුගේ බලපත්‍රයක් හෝ ආයත්තකයකුගේ තාවකාලික බලපත්‍රයක් නොවන) සෑම ආදායම් බලපත්‍රයක්ම, විෂයයට උචිත වන පරිදි නියමිත ආකෘතිවලින් එක් ආකෘතියක් අනුව බලපත්‍ර නිකුත් කරන බලධරයා විසින් නිකුත් කළ යුතු අතර, එය බලාත්මක විය යුතු බවට ප්‍රකාශිත දින සිට බලාත්මක විය යුතු ය. තවද මේ කොටසේ අනාකාරයකින් ප්‍රකාශිත ලෙසම සලසන ලද විධිවිධාන හැරුණු විට, ඒ දිනයට පසුව එළඹෙන ඊළඟ වර්ෂයේ බලපත්‍ර ගාස්තු ගෙවීමට නියමිත දින තෙක් එය නොකඩවා බලාත්මක විය යුතු ය.

ආදායම් බලපත්‍රවල ආකෘති සහ ඒවා බලපවත්නා කාලය.

10. මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් සඳහා යම් බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයකු විසින් නිකුත් කරනු ලබන යම් ආදායම් බලපත්‍රයක, අවස්ථාවෝචිත පරිදි, ඒ කෝච් රථය, ලොරිය හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය පරීක්ෂකවරයකු හෝ වෙනත් තැනැත්තකු විසින්, මේ ප්‍රඥප්තිය යටතේ පරීක්ෂා කරනු ලැබීමෙන් පසුව, ආරක්ෂාව උදෙසා අවශ්‍ය බවට සහතික කරනු ලබන කොන්දේසි එම බලධරයා විසින් ඇතුළත් කරනු ලැබිය හැකි ය.

ආදායම් බලපත්‍රයෙහි කොන්දේසි ඇතුළත් කිරීමට ඇති බලය.

පෞද්ගලික කෝච් රථ, කුලී මෝටර් රථ ආදිය සඳහා වූ ආදායම් බලපත්‍රවල නැතැත්තන් සහ මගීන් පිළිබඳ උපරිම සංඛ්‍යාව සඳහන් කරනු ලැබිය යුතු බව.

11. (1) බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින් නිකුත් කරනු ලබන —

(අ) පෞද්ගලික කෝච් රථයක් සඳහා වූ සෑම ආදායම් බලපත්‍රයකම එම කෝච් රථයේ ගෙන යාමට බලය දෙනු ලැබූ නැතැත්තන්ගේ උපරිම සංඛ්‍යාව ; සහ

(ආ) බස් රථයක් සඳහා වූ සෑම ආදායම් බලපත්‍රයකම එම බස් රථයේ ගෙන යාමට බලය දෙනු ලැබූ මගීන්ගේ උපරිම සංඛ්‍යාව ,

නියමිතව සඳහන් කළ යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි, පෞද්ගලික කෝච් රථයක හෝ බස්රථයක ගෙන යා හැකි නැතැත්තන්ගේ හෝ මගීන්ගේ උපරිම සංඛ්‍යාව නිර්ණය කිරීමේ කාර්ය සඳහා —

(අ) අවස්ථාවෝචිත පරිදි, එක් එක් නැතැත්තකු හෝ මගියකු සඳහා මිලි මීටර් තුන්සිය අසූ දෙකක ආසන ඉඩකඩ දිය යුතු ය ; තව ද

(ආ) කෝච් රථයේ හෝ බස් රථයේ ආරක්ෂා සහිත බර කොටෙහි නිසි සැලැස්ම දක්වනු ලැබිය යුතු අතර එය කොමසාරිස්වරයා විසින් විධාන කරනු ලබන ආකාරයකින් ගණන් බලනු ලැබිය යුතු ය. එම ගණන් බැලීමේදී, අවස්ථාවෝචිත පරිදි, එක් එක් නැතැත්තකුගේ හෝ මගියකුගේ බර කිලෝග්‍රෑම් පණහක් ලෙස ගණන් බලනු ලැබිය යුතු ය.

එසේ වුවද මගීන් සිටගෙන සිටිය දී ගෙන යාම සඳහා ප්‍රධාන වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන්ම නිර්මාණය කරනු ලැබූ හෝ යොදනු ලැබූ බස් රථයක් නොවන්නා වූ ද —

(අ) නියම කරනු ලැබිය හැකි විධිවිධාන අනුව නිර්මාණය කරනු ලැබූ සහ උපකරණවලින් සම්පූර්ණ වී ඇති සහ මධ්‍ය මාර්ගයක් සලසනු ලැබූ ; සහ

(ආ) නගර බස්රථ සේවයක් සඳහා බස් රථ ධාවන අවසර පත්‍රයක අධිකාරිය යටතේ භාවිච්චි කරනු ලැබීමට ඇති බස් රථයක් සම්බන්ධයෙන් වන විට,

මේ උප වගන්තියේ ඉහතින් වූ විධිවිධාන වෙනුවට, කොමසාරිස්වරයා විසින් නිර්ණය කරනු ලැබිය හැකි කාල සීමාව සඳහා පහත දක්වෙන විධි විධාන අදාළ විය යුතු ය :—

(i) එක් එක් මගියකු සඳහා මිලි මීටර් තුන්සිය අසූ දෙකක ආසන ඉඩ කඩ දිය යුතු ය ;

(ii) බස් රථයට මිලි මීටර් හාර දහසකට අඩු නොවන්නා වූ ද මිලි මීටර් හාරදහස් හය සියයකට වැඩි නොවන්නා වූ ද රෝද පරතරයක් ඇති අවස්ථාවක (i) ඡේදය යටතේ එම බස් රථය සඳහා නිර්ණය කරනු ලබන මගීන් සංඛ්‍යාව අටකින් වැඩි කරනු ලැබිය යුතු ය ;

(iii) බස් රථයට මිලි මීටර් හාර දහසකට අඩු රෝද පරතරයක් ඇති අවස්ථාවක (i) ඡේදය යටතේ එම බස් රථය සඳහා නිර්ණය කරනු ලබන මගීන් සංඛ්‍යාව පහෙන් එක් පංගුවකින් වැඩි කරනු ලැබිය යුතු ය ;

(iv) බස් රථයට මිලි මීටර් හාර දහස් හය සියයකට වැඩි රෝද පරතරයක් ඇති අවස්ථාවක (i) ඡේදය යටතේ එම බස් රථය සඳහා නිර්ණය කරනු ලබන මගීන් සංඛ්‍යාව දොළහකට වැඩි නොවන්නා වූ සංඛ්‍යාවකින් වැඩි කරනු ලැබිය යුතු ය.

එසේම තවදුරටත් —

(අ) මගීන් සිටගෙන ගෙන යාමට ප්‍රධාන වශයෙන් ම හෝ සම්පූර්ණ වශයෙන් ම නිර්මාණය කරනු ලැබූ හෝ යොදා ගනු ලැබූ ; සහ

(ආ) කොමසාරිස්වරයා විසින් ඒ සඳහා නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක සඳහන් කරනු ලැබිය හැකි මාර්ගයක හෝ මාර්ගවල පාවිච්චි කරනු ලබන

බස් රථයක් සම්බන්ධයෙන් මේ උපවගන්තියේ ඉහතින් වූ විධි විධාන වෙනුවට පහත දැක්වෙන විධි විධාන අදාළ විය යුතු ය.

(i) ආසන සලසා ඇති අවස්ථාවක එක් එක් මගියකු සඳහා මිලි මීටර් තුන්සිය අසූ දෙකක ආසන ඉඩකඩ සැලසිය යුතු ය.

(ii) සිටගෙන සිටින්නා වූ එක් එක් මගියකු සඳහා වර්ග මීටරයකින් සියයෙන් දහසයෙන් පංගුවක සිට ගෙන සිටීමේ ඉඩ කඩ සැලසිය යුතු ය.

(iii) සිටගෙන සිටින්නා වූ එක් එක් මගියකු සඳහා බස් රථයෙහි එල්ලෙන පටියක් හෝ කවර වූ හෝ වර්ගයක ආධාරකයක් සැලසිය යුතු ය.

මගීන් සඳහා සිටගෙන සිටීමේ ඉඩකඩ ගණන් ගැනීමේ දී බස් රථයෙහි ආසන සලසා ඇත්තේ නම්, එක් එක් ආසන පේළිය ඉදිරියේ වූ මිලි මීටර් එකසිය විසි අටක ඉඩකඩ සහ බස් රථයට ඇතුළුවීමට සහ බස් රථයෙන් පිටවීමට වෙන් කරන ලද ඉඩකඩ කිසිම හේතුවක් නිසා ගණන් ගනු නොලැබිය යුතු ය.

ලොරි සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ සඳහා ආදායම් බලපත්‍ර මත උපරිම බර ප්‍රමාණය සඳහන් කළ යුතු බව.

**12.** බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් සඳහා එම බලධරයා විසින් නිකුත් කරනු ලබන සෑම ආදායම් බලපත්‍රයකම ඒ ලොරියේ හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයේ ගෙන යනු ලැබිය හැකි උපරිම බර (එනම් නියමිත බර) සඳහන් කරනු ලැබිය යුතු ය. උපරිම බර නිර්ණය කිරීමේ කාර්යය සඳහා ලොරියෙහි හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයෙහි ගෙන යාමට අවසර දෙනු ලැබූ එක් එක් තැනැත්තාගේ බර කිලෝ ග්‍රෑම් පනහක් සහ දහයෙන් අටක් ලෙස සලකනු ලැබිය යුතු ය.

පාවිච්චි නොකිරීමේ කාලසීමාව සම්බන්ධයෙන් දැන්වීම.

**13.** (1) (අ) මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු හෝ මෝටර් වාහනයක් සන්තකයෙහි ඇති යම් තැනැත්තකු විසින් යම් වර්ෂයක බලපත්‍ර ගාස්තු ගෙවීමට නියමිත දින හෝ ඊට පෙර, දැන්වීමෙහි සඳහන් කරනු ලබන බලපත්‍ර ගාස්තු ගෙවීමට නියමිත දිනෙන් ආරම්භ වන, මාස තුනකට අඩු නොවන, කාල සීමාවක් සඳහා මෝටර් වාහනය පාවිච්චි කිරීමට තමා අදහස් නොකරන බවට බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා වෙත ලිඛිත දැන්වීමක් දෙනු ලැබිය හැකි ය :

එසේ වුව ද, බලපත්‍ර ගාස්තු ගෙවීමට නියමිත දිනට පසු දින හතක් ඇතුළත එවැනි යම් ලිඛිත දැන්වීමක් දෙනු ලබන අවස්ථාවක, ඒ දැන්වීම දීමේ දී සිදු වූ ප්‍රමාදය, යම් ප්‍රමාද දෝෂයක්, අනතුරක් හෝ අසනීපයක් නිසා සිදු වූ බවට බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා සෑහීමට පත් වුවහොත්, බලපත්‍ර ගාස්තු ගෙවීමට නියමිත දිනට පෙර විධිමත් ලෙස දෙන ලද දැන්වීමක් වශයෙන්, තම අභිමතය පරිදි බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින් ඒ දැන්වීම භාර ගනු ලැබිය හැකි ය.

(ආ) මෝටර් වාහනයක් යම් වර්ෂයක් තුළ දී යම් තැනැත්තකුගේ සන්තකයට පත් වන අවස්ථාවක, මෝටර් වාහනය සන්තකයට පත්වීමේ දිනයට පසු දින හතක් ඇතුළත, දැන්වීමෙහි සඳහන් කරනු ලබන එම දිනයෙන් ආරම්භ වන ඒ කාල සීමාව සඳහා මෝටර් වාහනය පාවිච්චි කිරීමට තමා අදහස් කරනු නොලබන බවට ඔහු විසින් ලිඛිත දැන්වීමක් දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දෙන ලද පාච්චි නොකිරීමේ කාලසීමාවක් පිළිබඳ දැන්වීමක් කරනු ලැබුවේ යම් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් ද ඒ මෝටර් වාහනයේ ලියාපදිංචි අයිතිකරු විසින් එම කාලසීමාව අවසන් වීමට පෙර දෙන ලද ලිඛිත දැන්වීමක් මගින් කාලසීමාව තවදුරටත් දීර්ඝ කරනු ලැබිය හැකි ය.

එසේ වුව ද, පාච්චි නොකිරීමේ කාලසීමාවක් දීර්ඝ කිරීමේ අදහසින් එම කාලසීමාව අවසන් වීමේ දිනයට පසු දින හතක් ඇතුළත යම් ලිඛිත දැන්වීමක් දෙනු ලබන අවස්ථාවක, ඒ දැන්වීම දීමේ දී සිදු වූ ප්‍රමාදය යම් ප්‍රමාද දෝෂයක්, අනතුරක් හෝ අසනීපයක් නිසා සිදු වූ බවට බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා පැහැදීමට පත් වුවහොත්, ඒ දැන්වීම එම කාල සීමාව අවසන් වීමට පෙර විධිමත් ලෙස දෙන ලද දැන්වීමක් ලෙස, තම අභිමතය පරිදි, භාර ගත හැකි ය. තව ද පාච්චි නොකිරීමේ කාල සීමාව ඒ අනුව දීර්ඝ කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වූ සෑම දැන්වීමක් ම, නියමිත ගාස්තුව සමඟ එවනු ලැබිය යුතු අතර, බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා වෙත ලියාපදිංචි තැපෑලෙන් එවනු ලැබිය යුතු ය. නැතහොත් පෞද්ගලිකව ඔහු වෙත භාර දෙනු ලැබිය යුතු ය. තව ද දැන්වීමක් පෞද්ගලිකව භාර දෙනු ලබන සෑම අවස්ථාවක දී ම, එය ලැබුණු බවට ලිඛිත තුවිතාන්සියක් බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වූ දැන්වීමක සඳහන් පාච්චි නොකිරීමේ කාලසීමාව ඒ දැන්වීම දෙනු ලැබුවේ යම් කාල සීමාවක් සඳහා ද ඉදිරි වර්ෂයේ බලපත්‍ර ගාස්තු ගෙවීමට නියමිත දිනෙන් ඔබ්බට දීර්ඝ නොකළ යුතු ය.

(5) මේ වගන්තිය යටතේ පාච්චි නොකිරීමේ කාලසීමාවක් සම්බන්ධයෙන් දැන්වීම දෙනු ලැබ ඇත්තේ යම් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් ද, ඒ මෝටර් වාහනයේ නව අයිතිකරු හෝ තාවකාලික අයිතිකරු වශයෙන් යම් තැනැත්තකු (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ I වන කොටස යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ නව අයිතිකරු හෝ තාවකාලික අයිතිකරු ලියාපදිංචි වීමේ දින සිට එම දැන්වීම ක්‍රියාත්මකවීම අවසන් විය යුතු ය.

(5අ) (1) වන උපවගන්තිය යටතේ දෙන ලද යම් දැන්වීමක පාච්චි නොකිරීමේ කාලසීමාව තැනැත්තකු විසින් සඳහන් කරනු ලැබ නැති, එසේත් එම දැන්වීම දුන් දිනයට පසුව දින දහහතරක් ඇතුළත, එම කාලසීමාව ලියවිල්ලකින් සඳහන් කරනු ලබන අවස්ථාවක ඔහු විසින් එම දැන්වීමෙහි එම කාලසීමාව සඳහන් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) මේ කොටසේ කාර්ය සඳහා "පාච්චි නොකිරීමේ කාලසීමාව" යන්නෙන් (1) වන උපවගන්තිය යටතේ දෙන ලද දැන්වීමේ සඳහන් යම් කාල සීමාවක් අදහස් වන අතර (2) වන උපවගන්තිය යටතේ එවැනි යම් කාල සීමාවක් දීර්ඝ කර ඇත්නා වූ හෝ දීර්ඝ කර ඇතැයි සලකනු ලබන්නා වූ අවස්ථාවක, එසේ දීර්ඝ කර ඇත්නා වූ හෝ දීර්ඝ කර ඇතැයි සලකනු ලබන්නා වූ කාලසීමාව ඇතුළත් වන්නේ ය.

මෝටර් වාහන බල ආදායම් බලපත්‍ර ගෙන යා යුතු අතර නිකුත් කරනු ලැබූ විට ඉදිරිපත් කළ යුතු බව.

14. යම් මෝටර් වාහනයක් සඳහා නිකුත් කරනු ලැබූ ආදායම් බලපත්‍රය—

(අ) එහි මුල් පිටපතේ ස්වරූපය වෙනස් නොවන අන්දමේ සත්‍ය පිටපතක් මෝටර් වාහනයේ ඉදිරිපස ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු අතර, මෝටර් වාහනයේ වම් හෝ ආසන්න පැත්තෙහි ඉදිරිපස සිට ගෙන සිටින තැනැත්තකුට බලපත්‍රයේ හෝ පිටපතේ ඉදිරිපස සහ ඒ මත වූ ලියවිලි සියලු වේලාවන්හි දී පැහැදිලිව පෙනෙන පිණිස මෝටර් වාහනයේ වම් හෝ ආසන්න පැත්තෙහි ප්‍රකට තත්ත්වයකින් තබනු ලැබිය යුතු ය ; තව ද

(ආ) පොලිස් නිලධරයකු ග්‍රාම නිලධාරියකු හෝ පරීක්ෂකවරයකු හෝ කොමසාරිස්වරයා නැතහොත් බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු හෝ විසින් ඉල්លූ විට පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැකි විය යුතු ය .

එසේ වුවද අධිකරණයක් විසින් හෝ කොමසාරිස්වරයා විසින් හෝ පිටපත් කිරීම සඳහා හෝ සහික ගැනීම සඳහා ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට, ආදායම් බලපත්‍රය වාහනයෙන් ඉවත් කොට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**15.** (1) යම් මෝටර් වාහනයක් සඳහා ආදායම් බලපත්‍රය— *ආදායම් බලපත්‍ර බල රහිත වන අවස්ථා.*

(අ) ඒ ආදායම් බලපත්‍රය පළමු සඳහන් ආදායම් බලපත්‍රයෙන් වෙනස් පංතියක හෝ විස්තරයක ; හෝ

(ආ) පළමුව සඳහන් ආදායම් බලපත්‍රය සඳහා වූ ගාස්තුවට වෙනස් බලපත්‍ර ගාස්තුවක් ඇති

ආදායම් බලපත්‍රයක් අවශ්‍ය වන්නා වූ මෝටර් වාහනයකට පරිවර්තනය කිරීමෙන් එම මෝටර් වාහනය යම් සේ වෙනස් කරනු ලැබුවේ නම් ඒ මෝටර් වාහනය සඳහා ඒ ආදායම් බලපත්‍රය බල රහිත විය යුතු ය.

(2) පළමුව සඳහන් කරන ලද ආදායම් බලපත්‍රයෙන් බලය දෙනු නොලැබූ කාර්යයක් සඳහා යම් මෝටර් වාහනයක් පාවිච්චි කිරීමට බලය දෙනු පිණිස ඒ මෝටර් වාහනය සඳහා නිකුත් කරන ලද අලුත් ආදායම් බලපත්‍රයක් බලාත්මක වන දිනයෙහි ඒ මෝටර් වාහනය සඳහා වූ ආදායම් බලපත්‍රය බලරහිත විය යුතු ය.

(3) 8 වන වගන්තියේ (4) වන උපවගන්තිය අදාළ වන්නේ යම් ආදායම් බලපත්‍රයක් සම්බන්ධයෙන්ද ඒ ආදායම් බලපත්‍රය නිකුත් කරනු ලැබූ මෝටර් වාහනයේ සන්තකයේ වෙනසක් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එය බලරහිත විය යුතු අතර, එම ආදායම් බලපත්‍රයට එකී උපවගන්තිය අදාළ වීම අවසන් වන්නේ ය.

(4) (අ) (1) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය හෝ යටතේ බලරහිත වන ආදායම් බලපත්‍රයක් ප්‍රතිස්ථාපනය කිරීම පිණිස ; හෝ

(ආ) අලුත් ආදායම් බලපත්‍රයෙන් ප්‍රතිස්ථාපනය කරනු ලැබූ ආදායම් බලපත්‍රයෙන් බලය දෙනු නොලැබූ කාර්යයක් සඳහා යම් මෝටර් වාහනයක් පාවිච්චි කිරීම, (2) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි බලය දෙනු පිණිස

අලුත් ආදායම් බලපත්‍රයක් මේ වගන්තිය නිසා අවශ්‍ය වන අලුත් ආදායම් බලපත්‍රයක් වශයෙන් මේ ප්‍රඥප්තියේ සඳහන් කරනු ලැබේ.

**16.** (1) ආදායම් බලපත්‍රයක් දරන්නා විසින් ඒ ආදායම් බලපත්‍රය නිකුත් කළ බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා වෙත එය අවලංගු කිරීම සඳහා ආපසු භාරදිය හැකි ය. *ආදායම් බලපත්‍ර ආපසු භාරදීම, අවලංගු කිරීම සහ වෙනස් කිරීම.*

(2) මෝටර් වාහනයක් සඳහා ආදායම් බලපත්‍රය බලාත්මකව තිබෙන අතරතුර එම මෝටර් වාහනයේ ලියාපදිංචිය (203 වන අධිකාරය) වූ මෝටර් වාහන පනතේ 18 වන වගන්තිය යටතේ අවලංගු කරනු ලබන අවස්ථාවක, එම ආදායම් බලපත්‍රය දරන්නා විසින් ඒ බලපත්‍රය නිකුත් කළ බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා වෙත එය අවලංගු කිරීම සඳහා ආපසු භාර දිය හැකි ය.

(3) ආදායම් බලපත්‍රයක් —

(අ) 15 වන වගන්තිය යටතේ බලරහිත වූ ; හෝ

(ආ) මේ වගන්තියේ (2) වන උපවගන්තිය අදාළ වන ආදායම් බලපත්‍රයක් වන අවස්ථාවක එම ආදායම් බලපත්‍රය නිකුත් කළ බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින්, ඒ ආදායම් බලපත්‍රය අවලංගු කිරීම සඳහා තමා වෙත ආපසු භාර දෙන මෙන් එම ආදායම් බලපත්‍රය දරන්නාට ලියවිල්ලකින් නියම කරනු ලැබිය හැකි ය.

(4) ආදායම් බලපත්‍රයක යම් වෙනසක් කිරීමට අවශ්‍ය වන අවස්ථාවක, එම ආදායම් බලපත්‍රය නිකුත් කළ බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින් එම වෙනස් කිරීමේ කාර්යය සඳහා ඒ බලපත්‍රය තමා වෙත ආපසු භාර දෙන මෙන් එම ආදායම් බලපත්‍රය දරන්නාට ලියවිල්ලකින් නියම කරනු ලැබිය හැකි ය.

(5) (3) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය හෝ යටතේ නියමයක් කරනු ලැබූවේ යම් ආදායම් බලපත්‍රයක් දරන්නකු සම්බන්ධයෙන් ද ඒ ආදායම් බලපත්‍රය දරන්නා විසින්, එම නියමය ඔහු වෙත දන්වනු ලැබීමෙන් පසු දින දාහතරක් ඇතුළත ඊට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(6) ආදායම් බලපත්‍රයක් —

(අ) මේ වගන්තිය යටතේ ආපසු භාර දෙනු ලබන ; හෝ

(ආ) 15 වන වගන්තිය නිසා අවශ්‍ය වන්නා වූ අලුත් බලපත්‍රයකින් ප්‍රතිස්ථාපනය කරනු ලබන

අවස්ථාවක, ආදායම් බලපත්‍ර ආපසු භාර දෙනු ලබන්නේ යම් බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින් හෝ ප්‍රතිස්ථාපනය කරන ලද ආදායම් බලපත්‍රය වෙනුවට අලුත් ආදායම් බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ යම් බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයකු විසින් ද ඒ බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින් හෝ ආපසු භාර දෙනු ලබන හෝ ප්‍රතිස්ථාපනය කරනු ලබන ආදායම් බලපත්‍රය මත තම අත්සන යටතේ සටහන් කිරීමෙන් එය අවලංගු කරනු ලැබිය යුතු ය.

බලපත්‍ර ගාස්තුව ආපසු ගෙවීම

17. (1) 15 (1) වන වගන්තිය නිසා අවශ්‍ය වන අලුත් ආදායම් බලපත්‍රයක් යම් මෝටර් වාහනයක් සඳහා නිකුත් කරනු ලබන අවස්ථාවක, අලුත් ආදායම් බලපත්‍රයෙන් ප්‍රතිස්ථාපනය කරනු ලැබූ ආදායම් බලපත්‍රය නිකුත් කරනු ලැබූවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට ප්‍රතිස්ථාපනය කරනු ලැබූ ආදායම් බලපත්‍රය බලරහිත දින සිට ඊළඟට එළඹෙන බලපත්‍ර ගාස්තුව ගෙවීමට නියමිත දිනයෙන් අවසන් වන්නා වූ කාල සීමාවේ එක් එක් සම්පූර්ණ මාසය වෙනුවෙන් ප්‍රතිස්ථාපනය කරනු ලැබූ ආදායම් බලපත්‍රය සඳහා එම තැනැත්තා විසින් ගෙවන ලද බලපත්‍ර ගාස්තුවෙන් දොළහෙන් එක් කොටසකින් රුපියල් පනහක මුදලක් අඩු කරනු ලැබීමට යටත්ව, ප්‍රතිස්ථාපනය කරනු ලැබූ ආදායම් බලපත්‍ර නිකුත් කරනු ලැබූ නිකුත් කිරීමේ බලධරයාගෙන් ආපසු ගෙවීමක් ලැබීමට හිමිකම් තිබිය යුතුය. [illegible] මාසයක් ලෙස ගණනය කළ යුතු ය.

(2) 15 වන වගන්තිය නිසා අවශ්‍ය වන අලුත් ආදායම් බලපත්‍රයකින් ප්‍රතිස්ථාපනය කරනු ලැබූ ආදායම් බලපත්‍රයක් නොවන, මෝටර් වාහනයක් සඳහා ආදායම් බලපත්‍රයක් දරන්නකු විසින්, ඒ බලපත්‍ර අවලංගු කිරීම සඳහා එය නිකුත් කළ බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා වෙත ආපසු භාර දෙනු ලබන අවස්ථාවක, ඒ බලපත්‍රය ආපසු භාර දෙනු ලැබූ දිනෙන් ආරම්භ වී ඊළඟට එළඹෙන බලපත්‍ර ගාස්තු ගෙවීමට නියමිත දිනයෙන් අවසන් වන්නා වූ කාල සීමාවේ එක් එක් සම්පූර්ණ මාසය වෙනුවෙන් ආපසු භාර දෙනු ලැබූ ආදායම් බලපත්‍රය සඳහා එම තැනැත්තා විසින්

ගෙවන ලද බලපත්‍ර ගාස්තුවෙන් දොළහෙන් එක් කොටසකින් රුපියල් පහක මුදලක් අඩු කරනු ලැබීමට යටත්ව, එම බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයාගෙන් ආපසු ගෙවීමක් ලැබීමට ඔහුට හිමිකම් තිබිය යුතුය. සෑම දින තිහක් හෝ එයින් කොටසක් මාසයක් ලෙස ගණනය කළ යුතු ය.

(3) මෝටර් වාහනයක ආදායම් බලපත්‍රයක් සඳහා බලපත්‍ර ගාස්තුව බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයකුට ගෙවන ලද යම් තැනැත්තකු විසින්, එවැනි බලපත්‍රයක් ලබා ගැනීමට මේ ප්‍රඥප්තිය යටතේ ඒ තැනැත්තාට නියම කරනු නොලබන බවට ආදායම් බලපත්‍රය නිකුත් කිරීමට පෙර යම් අවස්ථාවක, බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා සෑහීමට පත් කරවන්නේ නම්, එම බලපත්‍රය නිකුත් කිරීමේ බලධරයාගෙන් එම ගාස්තුව ආපසු ලබා ගැනීමට ඔහුට හිමිකම් තිබිය යුතු ය.

(4) ආදායම් බලපත්‍රය සඳහා ඉල්ලුම්කරුවකු විසින් එම බලපත්‍ර සඳහා බලපත්‍ර ගාස්තුව වශයෙන් එම ගාස්තුවට වැඩියෙන් යම් මුදලක් ආදායම් මුද්දරවලින්, මුදලින් හෝ අන්‍යාකාරයකින් බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයාට ගෙවනු ලබන අවස්ථාවක, ඒ අතිරික්තය එම බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයාගෙන් ආපසු ලබා ගැනීමට ඔහුට හිමිකම් තිබිය යුතු ය.

වෙළෙන්දකුගේ බලපත්‍රය.

18. (1) (අ) (203 වන අධිකාරය) වූ මෝටර් වාහන පනතේ 42 (1) අනුව පළාත තුළ ලියාපදිංචි කරන ලද යම් ගරාජයක් හෝ ව්‍යාපාර ස්ථානයක් පිහිටියේ යම් ප්‍රදේශයක ද ඒ ප්‍රදේශයේ බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා වෙත, නියමිත ආකෘතියෙහි වූ ඉල්ලීමක් කරනු ලැබූ විට සහ ඒ ගරාජයට හෝ ව්‍යාපාර ස්ථානයට අදාළ වෙළෙන්දකුගේ සහතිකය ඉදිරිපත් කරනු ලැබූ විට හා ඒ බලපත්‍රය සඳහා නියමිත අනු ප්‍රමාණය අනුව බලපත්‍ර ගාස්තුව ගෙවනු ලැබූ විට, ඔහු විසින් ඒ සහතිකය දරන්නාට අවශ්‍ය වන වෙළෙන්දකුගේ බලපත්‍ර සංඛ්‍යාවක් නිකුත් කළ යුතු ය.

(ආ) පළාත තුළ සෑම වෙළෙන්දකුගේ බලපත්‍රයක් ම නියමිත ආකෘතියෙහි විය යුතු අතර, ලියාපදිංචි කරනු ලැබූ එක් එක් ගරාජය හෝ ව්‍යාපාර ස්ථානය සම්බන්ධයෙන් නිකුත් කරන ලද එක් එක් බලපත්‍රය සඳහා ඒ ගරාජයට හෝ ව්‍යාපාර ස්ථානයට වෙන් කරන ලද ගරාජ් අංකයෙන් සහ නියම කරනු ලබන ඒ ආකෘතියෙහි දක්වෙන අනුක්‍රමික අංකයකින් සමන්විත වන වෙළෙන්දකුගේ බලපත්‍ර අංකයක් බලපත්‍ර නිකුත් කරන බලධරයා විසින් නියම කළ යුතු ය.

(2) පළාත තුළ වෙළෙන්දකුගේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා යම් බලපත්‍ර නිකුත් කරන බලධරයකුගේ පරිපාලන ප්‍රදේශයේ ඇතුළත පිහිටි ලියාපදිංචි ගරාජයකට හෝ ව්‍යාපාර ස්ථානයක මෝටර් වාහන වෙළෙන්දකු නිෂ්පාදකයකු හෝ අලුත්වැඩියා කරන්නකු වශයෙන් ව්‍යාපාරය කර ගෙන යන තාක් පමණක් ඒ බලධරයා විසින් නිකුත් කරන ලද වෙළෙන්දකුගේ බලපත්‍රය මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා වලංගු වන්නේ ය.

(3) වෙළෙන්දකුගේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබුවේ යම් වර්ෂයක් වෙනුවෙන් ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනයෙන් (2) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව ඒ බලපත්‍රය වලංගු වන්නේ ය.

(4) යම් වර්ෂයක් සඳහා වෙළෙන්දකුගේ සහතිකයක් දරන්නකු නොවන යම් තැනැත්තකුට බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයකු විසින් ඒ වර්ෂයේ දී වෙළෙන්දකුගේ බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

වෙළෙන්දකුගේ බලපත්‍රයක් යටතේ මෝටර් වාහනයක් පාවිච්චි කිරීම.

**19.** (1) පළාත තුළ වෙළෙන්දකුට අයත් වන්නා වූ හෝ විකිණීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා ඔහුට භාර දෙනු ලැබ ඇත්තා වූ සහ විකිණීමින් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා පරීක්ෂණයට භාජනය කරනු ලබන මෝටර් වාහනයක් පාවිච්චි කරනු ලැබීමට වෙළෙන්දකුගේ බලපත්‍රයකින් බලය දෙනු ලැබිය යුතු ය. එසේ වුව ද ගාස්තුවක් හෝ ත්‍යාගයක් සඳහා මගීන් හෝ බඩු යම් මෝටර් වාහනයක් මත ගෙන යාමට හෝ මෝටර් වාහනය මිලට ගැනීමේ අරමුණ ඇතිව එම වාහනය පරීක්ෂණයට භාජනය කරන හෝ පරීක්ෂා කරන තැනැත්තකු නොවන යම් තැනැත්තකු ඒ මෝටර් වාහනය මත ගෙන යාමට එවැනි බලපත්‍රයකින් බලය දෙනු ලබන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

(2) වෙළෙන්දකුගේ සහතිකයක් දරන තැනැත්තකු විසින් ඒ තැනැත්තාට නිකුත් කරන ලද වෙළෙන්දකුගේ බලපත්‍රයක බලය යටතේ විකුණනු ලබන මෝටර් වාහනයක්, විකිණීමට පසුව එළඹෙන දින දහයක කාලය තුළ මෝටර් වාහනයේ ගැණුම්කරු විසින් ගාස්තුවක් හෝ ත්‍යාගයක් සඳහා මගීන් හෝ බඩු ගෙන යාම නොවන වෙනත් යම් කාර්යයක් සඳහා ඒ වාහනය පාවිච්චි කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද විකිණීමෙන් පසුව එළඹෙන ඊළඟ දින තුන ඇතුළත ගැණුම්කරු විසින් —

(අ) බලපවත්නා ආදායම් බලපත්‍රයක් නොමැති මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වන විට, ඒ වාහනය වෙනුවෙන් ආදායම් බලපත්‍රයක් සඳහා 7 වන වගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබුවහොත් ;

(ආ) බලපවත්නා ආදායම් බලපත්‍රයක් ඇති මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වන විට, ඒ වාහනයේ නව අයිතිකරු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා වරින් වර සංශෝධිත 1951 අංක 14 දරන මෝටර් වාහන පනතේ 12වන වගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබුවහොත්

මිස, වෙළෙන්දකුගේ බලපත්‍රයක බලය යටතේ ගැණුම්කරු විසින්, මෝටර් වාහනය පාවිච්චි කිරීම 2 වන වගන්තියේ විධිවිධාන කඩ කිරීමක් විය යුතු අතර, කඩ කිරීමක් වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) වෙළෙන්දකුගේ බලපත්‍රයක බලය යටතේ යම් මෝටර් වාහනයක් පාවිච්චි කරනු ලබන අවස්ථාවක —

(අ) 14 වන වගන්තියේ විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් මෝටර් වාහනය මත ඒ බලපත්‍රය ගෙන යා යුතු ය ;

(ආ) 18(1) වන වගන්තිය යටතේ ඒ බලපත්‍රයට නියම කරන ලද වෙළෙන්දාගේ බලපත්‍ර අංකය එක් එක් හඳුනා ගැනීමේ තහඩුවෙහි දරන හඳුනා ගැනීමේ තහඩු දෙකක් ඒ පංතියට හෝ විස්තරයට අයත් මෝටර් වාහනයකට අදාළ වන යම් නියමිත විධිවිධානවලට අනුකූලව ඒ මෝටර් වාහනයෙහි සවි කළ යුතු ය.

(4) වෙළෙන්දකුගේ බලපත්‍රයක් දරන තැනැත්තකු විසින් විකුණන ලද මෝටර් වාහනයක් ඒ තැනැත්තාට නිකුත් කරන ලද වෙළෙන්දකුගේ බලපත්‍රයේ බලය යටතේ විකිණීමෙන් පසුව පාවිච්චි කරනු ලබන අවස්ථාවක, මෝටර් වාහනය වෙනුවෙන් ඉන් අනතුරුව නිකුත් කරනු ලැබූ ආදායම් බලපත්‍රය ඒ මෝටර් වාහනය විකිණීමේ දිනයෙහි බලාත්මක වූ ලෙස ප්‍රකාශිත විය යුතු අතර, ඒ මත ගෙවිය යුතු බද්ද ඒ අනුව ගණනය කරනු ලැබිය යුතු ය.

(5) වෙළෙන්දකුගේ බලපත්‍රයක් දරන්නකු විසින් —

(අ) ඔහුට නිකුත් කරන ලද වෙළෙන්දකුගේ බලපත්‍රයක බලය යටතේ මෝටර් වාහනයක් පාවිච්චි කරනු ලබන සෑම අවස්ථාවක් සම්බන්ධයෙන් නියමිත ආකෘතියෙහි වූ වාර්තාවක් තබා ගත යුතු ය.

(ආ) එවැනි යම් බලපත්‍රයක බලය මෝටර් වාහනයක් විකුණනු ලබන්නා වූ සහ විකිණීමෙන් පසුව පාවිච්චි කරනු ලබන්නා වූ අවස්ථාවක, මෝටර් වාහනයේ එන්ජින් සහ චැසි අංක, ගැණුම්කරුගේ නම සහ ලිපිනය, විකිණීමෙන් පසුව මෝටර් වාහනය ඉවත් කර ගෙන ගිය දිනය සහ වේලාව සහ 18(1) වන වගන්තිය යටතේ ඒ බලපත්‍රයකට නියම කරන ලද අංකය සම්බන්ධයෙන් වාර්තාවක් තබා ගත යුතු අතර, එම වාර්තාවේ අනුපිටපතක් විකිණීමට ඉක්බිතිව කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය ; තවද

(ඇ) යම් පොලිස් නිලධාරියකු විසින් හෝ කොමසාරිස්වරයා විසින් හෝ බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින් හෝ ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ පරීක්ෂා කිරීම සඳහා වාර්තාව ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ කවර හෝ විටෙක එලෙස ඉදිරිපත් කළ යුතු ය.

ආගන්තුකයකුගේ මෝටර් වාහනයක් සඳහා තාවකාලික බලපත්‍ර.

20. (1) අ) කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද මෝටර් ක්‍රීඩා උත්සවයක දී සහභාගිවීම සඳහා හෝ ;

(ආ) ශ්‍රී ලංකාවට එන ගමනක දී එම වාහනයේ අයිතිකරු විසින් පාවිච්චි කරනු ලැබීමේ කාර්යය සඳහා

යම් මෝටර් වාහනයක් පළාතට අයත් කොටුපලකින් හෝ වරායකින් ආනයනය කරනු ලැබ ඇති බවට, නියමිත ආකෘතියෙහි වූ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ විට කොමසාරිස්වරයා සෑහීමකට පත් වුවහොත් එම වාහනයේ අයිතිකරු වශයෙන් කිසිදු තැනැත්තකු ලියාපදිංචි කරනු නොලැබුවේ වුවද, ආනයනය කළ දින සිට මාස තුනක් නොඉක්මවන කාල සීමාවක් සඳහා මෝටර් වාහනය සන්තකයෙහි තබා ගැනීමට සහ පාවිච්චි කිරීමේ බලය දෙමින් නියමිත ආකෘතියෙහි වූ ආගන්තුකයාගේ තාවකාලික බලපත්‍රයක් අයිතිකරුට නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) නියමිත ගාස්තුව ගෙවනු ලැබීම මත හැර මේ වගන්තිය යටතේ ආගන්තුකයකුගේ තාවකාලික බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය. තවද, තාවකාලික බලපත්‍රයක් සඳහා ගෙවන ලද සෑම ගාස්තුවක්ම පළාත් සභා අරමුදලට බැර කළ යුතු ය.

ආදායම් බලපත්‍ර කඩ කරමින් මෝටර් වාහනයක් පාවිච්චි කිරීම පිළිබඳ තහනම් කිරීම.

21. (1) යම් මෝටර් වාහනයක් සඳහා සන්තකයෙහි බලපවත්නා ආදායම් බලපත්‍රයකින් බලය දෙනු නොලැබූ හෝ ඒ බලපත්‍රයෙහි ඇතුළත් කොන්දේසි කිසිවක් කඩ කරමින් කවර වූ කාර්යයක් සඳහා කිසිම තැනැත්තකු විසින් ඒ මෝටර් වාහනය පළාත තුළ පාවිච්චි නොකළ යුතු ය.

(2) කොමසාරිස්වරයා විසින් —

(අ) බරින් කිලෝග්‍රෑම් එක් සියයක් නොඉක්මවන තැපැල් බඩු ගෙන යාම සඳහා නියමිත කාලසීමාවක් සඳහා පාවිච්චි කරනු ලැබීමට පෞද්ගලික මෝටර් රථයකට හෝ පෞද්ගලික මෝටර් ට්‍රයිසිකලයකට බලය දීමේ හෝ ;

(ආ) තැපැල් හෝ ප්‍රවෘත්ති පත්‍ර ගෙන යාම සඳහා නියමිත කාලසීමාවක් සඳහා පාවිච්චි කරනු ලැබීමට මෝටර් රථයකට, හෝ මෝටර් ට්‍රයිසිකලයකට බලය දීමේ ; හෝ

(ඇ) තැපැල් හෝ ප්‍රවෘත්ති පත්‍ර ගෙන යාම සඳහා අවසර පත්‍රයෙහි සඳහන් කරනු ලබන කොන්දේසිවලට යටත්ව මගී රථයක් පාවිච්චි කරනු ලැබීමට බලය දීමේ

කාර්යය සඳහා අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) යම් වාහනයක් සඳහා තත් කාලයෙහි බලපවත්නා ආදායම් බලපත්‍රයෙන් බලය දෙනු නොලැබූ යම් නිශ්චිත කාර්යයක් සඳහා ඒ වාහනය පාවිච්චි කිරීමට බලය දෙමින් සහ අවසර පත්‍රයක් නිකුත් කරනු ලබන්නේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි නියම කරමින් අවසර පත්‍රයක් නිකුත් කිරීමට (2) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වනු ලැබ නොමැති යම් අවස්ථාවක දී කොමසාරිස්වරයාට බලය දෙමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(4) (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද හෝ (3) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයකට අනුකූලව මෝටර් වාහනයක් පාවිච්චි කිරීමේ හේතුව නිසා ම කිසිම තැනැත්තකු විසින් (1) වන උපවගන්තියේ විධි විධාන කඩ කරනු ලැබූයේ යයි සලකනු නොලැබිය යුතු ය.

## II වන කොටස

### තෘතීය පාර්ශ්ව අවදානම්වලට ප්‍රතිපත්ති රක්ෂණය

තෘතීය පාර්ශ්ව අවදානම්වලට ප්‍රතිපත්තිව මෝටර් වාහන පාවිච්චි කරන්නන් රක්ෂණය කළ යුතු බව හෝ ආරක්ෂිත කළ යුතු බව.

**22.** (1) අවස්ථාවෝචිත පරිදි, යම් තැනැත්තකු විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් තත්කාලයෙහි බලපවත්නා මේ කොටසේ නියමයන්ට අනුකූලව තෘතීය පාර්ශ්ව අවදානම් සම්බන්ධයෙන් රක්ෂණ ඔප්පුවක් හෝ ඇපයක් ඇත්නම් මිස, (2) වන උපවගන්තියෙන් අන්‍යාකාර විධිවිධාන සලසා ඇති පරිදි තැර, ඒ තැනැත්තා විසින් පළාත තුළ මහා මාර්ගයක මෝටර් වාහනයක් පාවිච්චි කිරීම හෝ ධාවනය කිරීම නොකළ යුතු ය. තවදුරටත් ඒ වෙනත් තැනැත්තා විසින් පළාත තුළ මහා මාර්ගයක මෝටර් වාහනයක් පාවිච්චි කිරීමට හෝ ධාවනය කිරීමට සැලැස්වීම හෝ අවසරදීම නොකළ යුතු ය.

(2) ශ්‍රී ලංකා ආණ්ඩුවේ කාර්ය සඳහා මෝටර් වාහනයක් පාවිච්චි කරනු ලබන විට හෝ ධාවනය කරනු ලබන විට රජයට අයත් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් (1) උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

රක්ෂණ ඔප්පු පිළිබඳ නියමයන්.

**23.** (1) මේ කොටසේ නියමයන්ට අනුකූල වනු පිණිස මෝටර් වාහනයක් පාවිච්චි කිරීමට අදාළ රක්ෂණ ඔප්පුවක් —

(අ) මේ කොටසේ කාර්ය සඳහා රක්ෂණ ඔප්පු නිකුත් කිරීමට නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් බලය දෙනු ලැබූ (මෙහි මින් මතු "බලයලත් රක්ෂක" යනුවෙන් සඳහන් කරනු ලබන) රක්ෂකයකු විසින් නිකුත් කරනු ලැබුවා වූ; සහ

(ආ) මහා මාර්ගයක මෝටර් වාහනය පාවිච්චි කිරීමෙන් යම් තැනැත්තකුට සිදු වූ හෝ උද්භූත වූ මරණය හෝ කායික තුවාල සම්බන්ධයෙන් යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් දරනු ලබන යම් වගකීමක් සම්බන්ධයෙන් ඔප්පුවෙහි සඳහන් කරනු ලබන යම් තැනැත්තකු, තැනැත්තන් හෝ තැනැත්තන් පංති (ඇ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව රක්ෂණය කරන්නා වූ; සහ

(ඇ) (i) මෝටර් කෝච් රථයක් සම්බන්ධයෙන් වන විට (ආ) ඡේදයෙහි සඳහන් කරනු ලැබුවා වූ සහ මගීන් නොවන තැනැත්තන් සම්බන්ධයෙන් රුපියල් විසි දහසකට නොඅඩු විය යුතු වූ මුදලක් දක්වා ද, එහි ගෙන යාමට බලය දෙනු ලැබූ එක් එක් මගියා සම්බන්ධයෙන් රුපියල් දෙදහසකට නොඅඩු විය යුතු මුදලක් දක්වා ද යම් එක් අනතුරක් සම්බන්ධයෙන් දරනු ලබන්නා වූ යම් වගකීමක් ආවරණය කෙරෙන ;

(ii) ලොරියක් සම්බන්ධයෙන් වන විට, (ආ) ඡේදයෙහි සඳහන් කරනු ලැබුවා වූ ද රුපියල් විසි දහසකට නොඅඩු විය යුතු මුදලක් දක්වා ද යම් අනතුරක් සම්බන්ධයෙන් දරනු ලබන්නා වූ යම් වගකීමක් ආවරණය කෙරෙන ;

(iii) වෙනත් යම් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වන විට, (ආ) ඡේදයෙහි සඳහන් කරනු ලැබුවා වූ සැමවිටම දරනු ලබන්නා වූ යම් වගකීමක් ආවරණය කෙරෙන

ඔප්පුවක් විය යුතු ය :

එසේ වුව ද මේ උපවගන්තියේ කිසිවකින් —

(i) යම් සේවා නියුක්තියකින් හෝ ඒ අතරතුර මරණය උද්භූත වන අවස්ථාවක, රක්ෂණ ඔප්පුවකින් රක්ෂණය වූ තැනැත්තාගේ සේවා නියුක්තියෙහි සිටින

යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් හෝ එසේ සේවයෙහි නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තකු විසින් විඳින ලද කායික තුවාල සම්බන්ධයෙන් වගකීම ;

(ii) ගාස්තුවක් හෝ කුලයක් සඳහා මගීන් ගෙන යනු ලබන්නා වූ මෝටර් වාහනයක් සම්බන්ධයෙන් හෝ සේවා නියුක්ති සම්බන්ධයෙන් වූ ගිවිසුමක හේතුවෙන් හෝ ඒ අනුව කටයුතු කිරීමේහිලා හැර, හිමිකම් පෑම උද්ගත වන්නේ යම් සිද්ධියකින් ද ඒ සිද්ධිය සිදු වූ අවස්ථාවේ දී වාහනයෙන් ගෙන යනු ලැබීමේ දී, හෝ ඒ මත හෝ වාහනයට ඇතුළුවීමේ දී හෝ ඊට ගොඩවීමේ දී හෝ ඉන් බැසීමේ දී තැනැත්තාගේ මරණය සිදුවීම හෝ කායික තුවාල සිදුවීම සම්බන්ධයෙන් වගකීම ; හෝ

(iii) යම් ගිවිසුම් සම්බන්ධයෙන් වූ වගකීමක්

එවැනි යම් රක්ෂණ ඔප්පුවකින් ආවරණය කරනු ලබන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ කාර්ය සඳහා නියමිත කොන්දේසිවල රක්ෂිත විසින් තැන්පතුවක් කළ යුතු බවට නියම කෙරෙන කොන්දේසියක් ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(3) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද මේ කොටසේ කාර්ය සඳහා රක්ෂණ ඔප්පුවක් නිකුත් කරන රක්ෂකයකු, තැනැත්තන් හෝ තැනැත්තන් පංති සම්බන්ධයෙන් රක්ෂණ ඔප්පුවෙන් ආවරණය කිරීමට අදහස් කෙරෙන යම් වගකීමක් සම්බන්ධයෙන් රක්ෂණ ඔප්පුවෙහි සඳහන් තැනැත්තන්ට හෝ තැනැත්තන් පංතිවලට නාමපූර්ණය කිරීමට යටත් විය යුතු ය.

(4) රක්ෂණ ඔප්පුව නිකුත් කරනු ලබන්නේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි සම්බන්ධයෙන් විස්තර සහ නියම කරනු ලබන වෙනත් යම් කාරණා ඇතුළත් කෙරෙන නියමිත ආකෘතියෙහි වූ සහතිකයක් රක්ෂක විසින් රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මක කරනු ලබන තැනැත්තාට නිකුත් කරනු ලබන්නේ නම් මිස, සහ නිකුත් කරනු ලබන තෙක් මේ කොටසේ කාර්ය සඳහා රක්ෂණ ඔප්පුවක් බලපවතින නොවිය යුතු ය.

(5) මේ කොටසේ "රක්ෂණ ඔප්පුව" යන යෙදුමට ආවරණ සටහනක් ඇතුළත් වේ.

ඇප සඳහා නියමයක්.

**24.** (1) මේ කොටසේ නියමයන්ට අනුකූල වන එබඳු මෝටර් වාහනයක් පාවිච්චි කිරීමට අදාළ ඇපයක් —

(අ) බලපත්‍රලත් රක්ෂකයකු විසින් හෝ (ආ) ඡේදයෙහි සඳහන් ඇපකර දීමේ ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ හෝ පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල වෙනත් යම් කොටසක හෝ කර ගෙන යනු ලබන සහ මේ කොටසේ කාර්ය සඳහා ඒ ඇපය දීමට නියම කරනු ලබන යම් කොන්දේසිවලට යටත්ව, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ තැනැත්තන් මණ්ඩලයක් විසින් දෙනු ලැබිය යුතුය ;

(ආ) යම් පංතියකට අයත් මෝටර් වාහනයකට අදාළ රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන් වන විට මෝටර් වාහනයෙහි අයිතිකරු විසින් හෝ ඇපයෙහි සඳහන් වෙනත් තැනැත්තකු විසින් හෝ තැනැත්තන් පංතියක් විසින් හෝ කරන ලද යම් පැහැර හැරීමක් 23(1)(ආ) වගන්තියෙන් නියමිත මුදල දක්වා වූ මුදලක් එම සඳහන් කොන්දේසි කිසිවකට යටත්ව ඔහු හෝ ඔවුන් විසින්

දරනු ලබන රක්ෂණ ඔප්පුවකින් ආවරණය කළ යුතු 23(1) වන වගන්තියෙන් නියමිත එවැනි යම් වගකීමක් යථා පරිදි නිදහස් කිරීමට ඇපය දෙන්නා විසින් දෙන ලද යම් පොරොන්දුවකින් සමන්විත විය යුතු ය.

(2) (1) වන උප වගන්තියේ (අ) ඡේදයේ කාර්ය සඳහා නියමිත කොන්දේසිවල මේ කොටසේ කාර්ය සඳහා ඇප දීමට බලය දෙනු ලැබීමට අපේක්ෂා කරන යම් තැනැත්තකු විසින් හෝ තැනැත්තන් මණ්ඩලයක් විසින් හෝ තැන්පතුවක් කළ යුතු බව නියම කෙරෙන කොන්දේසියක් ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(3) ඇපය දෙනු ලබන තැනැත්තා හෝ තැනැත්තන් මණ්ඩලය විසින් එය දෙනු ලබන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට නියමිත ආකෘතියෙහි වූ සහ ඇපය නිකුත් කරනු ලබන්නේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි කිසිවක් සම්බන්ධයෙන් විස්තර සහ නියම කරනු ලබන යම් වෙනත් කාරණා ඇතුළත් සහතිකයක් නිකුත් කරනු ලබන්නේ නම් මිස සහ නිකුත් කරනු ලබන තෙක්, මේ කොටසේ කාර්ය සඳහා ඇපයක් බල සහිත නොවිය යුතු ය.

25. (1) රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන් රක්ෂණ සහතිකයක් නිකුත් කරනු ලැබ ඇත්තා වූ අවස්ථාවක, එයින් රක්ෂණය කරනු ලැබූ යම් තැනැත්තකුගේ රක්ෂණය සීමා කිරීමට හෝ කොන්දේසි අනුයුක්ත කිරීමට අදහස් කෙරෙන රක්ෂණ ඔප්පුවේ යම් නියමයක්, (4) වන උපවගන්තියෙහි අන්‍යාකාර විධිවිධාන සලසා ඇති හැර, 23(1)(අ) වගන්තියෙන් ආවරණය කරනු ලැබීමට නියමිත එවැනි යම් වගකීමක් සම්බන්ධයෙන් බලසහිත නොවිය යුතු ය.

රක්ෂණ ඔප්පුවල හෝ ඇපවල ඇති ඇතැම් කොන්දේසි බල සහිත නොවිය යුතු බව.

(2) රක්ෂණ ඔප්පුවක් යටතේ කිසිම වගකීමක් උද්ගත නොවිය යුතු බවට හෝ රක්ෂණ ඔප්පුව යටතේ හිමිකම්පෑමකට උද්ගත වන සිද්ධිය සිදුවීමෙන් පසුව යම් නිශ්චිත දෙයක් කරනු ලැබුවහොත් හෝ නොකර හරිනු ලැබුවහොත් එසේ උද්ගත වන යම් වගකීමක් අවසන් විය යුතු බවට විධිවිධාන සලසන මේ කොටසේ කාර්ය සඳහා ක්‍රියාත්මක කරනු ලැබූ රක්ෂණ ඔප්පුවක යම් කොන්දේසියක් 23(1)(අ) වන වගන්තියෙහි සඳහන් යම් වගකීමක් සම්බන්ධයෙන් වූ හිමිකම් පෑම් කිසිවක් වෙනුවෙන් බලසහිත නොවිය යුතු ය.

(3) රක්ෂණ ඔප්පුව යටතේ ගෙවීමට රක්ෂකයා යටත් වන්නා වූ සහ තෙවැනි පාර්ශ්වයන්ගේ හිමිකම්පෑම් තෘප්තිමත් කිරීමට අදාළ කරනු ලැබුවා වූ මුදල් කිසිවක් රක්ෂකයාට ආපසු ගෙවීමට රක්ෂණය වූ තැනැත්තාට නියම කෙරෙන රක්ෂණ ඔප්පුවක යම් විධිවිධානයක් (1) වන හෝ (2) වන උපවගන්තියේ කිසිවකින් අවලංගු බවට පත් කරන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

(4) (අ) (i) රක්ෂණය වූ තැනැත්තා විසින් හෝ වෙනත් යම් පුද්ගලයකු විසින් පෞද්ගලිකවම හැර ව්‍යාපාර කාර්ය සඳහා ;

(ii) රක්ෂණය කරනු ලැබූ ව්‍යාපාර කාර්ය නොවන ව්‍යාපාර කාර්ය සඳහා ;

(iii) යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යම් බඩු හෝ සැම්පල් ගෙන යාම සඳහා ;

(iv) ගාස්තුවක් හෝ කුලියක් වෙනුවෙන් තැනැත්තන් හෝ බඩු ගෙන යාම සඳහා ;

(v) සංවිධානය කරනු ලැබූ තරග හෝ වේග පරීක්ෂණ සඳහා ;

(vi) කුලියට කරනු ලැබූ තරග හෝ වේග පරීක්ෂණ සඳහා ;

රක්ෂණ ඔප්පුව අදාළ වන මෝටර් වාහනය පාවිච්චි කිරීම බැහැර කරවන්නා වූ—

(අ) (i) රක්ෂණ වූ තැනැත්තා හෝ ඔහුගේ ප්‍රකාශිත හෝ ගම්‍යමාන අවසරය ඇතිව ධාවනය කරවන යම් තැනැත්තකු ;

(ii) රක්ෂණය වූ තැනැත්තා හෝ ඔහු විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තකු ;

(iii) රක්ෂණ ඔප්පුවෙහි නම් කරනු ලැබූ යම් තැනැත්තකු හෝ තැනැත්තන්

නොවන තැනැත්තකු විසින් මෝටර් වාහනයක් ධාවනය කරනු නොලැබිය යුතු බවට විධිවිධාන සලසන්නා වූ—

(ආ) (i) රක්ෂණ ඔප්පුවෙහි නම් කරනු ලැබූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් ;

(ii) ධාවන බලපත්‍රයක් දරන්නකු නොවන යම් තැනැත්තකු විසින් ;

(iii) ධාවන බලපත්‍රය අවලංගු කරනු ලැබුවා වූ හෝ අත්හිටුවනු ලැබුවා වූ තැනකොත් ධාවන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා තත්කාලයෙහි නුසුදුස්සකු වූ යම් තැනැත්තකු විසින්

මෝටර් වාහනයක් ධාවනය කරනු නොලැබිය යුතු බවට විධිවිධාන සලස්වන්නා වූ—

(ඇ) මෝටර් සයිකලයට ඈඳි රථයක් සම්බන්ධව හෝ නොමැති මෝටර් සයිකලයක් සම්බන්ධයෙන් වන විට රියදුරු නොවන කිසිම තැනැත්තකු එහි ගෙන නොයා යුතු බවට විධිවිධාන සලසන්නා වූ ;

(ඈ) යුද්ධයක, සිවිල් යුද්ධයක හෝ මහජන කැලඹීම් හේතුන් නිසා සිදු වූ හෝ සනායක වූ අවදානමක් සඳහා වගකීම බැහැර කරවන්නා වූ

කොන්දේසියක් මත රක්ෂණ ඔප්පුවක යම් කොන්දේසියක් සම්බන්ධයෙන් වන විට, (1) වන උපවගන්තියේ කිසිවක් අදාළ නොවිය යුතු ය.

(5) වයස අවුරුදු දහ අට සම්පූර්ණ කරනු ලැබූ තැනැත්තකු විසින්, මෝටර් වාහනයක් ධාවනය කිරීමට ඉගෙනීමේ කාර්ය සඳහා 45(2) වන වගන්තියෙහි දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව යම් මෝටර් වාහනයක් ධාවනය කරනු ලබන අවස්ථාවක, ඒ වාහනයට අදාළ රක්ෂණ ඔප්පුවේ (4)(අ)(ii) ඡේදය යටතේ ඇතුළත් කරනු ලැබූ කිසිම කොන්දේසියක් 23(1)(අ) වන වගන්තියෙන් ආවරණය කරනු ලැබීමට නියම කර ඇති පරිදි, සහ ඒ තැනැත්තා විසින් මෝටර් වාහනය ධාවනය කරන අතරතුර දරනු ලැබිය හැකි එවැනි යම් වගකීමක් සම්බන්ධයෙන් බල සහිත නොවිය යුතු ය.

ආදායම් බලපත්‍ර සඳහා ඉදිරිපත් කරනු ලබන විට රක්ෂණ සහතිකය හෝ ඇප සහතිකය ඉදිරිපත් කිරීම.

**26.** රජයට අයත් නොවන මෝටර් වාහනයක් වෙනුවෙන් ආදායම් බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම්කරුවකු විසින්ම, ඉල්ලුම්කරු විසින් හෝ ඔහුගේ අණ පරිදි හෝ ඔහුගේ අවසරය ඇතිව වෙනත් තැනැත්තන් විසින් මෝටර් වාහනය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් බලපත්‍රය ක්‍රියාත්මක වන දින අවශ්‍ය රක්ෂණ ඔප්පුව හෝ ඇපය බලාත්මකව ඇති බව ඔප්පු කිරීම පිණිස අවශ්‍යවේවිත පරිදි, රක්ෂණ සහතිකයක් හෝ ඇප සහතිකයක් බලපත්‍ර නිකුත් කරන බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

රක්ෂණ සහතිකය හෝ ඇප සහතිකය ඉදිරිපත් කිරීම පිළිබඳ නියමයන්.

**27.** යම් පොලිස් නිලධරයකු විසින් නියම කරනු ලැබූ විට, පළාත තුළ මහා මාර්ගයක යම් මෝටර් වාහනයක රියදුරකු විසින්, ඔහුගේ නම හා ලිපිනය සහ මෝටර් වාහනයේ අයිතිකරුගේ නම සහ ලිපිනය සහ මෝටර් වාහනයේ අයිතිකරුගේ නම සහ ලිපිනය දෙනු ලැබිය යුතු අතර, ඒ වාහනය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ රක්ෂණ සහතිකය හෝ ඇප සහතිකය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ය :

එසේ වුවද, සහතිකය ඉදිරිපත් කිරීමට එසේ නියම කරනු ලැබුවේ යම් දිනයක ද ඒ දිනයෙහි සිට දින පහක කාල සීමාවක් ඉකුත්වීමට පෙරතුව ඒ දිනයෙහි දී ඔහුට නියම කරනු ලැබූ පොලිස් ස්ථානයේ දී පරීක්ෂා කිරීම සඳහා පෞද්ගලිකව ම ඔහු විසින් සහතිකය භාර දෙනු ලැබුවහොත්, ඒ සහතිකය ඉදිරිපත් කිරීම පැහැර හැරීමේ හේතුව නිසාම කිසිම තැනැත්තකු විසින් මේ උපවගන්තියේ විධිවිධාන කඩකරනු ලැබූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

(2) සහතිකය ඉදිරිපත් කිරීමට (1) වන උපවගන්තිය යටතේ රියදුරකුට නියම කරනු ලැබූ විටෙක, 22 වන වගන්තිය කඩකරමින් වාහනය ධාවනය කරනු ලැබුවේ ද, නැතහොත් එසේ ධාවනය කරනු නොලැබුවේ ද යන්න නිශ්චය කිරීමේ කාර්යය සඳහා පොලිස් නිලධරයකු විසින් නියම කරනු ලබන යම් තොරතුරු, මෝටර් වාහනයක අයිතිකරු විසින් දෙනු ලැබිය යුතු ය.

තෘතීය පාර්ශව අවදානම් සම්බන්ධයෙන් රක්ෂණය කරනු ලැබූ තැනැත්තන්ට විරුද්ධව තීන්දු ප්‍රකාශ ඉටු කිරීම රක්ෂකයාගේ කාර්ය භාරය.

28. (1) රක්ෂණ ඔප්පුවක් ක්‍රියාත්මක කරනු ලැබුවේ යම් තැනැත්තෙකු විසින් ද ඒ තැනැත්තාට 23(4) වන වගන්තිය යටතේ රක්ෂණ සහතිකයක් නිකුත් කිරීමෙන් පසු (රක්ෂණ ඔප්පුවේ නියමයන් මගින් ආවරණය වගකීමක් වන) රක්ෂණ ඔප්පුවෙන් ආවරණය විය යුතු 23(1)(අ) වන වගන්තියෙන් නියමිත පරිදි එවැනි යම් වගකීමක් සම්බන්ධයෙන් වූ තීන්දු ප්‍රකාශයක් රක්ෂණ ඔප්පුවෙන් රක්ෂණය කරනු ලැබූ යම් තැනැත්තකුට විරුද්ධව ලබා ගතහොත්, එවිට රක්ෂණ ඔප්පුව වැළැක්වීමට හෝ අවලංගු කිරීමට රක්ෂකයාට හිමිකම තිබුණේ ද නැතහොත් රක්ෂක විසින් එය වළක්වනු ලැබිය හැකි හෝ අවලංගු කරනු ලැබිය හැකි වුව ද 29 වන වගන්තියේ සිට 32 වන වගන්තිය දක්වා වූ වගන්තිවල විධිවිධානවලට යටත්ව, රක්ෂක විසින්, තීන්දු ප්‍රකාශයේ ප්‍රතිලාභවලට හිමිකම් ඇති තැනැත්තන්ට ගාස්තු සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් මුදලක් සහ ඒ තීන්දු ප්‍රකාශය යටතේ ඒ මුදල මත පොලිය සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදලක් ඇතුළුව ඒ වගකීම සම්බන්ධයෙන් යම් මුදලක් ගෙවිය යුතු ය.

(2) මේ වගන්තියේ "රක්ෂණ ඔප්පුවේ නියමයන් මගින් ආවරණය වූ වගකීම" යන්නෙන් රක්ෂණ ඔප්පුවෙන් ආවරණය වූ වගකීමක් හෝ රක්ෂණ ඔප්පුව වැළැක්වීමට හෝ අවලංගු කිරීමට රක්ෂකයාට හිමිකම් තිබීම හෝ රක්ෂණ ඔප්පුව රක්ෂක විසින් වළක්වා හෝ අවලංගු කර තිබීම නිසා නොවේ නම් එසේ ආවරණය වන වගකීමක් අදහස් වේ.

නඩු සම්බන්ධයෙන් රක්ෂකයාට දැන්වීමක් කළ යුතු බව.

29. (අ) තීන්දු ප්‍රකාශය සටහන් කරනු ලැබුවේ යම් නඩුවක් සම්බන්ධයෙන්ද ඒ නඩුව ආරම්භ වී දින හතකට පෙර හෝ දින හතක් ඇතුළත නඩුවේ පාර්ශ්වයක් විසින්, නඩුව සම්බන්ධයෙන් දැන්වීමක් රක්ෂක වෙත භාර දී ඇත්නම් මිස, ඒ තීන්දු ප්‍රකාශය සම්බන්ධයෙන් ; හෝ

(ආ) යම් තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීම අභියාචනය හේතුකොට නතර කර ඇති තාක් කල් ඒ තීන්දු ප්‍රකාශය සම්බන්ධයෙන්

28 වන වගන්තියේ විධිවිධාන යටතේ රක්ෂක විසින් කිසිම මුදලක් ගෙවනු නොලැබිය යුතු ය.

සිද්ධියට පෙර රක්ෂණ ඔප්පුව අවලංගු කර ඇති අවස්ථාවක රක්ෂකයාගේ වගකීමක් නොමැති බව.

30. වගකීම උද්ගත වන මරණය හෝ කායික තුවාලය සම්බන්ධයෙන් හේතු වූ සිද්ධිය සිදුවීමට පෙර අන්‍යෝන්‍ය කැමැත්තෙන් හෝ රක්ෂණ ඔප්පුවෙහි ඇතුළත් යම් විධි විධානයක් ප්‍රකාර සහ —

(අ) එකී සිද්ධිය සිදුවීමට පෙර රක්ෂණ සහතිකය රක්ෂක වෙත ප්‍රත්‍යර්පණය කරනු ලැබීමෙන් හෝ රක්ෂණ සහතික නිකුත් කරනු ලැබුවේ යම්

තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් සහතිකය නැති වූ බව හෝ විනාශ වූ බව ප්‍රකාශ කරන දිවුරුම් පත්‍රයක් සාදනු ලැබ රක්ෂක වෙත භාර දෙනු ලැබීමෙන් ; හෝ

(ආ) එකී සිද්ධිය සිදුවීමෙන් පසු එසේ රක්ෂණ ඔප්පුව අවලංගු කිරීම බලපැවැත්වීමේ දින සිට මාස තුනක කාලයක් ඉකුත් වීමට පෙර, සහතිකය නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් සහතිකය රක්ෂක වෙත පවරණය කරනු ලැබුවේ නම් හෝ දිවුරුම් පත්‍රයක් සාදනු ලැබ රක්ෂකට භාර දෙනු ලැබීමෙන් ; හෝ

(ඇ) එකී සිද්ධිය සිදුවීමට පෙර හෝ ඉන් පසුව එසේ එකී මාස තුනක කාලය ඇතුළත සහතිකය පවරණය කිරීම නොකර හැරීම සම්බන්ධයෙන් රක්ෂක විසින් මේ කොටස යටතේ නඩු කටයුතු ආරම්භ කරනු ලැබීමෙන්

රක්ෂණ ඔප්පුව අවලංගු කරනු ලැබුවේ නම් යම් වගකීමක් සම්බන්ධයෙන් 28 වන වගන්තියේ විධි විධාන යටතේ රක්ෂක විසින් කිසිම මුදලක් ගෙවනු නොලැබිය යුතු ය.

ප්‍රතිරක්ෂණය අදාළ නැති වගකීමක් නොමැති බවට ප්‍රකාශය.

**31.** (1) කිසියම් ප්‍රකාශය සටහන් කරනු ලැබුවේ යම් නඩුවක් සම්බන්ධයෙන් ද ඒ නඩුව පැවරීමෙන් පසු මාස තුනකට පෙර හෝ මාස තුනක් ඇතුළත ආරම්භ කරනු ලැබූ නඩු කටයුතුවල දී –

(අ) රක්ෂණ ඔප්පුවෙහි ඇතුළත් යම් විධිවිධානයකට බාහිරව වැදගත් කරුණක් හෙළි නොකිරීමෙන් හෝ යම් වැදගත් විස්තරයක් සම්බන්ධයෙන් අසත්‍ය වූ කරුණක් ඉදිරිපත් කිරීමෙන් එය ලබා ගැනීමේ හේතුවක් මත එය අවලංගු කරවා ගැනීමට රක්ෂකට හිමිකම් ඇති බවට ප්‍රකාශයක් ; හෝ

(ආ) ඒ හේතුව මත දැනටමත් රක්ෂක විසින් රක්ෂණ ඔප්පුව, අවලංගු කරවා ගෙන ඇත්නම් රක්ෂණ ඔප්පුවෙහි ඇතුළත් යම් විධිවිධානයකට බාහිරව එසේ කිරීමට ඔහුට හිමිකම් ඇති බවට ප්‍රකාශයක්

සිවිල් අධිකරණ බලය ඇති අධිකරණයකින් ඔහු විසින් ලබා ගෙන ඇත්නම් රක්ෂක විසින් 28 වන වගන්තිය යටතේ කිසිම මුදලක් ගෙවනු නොලැබිය යුතු ය :

එසේ වුවද එම නඩු කටයුතු ආරම්භ කිරීමට පසු දින හතකට පෙර හෝ දින හතක් ඇතුළත තමා විශ්වාසය තැබීමට යෝජනා කරන හෙළි නොකිරීම හෝ අසත්‍ය කරුණු ඉදිරිපත් කිරීම සඳහන් කරමින් එකී නඩුවේ පැමිණිලිකරු වන තැනැත්තාට ඒ සම්බන්ධයෙන් දැන්වීමක් දී ඇත්නම් මිස, එවැනි යම් නඩු කටයුත්තක දී ඉහත කී පරිදි එවැනි ප්‍රකාශයක් ලබා ගෙන ඇති රක්ෂකයකු එම නඩු කටයුතු ආරම්භ කිරීමට පෙර පවරන ලද යම් නඩුවක දී ලබා ගත් යම් තීන්දු ප්‍රකාශයක් සම්බන්ධයෙන් මේ වගන්තියේ ප්‍රතිලාභ ලැබීමට එමගින් හිමිකම් නොලැබිය යුතු ය. තවද, ඒ නඩු කටයුතු සම්බන්ධයෙන් දැන්වීමක් එසේ දී ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා, සුදුසු යයි ඔහු විසින් අදහස් කරනු ලබන්නේ නම්, නඩු කටයුත්තෙහි පාර්ශ්වයක් කරනු ලැබීමට හිමිකම් ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියේ " වැදගත් කරුණු " සහ " වැදගත් විස්තරය " යන්නෙන් පිළිවෙලින් තමා විසින් අවදානම් ගනු ලබන්නේ ද යි සහ එසේ ගනු ලබන්නේ නම්, කිනම් වාරික සහ කොන්දේසි අනුව ද යි තීරණය කිරීමෙහිලා සහ කල්පනාව ඇති රක්ෂකයකුගේ තීරණය කෙරෙහි බලපෑමක් ඇති කරවන ස්වභාවයකින් වූ කරුණක් සහ විස්තරයක් අදහස් වේ.

**32.** තීන්දු ප්‍රකාශය සටහන් කරනු ලැබුවේ යම් නඩුවක් සම්බන්ධයෙන් ද ඒ නඩුව පැවරීමෙන් පසු මාස තුනකට පෙර හෝ මාස තුනක් ඇතුළත ආරම්භ කරනු ලැබූ නඩු කටයුතුවල දී 25 (4) වන වගන්තියෙහි ගණන් ගනු ලැබූ කොන්දේසිවලින් එක් කොන්දේසියක් වන, රක්ෂණ ඔප්පුවේ සඳහන් කොන්දේසියක් සම්බන්ධයෙන් කඩ කිරීමක් තහවුරු කර ඇති බවට රක්ෂක විසින් නිසි අධිකරණ බලය ඇති අධිකරණයකින් ප්‍රකාශයක් ලබා ගෙන ඇතොත්, ඒ තීන්දු ප්‍රකාශය සම්බන්ධයෙන් රක්ෂකයකු විසින් 28 වන වගන්තිය යටතේ කිසිම මුදලක් ගෙවනු නොලැබිය යුතු ය.

කොන්දේසිය කඩ කිරීම සඳහා වගකීමක් නොමැති බව ප්‍රකාශ කිරීම.

එසේ වුවද එම නඩු කටයුතු ආරම්භ කිරීමට පසු දින හතකට පෙර හෝ දින හතක් ඇතුළත තමා විශ්වාසය තැබීමට යෝජනා කරන කොන්දේසි කඩකිරීම සඳහන් කරමින් එකී නඩුවේ පැමිණිලිකරු වන තැනැත්තාට ඒ සම්බන්ධයෙන් දැන්වීමක් දී ඇත්නම් මිස, එවැනි යම් ප්‍රකාශයක් ලබා ගෙන ඇති රක්ෂකයකු එම නඩු කටයුතු ආරම්භ කිරීමට පෙර පවරන ලද යම් නඩුවක දී ලබා ගත් යම් තීන්දු ප්‍රකාශයක් සම්බන්ධයෙන් මේ වගන්තියේ ප්‍රතිලාභ ලැබීමට එමගින් හිමිකම් නොලැබිය යුතු ය. තවද ඒ නඩු කටයුතු සම්බන්ධයෙන් දැන්වීමක් එසේ දී ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා සුදුසු යයි ඔහු විසින් අදහස් කරනු ලබන්නේ නම්, නඩු කටයුත්තෙහි පාර්ශ්වයක් කරනු ලැබීමට හිමිකම් ඇත්තේ ය.

**33.** රක්ෂණ ඔප්පුවකින් රක්ෂණය වූ තැනැත්තකුගේ වගකීම සම්බන්ධයෙන් ගෙවීමට 28 වන වගන්තිය යටතේ රක්ෂකයකු යටත් වන මුදල ඒ වගකීම සම්බන්ධයෙන් රක්ෂණ ඔප්පුව යටතේ ගෙවීමට යටත් වන මුදල ඉක්මවන්නේ නම්, ඒ වගන්තියේ විධිවිධානවලට බාහිරව අතිරික්තය ඒ තැනැත්තාගෙන් අය කර ගැනීමට ඔහුට හිමිකම් ලැබිය යුතු ය.

රක්ෂක විසින් ගෙවන ලද අතිරික්ත මුදල අයකර ගැනීම.

**34.** (1) 23(1) (ආ) වන වගන්තියෙහි සඳහන් ස්වභාවයකින් වූ යම් වගකීමක් සම්බන්ධයෙන් කරනු ලබන බේරුම් කිරීමකට තෘතීය පාර්ශ්වයක්, පාර්ශ්වකරුවකු වන්නේ නම් මිස, ඒ තෘතීය පාර්ශ්වය විසින් කරනු ලැබිය හැකි යම් හිමිකම්පෑමක් සම්බන්ධයෙන් රක්ෂකයකු විසින් කරන ලද කිසිම බේරුම් කිරීමක් වලංගු නොවිය යුතු ය.

තෘතීය පාර්ශ්වයන්ගේ ඇතිවූ අයිතිවාසිකම් පත ඇතැම් නඩු කිරීම.

(2) රක්ෂණ පත්‍රිකාවක් නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාගේ මරණය, මේ කොටසේ විධි විධාන යටතේ හිමිකම් පෑමක් උද්ගත වන සිද්ධියක් ඇතිවීමෙන් පසුව සිදුවුවහොත් වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත්ද, ඔහුගේ මුදලය සම්බන්ධයෙන් හෝ රක්ෂකට ප්‍රතිපක්ෂව හෝ එකී සිද්ධියෙන් උද්ගත වන යම් නඩු නිමිත්තක් පවත්වා ගෙන යාමට බාධාවක් නොවිය යුතු ය.

**35.** (1) මේ කොටසේ කාර්ය සඳහා ක්‍රියාත්මක කරන ලද යම් රක්ෂණ ඔප්පුවක් යටතේ තෘතීය පාර්ශ්වයක් විසින් දරනු ලැබිය හැකි යම් වගකීමකට ප්‍රතිපක්ෂව තැනැත්තකු රක්ෂණය කරනු ලැබූ අවස්ථාවක, එවිට—

රක්ෂිත තැනැත්තාගේ වස්තුභංගත්වය පිළිබඳව රක්ෂණකරුවන්ට විරුද්ධව තෘතීය පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම්.

(අ) රක්ෂිත තැනැත්තා වස්තු භංගත්වයට පත් තැනැත්තකු බවට විනිශ්චය කරනු ලැබුවහොත් හෝ තම ණය හිමියන් සමග සමථයට පත් කිරීමක් හෝ සැකැස්මක් ඇති කළ හොත්; හෝ

(ආ) රක්ෂිත තැනැත්තා සමාගමක් වන අවස්ථාවක, ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කරනු ලැබුවහොත් හෝ ඒ සමාගම සම්බන්ධයෙන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක් සඳහා යෝජනා සම්මතයක් සම්මත කරනු ලැබුවහොත් හෝ සමාගමේ ව්‍යාපාරය හෝ ව්‍යවසාය සම්බන්ධයෙන් භාර ගන්නකු හෝ කළමනාකරුවකු යථා පරිදි පත් කරනු ලැබුවහොත් හෝ බැඳීම්

සංයුක්ත වන හෝ ඊට යටත් යම් දේපළ සම්බන්ධයෙන් අස්ථිර මැදිහත්වීම් සුරක්ෂිත සංණයපතු කිසිවක් දරන්නන් විසින් හෝ වෙනුවෙන් පක්ෂයකට ගනු ලැබුවහොත්

ඒ සිද්ධියට පෙර හෝ පසුව රක්ෂිත තැනැත්තා විසින් යම් තෘතීය පාර්ශ්වයකට එවැනි යම් වගකීමක් දරනු ලබන්නේ නම්, පවතැතිව වෙනත් යම් නීතියක තුමක් සඳහන් වුවද වගකීම සම්බන්ධයෙන් වූ හිමිකම් යටතේ රක්ෂණකරුට ප්‍රතික්ෂේප මිනුගේ අයිතිවාසිකම් වගකීම එසේ දරනු ලැබුවේ යම් තෘතීය පාර්ශ්වයකට ද ඒ තෘතීය පාර්ශ්වය වෙත පවරා සතු කරනු ලැබිය යුතු ය.

(2) මේ කොටසේ කාර්ය සඳහා නිකුත් කරන ලද රක්ෂණ ඔප්පුවක යම් කොන්දේසියක් (1) වන උපවගන්තියේ (i) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි සඳහන් සිද්ධීන් කිසිවක් රක්ෂිත තැනැත්තාට සිදුවීම මත, රක්ෂණ ඔප්පුව කෙලින්ම හෝ අනාකාරයකින් වැලැක්වීමට හෝ ඒ යටතේ පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් වෙනස් කිරීමට අදහස් කෙරෙන අවස්ථාවක, ඒ කොන්දේසිය බලරහිත විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් පැවරීමක් කරනු ලැබූ විට, රක්ෂණකරු විසින් රක්ෂිත තැනැත්තා සම්බන්ධයෙන් යටත් විය යුතු වගකීමේ ප්‍රමාණයටම රක්ෂණකරු තෘතීය පාර්ශ්වය සම්බන්ධයෙන් ද යටත් විය යුතු ය:

එසේ වුව ද—

(අ) රක්ෂිත තැනැත්තාට ඇති රක්ෂණකරුගේ වගකීම, තෘතීය පාර්ශ්වයට ඇති රක්ෂිත තැනැත්තාගේ වගකීම ඉක්මවන්නේ නම්, මේ කොටසේ ඇති කිසිවකින් අතිරික්තය සම්බන්ධයෙන් රක්ෂණකරුට විරුද්ධව රක්ෂිත තැනැත්තාගේ අයිතිවාසිකම් කෙරෙහි බලපෑමක් ඇති නොවිය යුතු ය; තවද

(ආ) රක්ෂිත තැනැත්තාට ඇති රක්ෂණකරුගේ වගකීම, තෘතීය පාර්ශ්වයට ඇති රක්ෂිත තැනැත්තාගේ වගකීමට වඩා අඩු වන්නේ නම්, මේ කොටසේ ඇති කිසිවකින් ශේෂය සම්බන්ධයෙන්, රක්ෂිත තැනැත්තාට විරුද්ධව තෘතීය පාර්ශ්වකරුගේ අයිතිවාසිකම් කෙරෙහි බලපෑමක් ඇති නොවිය යුතු ය.

රක්ෂණය පිළිබඳ තොරතුරු දීම යුතුකමක් බව.

**30.** (1) 23(1) (ආ) වන වගන්තියෙහි සඳහන් යම් වගකීමක් සම්බන්ධයෙන් හිමිකම් පෑමක් කරනු ලබන්නේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ පෑම තැනැත්තකු විසින්, හිමිකම්පෑම කරන තැනැත්තා විසින් හෝ වෙනුවෙන් කරන ලද ඉල්ලීමක් මත ඒ වගකීම සම්බන්ධයෙන් මේ කොටසේ කාර්ය සඳහා නිකුත් කරන ලද යම් රක්ෂණ ඔප්පුවකින් ඔහු රක්ෂණය වී ඇත්තේ දැයි හෝ නොවූයේ දැයි තැනහොත් රක්ෂණකරු විසින් රක්ෂණ ඔප්පුව වලක්වනු ලැබුවේ නම් හෝ අවලංගු කරනු නොලැබුවේ නම් එසේ රක්ෂණය වනු ලැබුවේ දැයි ප්‍රකාශ කළ යුතු ය. තවද, ඔහු එසේ රක්ෂණය වනු ලැබුවේදැයි ප්‍රකාශ කළ යුතු ය. තවද, ඔහු එසේ රක්ෂණය වී ඇත්තේ නම් හෝ රක්ෂණය වනු ලැබුවේ නම් ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද රක්ෂණ සහතිකයෙහි සඳහන් කරනු ලැබූ ඒ රක්ෂණ ඔප්පුව සම්බන්ධයෙන් විස්තර දෙනු ලැබිය යුතු ය.

(2) යම් රක්ෂිත තැනැත්තකු වස්තු භංගත්වයට පත් තැනැත්තකු බවට විනිශ්චය කරනු ලැබුවහොත් හෝ තම ණය හිමියන් සමග සමථයට පත් කිරීමක් හෝ සැකැස්මක් ඇති කළහොත් හෝ රක්ෂිත තැනැත්තා සමාගමක් වන අවස්ථාවක ගණින් බේරා වසා දැමීමේ ආඥාවක් කරනු ලැබුවහොත් හෝ සමාගම සම්බන්ධයෙන් ස්වේච්ඡාවෙන් ගණින් බේරා වසා දැමීමක් සඳහා යෝජනා සම්මතයක් සම්මත කරනු

ලැබුවහොත් හෝ සමාගමේ ව්‍යාපාරය හෝ ව්‍යවසාය සම්බන්ධයෙන් භාර ගන්නකු හෝ කළමනාකරුවකු යථා පරිදි පත් කරනු ලැබුවහොත්, හෝ බැඳීම සංයුක්ත වන හෝ ඊට යටත් යම් දේපළ සම්බන්ධයෙන් අස්ථිර බැඳීම්කින් සුරක්ෂිත ණයකරපත්‍ර කිසිවක් දරන්නන් විසින් හෝ වෙනුවෙන් සන්තකයට ගනු ලැබුවහොත් වරින් වර සංශෝධිත 1951 අංක 14 දරන මෝටර් වාහන පනතේ අංක 14 වන වගන්තියෙන් යම් අයිතිවාසිකම් ඔහු වෙත පවරා සතු කර ඇත්තේ දැයි නිශ්චය කිරීමේ කාර්ය සඳහා සහ යම් අයිතිවාසිකම් ඇතොත් ඒ අයිතිවාසිකම් බලාත්මක කිරීමේ කාර්ය සඳහා මේ කොටසේ විධි විධාන මගින් නියමිත පරිදි වස්තු භංගත්වයට පත් තැනැත්තා ණයකරු හෝ සමාගම ඒ වගකීම යටතේ ඔහුට බැඳී සිටින බවට හිමිකම් සහ යම් තැනැත්තකුගේ ඉල්ලීම මත ඔහු විසින් යුක්ති සහගත ලෙස නියම කරනු ලබන යම් තොරතුරු අවස්ථාවෝචිත පරිදි වස්තු භංගත්වයට පත් තැනැත්තාගේ, ණයකරුගේ හෝ සමාගමේ හෝ වස්තු භංගත්වයට පත්වීමේ දී නිල ආවරණකරුගේ හෝ භාර ගන්නාගේ හෝ කළමනාකරුගේ, ඈවරකරුගේ භාර ගන්නාගේ හෝ දේපළ සන්තකයෙහි ඇති තැනැත්තාගේ යුතුකම වන්නේ ය. තවද, ඉහත කී සිද්ධීන් සම්බන්ධයෙන් වූ ඒ තොරතුරු දීම මත, කෙළින්ම හෝ අනාකාරයකින් ගිවිසුම වැළැක්වීමට හෝ ඒ යටතේ පාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම් වෙනස් කිරීමට හෝ ඉහත කී සිද්ධීන් සම්බන්ධයෙන් එය දීම අනාකාරයකින් නතර කිරීම හෝ වැළැක්වීමට අදහස් කෙරෙන නාන් ද්‍රව්‍ය රක්ෂණ ඔප්පුවක ඇති යම් කොන්දේසියක් බල රහිත වන්නේ ය.

(3) යම් විශේෂ රක්ෂණකරුවකුට ප්‍රතිපක්ෂව අයිතිවාසිකම් වන වගන්තිය යටතේ යම් තැනැත්තකු පවරා දී ඇති බව හෝ පවරා දී තිබිය හැකි බව අනුමාන කිරීම සඳහා හේතු මේ වගන්තිය අනුව කටයුතු කිරීමෙහිලා ඒ තැනැත්තාට දෙන ලද තොරතුරු වලින් හෙළිවන්නේ නම්, මේ වගන්තියෙහි සඳහන් තැනැත්තන් මත එයින් නියම කරන ලද යුතුකමට ඒ රක්ෂණකරු ද යටත් විය යුතු ය.

(4) තොරතුරු සැපයීමට මේ වගන්තියෙන් නියම කරන ලද යුතුකම, එසේ නියම කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු මත ද ඒ තැනැත්තාගේ සන්තකයෙහි හෝ බලයෙහි ඇති සියලු රක්ෂණ ගිවිසුම්, වාරික සඳහා තුවිතාන්සි සහ වෙනත් අදාළ ලේඛන පරීක්ෂා කරනු ලැබීමට සහ ඒවායේ පිටපත් ගනු ලැබීමට ඉඩදීම සඳහා වූ යුතුකමක් ඇතුළත් විය යුතු ය.

37\. මේ කොටසේ කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ රක්ෂණ ඔප්පුවක් යටතේ රක්ෂිත තැනැත්තකු වස්තු භංගත්වයට පත් තැනැත්තකු බවට විනිශ්චය කරනු ලැබූ අවස්ථාවක, හෝ ඒ රක්ෂිත තැනැත්තා සමාගමක් නම්, ඒ සමාගම සම්බන්ධයෙන් ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කරනු ලැබ ඇත්තා වූ හෝ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ යෝජනා සම්මතයක් සම්මත කරනු ලැබ ඇත්තා වූ අවස්ථාවක, වගකීම තෘතීය පාර්ශ්වයකට දරනු ලැබීමෙන් පසුව සහ අවස්ථාවෝචිත පරිදි, වස්තු භංගත්වය සම්බන්ධයෙන් හෝ ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් නඩු කටයුතු ආරම්භ කිරීමෙන් පසුව රක්ෂණකරු සහ රක්ෂිත තැනැත්තා අතර ඇති කර ගන්නා ලද කිසිම ගිවිසුමකින් හෝ ඉහත කී නඩු කටයුතු ආරම්භ කිරීමෙන් පසුව රක්ෂිත තැනැත්තා විසින් කරන ලද යම් අත් හැරීමක්, පැවරීමක් හෝ වෙනත් බැහැර කිරීමක් හෝ ඔහුට කරන ලද ගෙවීමක් වරින් වර සංශෝධිත 1951 අංක 14 දරන මෝටර් වාහන පනතේ 14 වන වගන්තිය යටතේ තෘතීය පාර්ශ්වයට පවරන ලද අයිතිවාසිකම් පැරදවීමට බලසහිත නොවිය යුතු ය. එසේත්, එවැනි යම් ගිවිසුමක්, අත් හැරීමක්, බැහැර කිරීමක් හෝ ගෙවීමක් කරනු නොලැබුවාක් ලෙස එම අයිතිවාසිකම් එලෙසින්ම පැවතිය යුතු ය.

රක්ෂණකරුවන් සහ රක්ෂිත තැනැත්තන් අතර බේරුම් කිරීම.

රක්ෂිත තැනැත්තාගේ වත්කු භංගත්වය තෘතීය පාර්ශ්වයන් විසින් කරනු ලබන හිමිකම් ඇති කෙරෙහි බල නොපෑ යුතු බව.

**38.** රක්ෂණ ඔප්පුවක් ක්‍රියාත්මක කර ඇත්තේ යම් තැනැත්තෙකු විසින් ද ඒ තැනැත්තාට රක්ෂණ සහතිකයක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක, රක්ෂණ ඔප්පුවෙන් රක්ෂිත යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් 35 (1) වන වගන්තියෙහි සඳහන් යම් සිද්ධියක් සිදුවීම 36 වන වගන්තියෙහි හෝ 37 වන වගන්තියෙහි කුමක් සඳහාවුව ඇත ද 23 (1) (ආ) වගන්තියෙහි සඳහන් ස්වභාවයෙන් වූ ඒ තැනැත්තාගේ යම් වගකීමක් කෙරෙහි බලපෑමක් නොවිය යුතු ය. එසේම වගකීම දරනු ලැබුවේ යම් තැනැත්තෙකු ද ඒ තැනැත්තා වෙත 35 වන, 36 වන සහ 37 වන වගන්තිවල විධිවිධාන යටතේ පවරන ලද රක්ෂණකරුට විරුද්ධව යම් අයිතිවාසිකම් කෙරෙහි මේ වගන්තියේ සඳහන් කිසිවක් බලපෑමක් නොවිය යුතු ය.

35 වන, 36 වන සහ 37 වන වගන්ති අදාළ කිරීම.

**39.** (1) 35 වන 36 වන සහ 37 වන වගන්තිවල කාර්ය සඳහා යම් රක්ෂණ ඔප්පුවක් යටතේ රක්ෂිත තැනැත්තෙකු සම්බන්ධයෙන් "තෘතීය පාර්ශ්වයන්ට වගකීම" යන යෙදුමෙහි වෙනත් යම් රක්ෂණ ඔප්පුවක් යටතේ රක්ෂණකරුගේ තත්ත්වයෙන් ඒ තැනැත්තාගේ යම් වගකීමක් ඇතුළත් නොවිය යුතු ය.

(2) (අ) සුදෙක්ම ප්‍රතිසංස්කරණය කිරීමේ හෝ වෙනත් සමාගමක් සමග ඒකාබද්ධ කිරීමේ කාර්ය සඳහා සමාගමක් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවක, හෝ

(ආ) කම්කරු වන්දි ආඥාපනතේ 24 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති අදාළ වන යම් විදියකට

35 වන 36 වන සහ 37 වන වගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

රක්ෂණ ඔප්පුව අවලංගු කරනු ලැබීම මත සහතිකය පවරණය කිරීම යුතුකමක් බව.

**40.** මේ කොටසේ කාර්ය සඳහා නිකුත් කරන ලද රක්ෂණ ඔප්පුවක් යටතේ ආවරණය කෙරෙන කාල සීමාව, එකී කාලය ඉකුත් වී අවසන් වීමට පෙර යම් ක්‍රමයකින් අවසන් කරනු ලබන්නා වූ හෝ අත්හිටුවනු ලබන්නා වූ කවර හෝ විටෙක, රක්ෂිත තැනැත්තා විසින්, ඒ අවසන් කිරීමට හෝ අත්හිටුවීමට පසු දින හතක් ඇතුළත එකී රක්ෂණ ඔප්පුව සම්බන්ධයෙන් රක්ෂණකරු විසින් දෙන ලද අන්තිම රක්ෂණ සහතිකය, රක්ෂණ ඔප්පුව නිකුත් කරනු ලැබූ රක්ෂණකරුට භාර දෙනු ලැබිය යුතු ය. නැතහොත් එකී සහතිකය නැති වී හෝ විනාශ වී ඇත්නම්, ඒ බවට දිවුරුම් පත්‍රයක් සාදනු ලැබ, එය රක්ෂණකරුට භාර දෙනු ලැබිය යුතු ය.

රක්ෂණ ඔප්පුව අවලංගු කිරීම හෝ අත්හිටුවීම සම්බන්ධයෙන් කොමසාරිස්වරයාට දැන්වීම රක්ෂණකරුගේ යුතුකම බව.

**41.** මේ කොටසේ කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ රක්ෂණ ඔප්පුවක්, එම රක්ෂණ ඔප්පුව නිකුත් කරනු ලැබූ රක්ෂණකරු විසින් අවලංගු කරනු ලබන හෝ අත්හිටුවනු ලබන කවර හෝ විටෙක, රක්ෂණකරු විසින් කොමසාරිස්වරයාට හෝ නියම කරනු ලබන වෙනත් යම් බලධරයකුට දින හතක් ඇතුළත ඒ අවලංගු කිරීම හෝ අත්හිටුවීම දන්වනු ලැබිය යුතු ය.

ඇප සම්බන්ධයෙන් මේ කොටස අදාළ කිරීම.

**42.** 25 වන වගන්තියේ සහ 28 වන වගන්තියේ සිට 41 වන වගන්තිය දක්වා වූ වගන්තිවල විධිවිධාන රක්ෂණ ඔප්පු සම්බන්ධයෙන් අදාළ වන පරිදි මේ කොටස යටතේ බලය ඇත්තා වූ ඇප සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. රක්ෂණය කරනු ලැබීම, රක්ෂණ සහතිකයක්, රක්ෂණකරුවකු සහ රක්ෂිත තැනැත්තන් සම්බන්ධයෙන් එම වගන්ති කිසිවක ඇති යොමු කිරීම් පිළිවෙළින් බලාත්මකව ඇත්තා වූ ඇපය, ඇප සහතිකය සහ ඇපයෙන් ආවරණය වූ වගකීම ඇති තැනැත්තන් සම්බන්ධයෙන් කරන ලද යොමු කිරීම් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය.

**43.** 23 වන හෝ 24 වන වගන්තියේ කාර්ය සඳහා සාදන ලද යම් නියෝගයකට අනුකූලව යම් රක්ෂණකරුවකු විසින් හෝ යම් තැනැත්තකු හෝ තැනැත්තන් මණ්ඩලයක් විසින් හෝ තැන්පත් කරන ලද යම් මුදලක කිසිම කොටසක් මේ කොටස යටතේ රක්ෂණ ඔප්පුවක් මගින් ආවරණය කළ යුතු යයි නියම කර ඇත්තා වූ වගකීමක් වන ඔහු විසින් දරනු ලැබුවා වූ වගකීම් කිසිවක් නිදහස් කර නොමැති තාක් කල් හෝ අන්‍යාකාර විධිවිධාන සලසා නොමැති තාක් කල් ඔහු විසින් දරනු ලැබූ වෙනත් යම් වගකීම් නිදහස් කිරීමෙහි ලා අදාළ කරනු නොලැබිය යුතු ය.

තැන්පත් සම්බන්ධයෙන් ඉල්ලීම්.

**44.** පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය :—

මේ කොටසේ කාර්ය සඳහා නියෝග.

(අ) නියම කරනු ලැබිය යුතු බවට මේ කොටසින් ප්‍රකාශිත හෝ නියමිත සියලු කාරණා ;

(ආ) මේ කොටසේ කාර්ය සඳහා පාවිච්චි කරනු ලැබිය යුතු ආකෘති ;

(ඇ) ඇප දෙනු ලබන රක්ෂණකරුවකුට හෝ යම් තැනැත්තකුට හෝ තැනැත්තන් මණ්ඩලයකට 23 වන හෝ 24 වන වගන්තියේ කාර්ය සඳහා බලය දෙනු ලැබිය යුත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි, සහ නියම කරනු ලබන එම තැන්පතුවේ මුදල් ප්‍රමාණය සහ එම තැන්පතුව කරනු ලබන්නේ හා පවත්වනු ලබන්නේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා සහ එය කරනු ලබන හෝ තබනු ලබන ආකාරය ;

(ඈ) රක්ෂණ සහතික හෝ ඇප සහතික සඳහා ඉල්ලීම් හා ඒවා නිකුත් කිරීම ; ඒ සහතිකවල භාරකාරත්වය ඉදිරිපත් කිරීම ඒවා අවලංගු කිරීම හා අත්හිටුවීම සහ ඒ සහතිකවල අනුපිටපත් නිකුත් කිරීම ;

(ඉ) රක්ෂණකරුවන් විසින් සහ මේ කොටසේ කාර්ය සඳහා ඇප දෙනු ලබන තැනැත්තන් විසින් තබා ගත යුතු වාර්තා, සහ රක්ෂණකරුවන් විසින් සහ තැනැත්තන් විසින් කොමසාරිස්වරයා සහ බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයන් වෙත සැපයිය යුතු තොරතුරු ;

(ඊ) ශ්‍රී ලංකාවෙහි තාවකාලික ලෙස නැවතී සිටින ආගන්තුකයන් විසින් ශ්‍රී ලංකාවේ දී පාවිච්චි කරනු ලැබීම සඳහා ආනයනය කරන ලද මෝටර් වාහන සම්බන්ධයෙන් වන විට, ඒ විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා මේ කොටසේ විධිවිධාන කිසිවක් යොදා ගැනීම සහ ලිහිල් කිරීම ;

(උ) මේ වගන්තියෙහි නිශ්චිත වශයෙන් සඳහන් කාරණාවලට සම්බන්ධව හෝ ඊට ආනුෂංගික සියලු කාරණා ;

(ඌ) මේ කොටසේ සඳහන් ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඒවා බලාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු කාරණා.

## III වන කොටස

*පළාත තුළ මගී ප්‍රවාහන සේවය සහ භාණ්ඩ ප්‍රවාහනය විධිමත් කිරීම (පළාත තුළ මහා මාර්ගවල මෝටර් වාහන පාලනය කිරීම)*

රියදුරු බලපත්‍ර නොමැතිව ධාවනය කිරීම තහනම් කිරීම.

**45.** (1) (2) වන උපවගන්තියේ විධි විධානවලට යටත්ව —

(අ) යම් පන්තියක මෝටර් වාහනයක් සඳහා වලංගු බලදයී රියදුරු බලපත්‍රයක් දරන්නා නම් මිස, ඒ පන්තියේ මෝටර් වාහනයක් මහා මාර්ගයක ධාවනය කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය ; තවද

(ආ) මෝටර් වාහනයක් ධාවනය කිරීම පිණිස, සේවයෙහි නියුක්ත කරනු ලැබුවේ යම් තැනැත්තකු ද, ඒ තැනැත්තා හෝ අවසර දෙනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා හෝ යම් පන්තියක මෝටර් වාහන සඳහා වලංගු බලදයී රියදුරු බලපත්‍රයක් දරන්නා නම් මිස, ඒ පන්තියේ මෝටර් වාහනයක් මහා මාර්ගයක ධාවනය කිරීමට, කිසිම තැනැත්තකු විසින් වෙනත් යම් තැනැත්තකු සේවයෙහි නියුක්ත කිරීම හෝ වෙනත් යම් තැනැත්තකුට අවසර දීම හෝ නොකළ යුතු ය.

(2) යම් තැනැත්තකු රියදුරු බලපත්‍රයක් දරන්නා නොවුව ද මෝටර් වාහනයක් ධාවනය කිරීමට ඉගෙනීමේ හෝ අවසර දෙනු ලැබීමේ කාර්යය සඳහා —

(අ) ඔහු වයස අවුරුදු දහඅට සම්පූර්ණ කර ඇති අවස්ථාවක, මෝටර් ට්‍රයිසිකල්, වෑන් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන යම් මෝටර් වාහනයක් මහා මාර්ගයක ඔහු විසින් ධාවනය කරනු ලැබිය හැකි ය ; තවද

(ආ) ඔහු වයස අවුරුදු විසි එක සම්පූර්ණ කර ඇති අවස්ථාවක, මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් මහා මාර්ගයක ඔහු විසින් ධාවනය කරනු ලැබිය හැකි ය ;

එසේ වුවද සෑම විටම —

(i) ධාවනය කිරීමට ඉගෙන ගන්නා තැනැත්තා සහ ඔහුට උපදෙස් දෙන තැනැත්තා නොවන කිසිදු තැනැත්තකු සහ බඩු කිසිවක් අවස්ථාවෝචිත පරිදි, එවැනි යම් මෝටර් වාහනයක, මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක ගෙන යනු නොලැබිය යුතු ය ;

(ii) යම් පන්තියක මෝටර් වාහන සඳහා වලංගු බලදයී රියදුරු බලපත්‍රයක් දරන්නා ඔහුට උපදෙස් දීමේ කාර්යය සඳහා ඔහු කැටුව යා යුතු අතර, ඔහුගේ පාර්ශ්වයේ අසුනේ හෙන සිටිය යුතු ය.

(iii) වාහනයෙහි සවි කරනු ලැබූ එක් එක් හඳුනා ගැනීමේ තහඩුවට ඉහළින්, එවැනි යම් හඳුනා ගැනීමේ තහඩුවකට අවහිර නොවන ආකාරයකින් තිරස් රේඛාව සෙන්ටිමීටර් 18ක් ද, සිරස් රේඛාව සෙන්ටිමීටර් 13ක් සහ අකුරේ ඝනකම සෙන්ටිමීටර් 2ක් ද වන පරිදි රතු තීන්තෙන් පින්තාරු කරන ලද ඉංග්‍රීසි "එල්" අක්ෂරය දරන සුදු පුවරුවක් හෝ තහඩුවක් සවි කර තිබිය යුතු ය.

රියදුරු බලපත්‍රය රියදුරු විසින් ගෙන යා යුතු බව සහ ඊයම් කළ විට ඉදිරිපත් කළ යුතු බව.

**46.** (1) මෝටර් වාහනයක රියදුරු විසින්, තම රියදුරු බලපත්‍රය සෑම විටම තම සන්තකයෙහි හෝ මෝටර් වාහනයෙහි ගෙන යා යුතු අතර, පොලිස් නිලධරයකු විසින් කරන ලද ඉල්ලීමක් මත, බලපත්‍රය වහාම ඉදිරිපත් කළ යුතු අතර එය පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබිය යුතු ය ;

එසේ වුවද, කඩ කිරීම කරනු ලැබුවේ යයි කියනු ලබන අවස්ථාවේ දී තම බලපත්‍රයේ වලංගුභාවය දීර්ඝ කිරීම සඳහා අදාළ බලධාරියා වෙත ඉදිරිපත් කර ඇති බවට අධිකරණය තෘප්තිමත් වන පරිදි යම් තැනැත්තකු විසින් ඔප්පු කරනු ලැබුවහොත්, මේ උප වගන්තියේ විධිවිධාන ඔහු විසින් කඩ කරනු ලැබුවේ යයි සලකනු නොලැබිය යුතු ය.

(2) මේ පනතේ යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් හෝ මෝටර් වාහනයක් ධාවනය කිරීම සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ යම් වරදක් සම්බන්ධයෙන් හෝ චෝදනා කරනු ලැබූ සෑම රියදුරු බලපත්‍රයක් දරන්නකු විසින්, අධිකරණය වෙත බලපත්‍රය ගෙන යා යුතු අතර, වරද සම්බන්ධයෙන් ඔහු වරදකරු කරනු ලැබුවහොත්, 47 වන වගන්තිය යටතේ එහි සටහන් කිරීමේ කාර්යය සඳහා අධිකරණය වෙත බලපත්‍රය වහාම ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධි විධානවලට අනුකූලව රියදුරු බලපත්‍රයක් ඉදිරිපත් කරනු නොලබන අවස්ථාවක, අධිකරණය වෙත බලපත්‍රය ඉදිරිපත් කරනු ලබන තෙක්, මෝටර් වාහනයක් ධාවනය කිරීම සඳහා ඒ බලපත්‍රය දරන්නා නුසුදුස්සකු කරමින් අධිකරණය විසින් අඥාවක් කරනු ලැබිය හැකි ය.

(4) බලපත්‍රයක් දරන්නකු වන යම් තැනැත්තකු විසින් මෝටර් වාහනයක් ධාවනය කිරීම සම්බන්ධයෙන් සිදු කරනු ලැබුවේ යයි චෝදනා කරනු ලබන වරදක් පිළිබඳව පොලිස් නිලධරයකු විසින් කරන ලද යම් විමර්ශනයක දී ඒ පොලිස් නිලධරයා වෙත රියදුරු බලපත්‍රයක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී, ඒ පොලිස් නිලධරයා විසින් ඒ බලපත්‍රය තාවකාලිකව භාරගෙන නියමිත විස්තර දක්වෙන නියමිත ආකෘතියෙහි තම අත්සන යටතේ වූ අවසර පත්‍රයක් ඒ තැනැත්තාට නිකුත් කරනු ලැබිය හැකි ය.

(5) පොලිස් නිලධරයා විසින් අවසර පත්‍රයෙහි සඳහන් කරනු ලැබිය හැකි දින හතක් නොඉක්මවන කාලසීමාවක් සඳහා සහ ඔහුට චෝදනා කරනු ලැබුවේ යම් අධිකරණයක් ඉදිරියේ ද, ඒ අධිකරණය මගින් අවසර පත්‍රයෙහි සටහන් කිරීමෙන් සඳහන් කරනු ලැබිය හැකි තවදුරටත් වූ කාලසීමාවක් හෝ කාලසීමා සඳහා අවසර පත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකුටද, ඒ තැනැත්තාට තම සන්තකයේ රියදුරු බලපත්‍රයක් නොතිබුණේ වුවද, (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් මෝටර් වාහනයක් ධාවනය කිරීමට සෑහෙන තරම් බලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) (4) වන උපවගන්තිය යටතේ පොලිස් නිලධරයකු විසින් ගනු ලැබූ සෑම රියදුරු බලපත්‍රයක් ම—

(අ) එය දරන්නාට විරුද්ධව කිසිම චෝදනාවක් ඉදිරිපත් නොකළ යුතු බවට පසුව තීරණය කරනු ලබන අවස්ථාවක, ඒ තීරණය ගනු ලැබීමෙන් සතියක් ඇතුළත ඔහුට ආපසු භාර දෙනු ලැබිය යුතු ය; නැතහොත්

(ආ) චෝදනාවක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, අධිකරණය විසින් අවලංගු කරනු ලැබුවහොත් හෝ අත්හිටුවනු ලැබුවහොත් මිස, ඒ චෝදනාව සම්බන්ධයෙන් අවසාන වශයෙන් සුදුස්සක් කරනු ලැබීමෙන් පසුව සතියක් ඇතුළත ඔහුට ආපසු භාරදෙනු ලැබිය යුතු ය.

රියදුරු බලපත්‍ර අත්හිටුවීම හෝ අවලංගු කිරීම සහ බලපත්‍ර ලබාගැනීම සඳහා තැනැත්තන් නුසුදුස්සන් කිරීමේ බලය.

**47.** (1) මේ ප්‍රඥප්තිය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් හෝ මෝටර් වාහනයක් ධාවනය කිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් හෝ තැනැත්තකු වරදකරු කරනු ලැබුවේ යම් අධිකරණයක් ඉදිරියේ දී ද, ඒ අධිකරණය (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ඒ වරද සඳහා නීත්‍යනුකූලව නියම කරනු ලැබිය හැකි වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව—

(අ) වරදකරු කරනු ලැබූ තැනැත්තා රියදුරු බලපත්‍රයක් දරන්නකු නම් අවුරුදු දෙකක් නොඉක්මවන නියමිත කාල සීමාවක් සඳහා බලපත්‍රය අත්හිටුවනු ලැබිය හැකිය; නැතහොත් එය අවලංගු කරනු ලැබිය හැකි ය; නැතහොත්

(ආ) වරදකරු කරනු ලැබූ තැනැත්තා රියදුරු බලපත්‍රයක් දරන්නකු නොවන්නේ නම්, නියමිත කාල සීමාවක් සඳහා රියදුරු බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඔහු නුසුදුස්සකු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) 60 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල විධි විධාන කඩ කිරීමේ වරද සම්බන්ධයෙන් හෝ දණ්ඩ නීති සංග්‍රහයේ 272 වන වගන්තිය හෝ 328 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු මෝටර් වාහනයක් ධාවනය කිරීම සම්බන්ධයෙන් යම් වරදක් සම්බන්ධයෙන් හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකුගේ රියදුරු බලපත්‍රයෙහි 1938 අංක 45 දරන මෝටර් රථ ආඥාපනත යටතේ 1941 ජනවාරි මස 1 වන දිනට පසුව කරන ලද හෝ වැරදි දෙකකට නොඅඩු සහ වැරදි හතරකට නොවැඩි කලින් කරන ලද වැරදි සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තිය යටතේ කරන ලද හෝ 60 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධානවලට අනුරූප එවැනි යම් ප්‍රඥප්තියක විධිවිධාන කඩ කිරීමේ වරද සම්බන්ධයෙන් ඒ වරද කරනු ලැබූ වේලාවක පිටපත් කිරීමේ ඇතුළත් වන අවස්ථාවක, අධිකරණය විසින් ඒ බලපත්‍රය අවලංගු කරනු ලැබිය යුතු ය. නැතහොත් මාස හයකට නොඅඩු වන්නා වූ ද යම්කිසි ප්‍රකාශිත කාලසීමාවක් සඳහා බලපත්‍රය අත්හිටුවනු ලැබිය හැකි ය. තවද ඒ වරදකරු කරන වේලාවේ දී ඉහත කී වැරදි කිසිවක් සම්බන්ධයෙන් කලින් වරදකරු කිරීම් පහක් සම්බන්ධයෙන් එසේ කරන ලද පිටපත් පහක් බලපත්‍රයෙහි ඇතුළත් වන අවස්ථාවක, අධිකරණය විසින් බලපත්‍රය අවලංගු කරනු ලැබිය යුතු ය.

අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ ආඥාව බලපවත්නා කාලය තුළ මෝටර් වාහන ධාවනය තහනම් කිරීම.

**48.** යම් තැනැත්තකුගේ රියදුරු බලපත්‍රය අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ යම් ආඥාවක් හෝ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඒ තැනැත්තා නුසුදුස්සකු බවට ප්‍රකාශ කෙරෙන යම් ආඥාවක් බලපවත්නා යම් කාලයක් අතරතුර කිසිම තැනැත්තකු විසින්, පළාත තුළ මහා මාර්ගයක මෝටර් වාහනයක් ධාවනය නොකළ යුතු ය.

වේග සීමා.

**49.** (1) මෝටර් කෝච් රථයක් හෝ ලොරියක්—

(අ) නාගරික ප්‍රදේශයක් ඇතුළත යම් මහා මාර්ගයක පැයකට කිලෝ මීටර් තිස් දෙකකට වඩා අධික වේගයකින් ; හෝ

(ආ) නාගරික ප්‍රදේශයකට පිටතින් වූ යම් මහා මාර්ගයක පැයකට කිලෝ මීටර් පනස් හයකට වඩා අධික වේගයකින් ධාවනය නොකළ යුතු ය.

(2) ඉඩම් වාහනයක් කවර හෝ මාර්ගයක පැයකට කිලෝ මීටර් විසිහතරකට වඩා අධික වේගයකින් ධාවනය නොකළ යුතු ය ;

(3) මෝටර් ට්‍රයිසිකලයක් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් හෝ මහා මාර්ගයක පැයකට කිලෝ මීටර් තිස් දෙකකට වඩා අධික වේගයකින් ධාවනය නොකළ යුතු ය ;

(4) (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවලට අදාළ නොවන යම් පන්තියක හෝ විස්තරයක මෝටර් වාහනයක්—

(අ) නාගරික ප්‍රදේශයක් ඇතුළත යම් මහා මාර්ගයක පැයකට කිලෝ මීටර් පනස් හයකට වඩා අධික වේගයකින් ; හෝ

(ආ) නාගරික ප්‍රදේශයකට පිටතින් වූ යම් මහාමාර්ගයක පැයකට කිලෝ මීටර් හැත්තෑ දෙකකට වඩා වේගයකින් ධාවනය නොකළ යුතු ය.

යම් මෝටර් වාහනයක් ගිනි නිවන හමුදා, ගිලන් රථ හෝ පොලිස් කටයුතු සඳහා භාවිත කරනු ලබන අවස්ථාවක දී එම විධිවිධාන පිළිපැදීම එම අවස්ථාවේ දී වාහනය භාවිත කරනු ලැබුවේ යම් කාර්යයක් සඳහා ද, ඒ කාර්යය සඳහා වාහනය පැදවීම කිරීම අවහිර වීමට ඉඩ ඇති වන්නේ නම්, මෝටර් වාහන පිළිබඳ වේග සීමාවන් පනවනු ලබන ව්‍යවස්ථාපිත විධිවිධාන ඒ වාහනයට අදාළ නොවිය යුතු ය.

50. (1) සියලු මෝටර් වාහන සඳහා හෝ යම් නියමිත පන්තියක හෝ විස්තරයක මෝටර් වාහන සඳහා හෝ යම් නියමිත මෝටර් වාහන සඳහා හෝ 49 වන වගන්තියෙහි දක්වා ඇති වේග සීමාවලට වඩා අධික වේග සීමා හෝ ඒ වේග සීමා ඉක්මවන වේග සීමා නියම කරමින් සියලු මහාමාර්ග හෝ යම් නියමිත ප්‍රදේශයක මහාමාර්ග හෝ යම් නියමිත මහා මාර්ගයක හෝ මහා මාර්ගයක කොටස් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

49 වන වගන්තියෙහි දක්වා ඇති වේග සීමාවලට වෙනස් වේග සීමා පිළිබඳ නියෝග.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක අදාළ වන සෑම මෝටර් වාහනයක්, නියෝගය සාදනු ලැබුවේ යම් මහාමාර්ගයක් හෝ මහාමාර්ගයක කොටසක් සම්බන්ධයෙන් ද ඒ මහාමාර්ගයෙහි හෝ මහාමාර්ගයේ කොටසෙහි ඒ නියෝගයෙන් නියමිත සීමාව ඉක්මවන වේගයකින් ධාවනය කරනු නොලැබිය යුතු ය.

51. (අ) සියලු මෝටර් වාහන සඳහා හෝ යම් නියමිත පන්තියකට හෝ විස්තරයකට අයත් මෝටර් වාහන සඳහා හෝ යම් නියමිත මෝටර් වාහනයක් සඳහා හෝ 49 වන වගන්තියෙහි දක්වා ඇති වේග සීමාවන්ට වඩා දැඩි බැවින් අඩු වේග සීමා නියම කෙරෙන ; හෝ

වේග සීමාවලින් නිදහස් කිරීම සහ වේගසීමා ලිහිල් කිරීම.

(ආ) නියම කරනු ලබන යම් කොන්දේසිවලට යටත්ව, ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ යම් පළාත් සභාවකට හෝ යම් පළාත් පාලන ආයතනයකට අයත් හෝ පාලිතකර්ම ශ්‍රී ලංකා ආණ්ඩුවේ හෝ යම් පළාත් සභාවක, යම් පළාත් පාලන ආයතනයක සේවයෙහි නියුක්ත කරනු ලැබූ සියළු මෝටර් වාහන හෝ යම් නියමිත පන්තියකට හෝ විස්තරයකට අයත් මෝටර් වාහන හෝ නියමිත මෝටර් වාහනයක් නිදහස් කෙරෙන

සියලු මහා මාර්ග සම්බන්ධයෙන් හෝ යම් නියමිත ප්‍රදේශයක මහා මාර්ග සම්බන්ධයෙන් හෝ යම් නියමිත මහාමාර්ගයක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

52. (1) මහජනයාගේ ආරක්ෂාව හෝ පහසුව සඳහා හෝ යම් මහාමාර්ගයක හෝ යම් මහාමාර්ගයක ඇති යම් පාලමකට පීඩාවක් හෝ අධික ලෙස ගෙවියාමක් වැළැක්වීම සඳහා යම් තහනම් කිරීමක් පරිසීමා කිරීමක් හෝ පාලනය කිරීමක් අවශ්‍ය වන තාක් දුරට, සියලු මහාමාර්ගවල හෝ යම් නියමිත ප්‍රදේශයක ඇති මහාමාර්ගවල හෝ යම් නියමිත මහාමාර්ගයක හෝ එහි කොටසක සියලු මෝටර් වාහන පැදවීම කිරීම හෝ යම් නියමිත පන්තියකට හෝ විස්තරයකට අයත් මෝටර් වාහන පැදවීම කිරීම තහනම් කෙරෙන, පරිසීමා කෙරෙන හෝ පාලනය කෙරෙන නියෝග සාදනු ලැබිය හැකි ය.

මෝටර් වාහන පරිසීමා කිරීම සඳහා නියෝග.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් අදාළ වන යම් පංතියකට හෝ විස්තරයකට අයත් කිසිම මෝටර් වාහනයක් ඒ නියෝගය සාදනු ලැබුවේ යම් මහාමාර්ගයක් සම්බන්ධයෙන් ද ඒ නියෝගය කඩ කරමින් මහා මාර්ගයක පාවිච්චි කරනු නොලැබිය යුතු ය.

කොළඹින් පිටත මහා මාර්ගවල මෝටර් වාහන ගමනාගමනය සීමා කිරීම.

53. (1) (අ) (i) මෝටර් කෝච් රථ ; හෝ

(ii) මෙට්‍රික් ටොන් එකහමාරක් ඉක්මවන භාර බරක් ඇති ලොරි ; හෝ

(iii) ඇදුම් වාහන, ට්‍රේලර් හෝ රෝද සහිත මෝටර් වාහන ; හෝ

(iv) මෙට්‍රික් ටොන් දෙකයි කාලක් ඉක්මවන භාර බරක් ඇති වෙනත් යම් පංතියකට හෝ විස්තරයකට හෝ අයත් මෝටර් වාහන

පාවිච්චි කිරීම සඳහා සුදුසු කොළඹින් පිටත බස්නාහිර පළාත තුළ යම් නිශ්චිත මහාමාර්ගයක් සුදුසු බව ප්‍රකාශ කරමින් ; සහ

(ආ) ඒ මෝටර් වාහන ඒ මහාමාර්ගයේ පාවිච්චි කරනු ලැබිය හැක්කේ යම් කොන්දේසිවලට හෝ සීමා කිරීම්වලට යටත්ව ද ඒ කොන්දේසි හෝ සීමා කිරීම් නියම කරමින්

නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් පංතියකට හෝ විස්තරයකට අයත් මෝටර් වාහන කිසිවක් මගින් පාවිච්චි කිරීම සඳහා සුදුසු යයි, ඒ උපවගන්තිය යටතේ නියෝගයකින් හෝ එම නියෝගයෙන් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට හෝ සීමා කිරීම් වලට අනුකූල වන අකාරයකින් හෝ ඒ මහා මාර්ගය ප්‍රකාශ කරනු ලැබ ඇත්නම් මිස, එම පංතියට හෝ විස්තරයට අයත් මෝටර් වාහන කිසිවක් කොළඹින් පිටත පළාත තුළ යම් මහා මාර්ගයක පාවිච්චි කරනු නොලැබිය යුතු ය :

එසේ වුවද මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා හෝ බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා හෝ වාරිමාර්ග අධ්‍යක්ෂකවරයා හෝ බස්නාහිර පළාතේ පළාත් බද වාරිමාර්ග අධ්‍යක්ෂකවරයා හෝ පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයා හෝ සභාපතිවරයා අවස්ථාවෝචිත පරිදි එම සභාපතිවරයා එම අධ්‍යක්ෂවරයා, නගරාධිපතිවරයා හෝ සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙනු ලැබූ යම් නිලධාරියකු හෝ විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයකින් යම් මහා මාර්ගයක යම් වාහනයක් පාවිච්චි කිරීම —

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවට අයත්වන්නා වූ හෝ පළාත් සභාවකට අයත්වන්නා වූ හෝ තනිකරම ශ්‍රී ලංකා ආණ්ඩුවේ හෝ පළාත් සභාවේ ප්‍රයෝජනය සඳහා අදහස් කළ බඩු ගෙනයාමේ කාර්යය සඳහා ;

(ආ) ඒ මහා මාර්ගය එකම ප්‍රවේශ ක්‍රමය වන්නේ යම් ස්ථානයකට ද ඒ ස්ථානයේ බඩු හෝ ඒ ස්ථානයට ලී බඩු හෝ ගෘහ භාණ්ඩ ගෙන යාමේ කාර්යය සඳහා ;

(ඇ) එවැනි වාහන ගමනා ගමනයක් සඳහා සුදුසු බවට නියෝගයකින් ප්‍රකාශ කරන ලද වෙනත් යම් මහා මාර්ගයකට යාමේ කාර්යය සඳහා ;

(ඈ) පූජනීය ස්ථානවලට යෑමේ හෝ ඒ ස්ථානවලින් ආපසු පැමිණීමේ කාර්යය සඳහා ; හෝ

(ඉ) නියම කරනු ලබන වෙනත් යම් කාර්යයක් සඳහා

අවශ්‍යය යන හේතුව මත බලය දෙනු ලැබ ඇත්නම්, මහා මාර්ග සංවර්ධන අධිකාරිය හෝ බස්නාහිර පළාතේ මාර්ග සංවර්ධන අධිකාරිය හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුව පළාත් සභාවක වාරිමාර්ග දෙපාර්තමේන්තුව හෝ යම් පළාත් පාලන ආයතනයක් හෝ භාරයේ ඇත්තා වූ ද, එවැනි වාහන ගමනාගමනයක් සඳහා සුදුසු යයි එම වගන්තිය යටතේ නියෝගයකින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තා වූ ද (1) වන උපවගන්තියෙහි සඳහන් යම් පංතියකට හෝ විස්තරයකට අයත් යම් මෝටර් වාහනයක් කොළඹින් පිටත වූ යම් මහා මාර්ගයක පාවිච්චි කරනු ලැබිය හැකි ය.

**54.** වාහනයක හෝ මහා මාර්ගයක සිටින හෝ මහා මාර්ගය පාවිච්චි කරන යම් තැනැත්තකුට හෝ මහා මාර්ගයක තිබෙන හෝ ඊට යාබද යම් දේපලකට අනතුරක් සිදු නොවන බවට හෝ සිදුවීමට ඉඩ නොමැති බවට සියලු කාරණා සම්බන්ධයෙන් තත්ත්වයක් ඇත්නම් මිස, මෙම කොටසෙහි සඳහන් වන කිසිම මෝටර් වාහනයක් මහා මාර්ගයක පාවිච්චි කරනු නොලැබිය යුතු ය.

මෝටර් වාහනවල තත්ත්වය.

**55.** (1) යම් මහා මාර්ගයක් හෝ මාර්ගයක කොටසක් මෝටර් වාහන ගමනාගමනය සඳහා ප්‍රමාණවත් ලෙස විදි පහන් මගින් ආලෝකමත් කර ඇති බවට, අමාත්‍යවරයා සෑහීමට පත්වන අවස්ථාවක, දීප්තිය අඩු නොකළ ඉදිරි පහන් ඒ මාර්ගයෙහි හෝ මාර්ග කොටසෙහි පාවිච්චි කිරීම තහනම් කෙරෙන නියෝග සාදනු ලැබිය හැකි ය. තවද, නියම කරනු ලබන යම් ආකාරයකින් හෝ නියම කරනු ලබන යම් උපක්‍රමයකින් ඒ ඉදිරි පහනෙහි අධි දීප්තිය හොඳින් අඳුරු කර ඇත්නම් හෝ වළක්වනු ලැබ ඇත්නම් හෝ මිස එසේ නියෝග සාදා ඇත්තේ යම් මහා මාර්ගයක් හෝ මහා මාර්ගයක යම් කොටසක් සම්බන්ධයෙන් ද ඒ මහා මාර්ගයේ හෝ ඒ මහා මාර්ග කොටසේ විදි පහන් දල්වනු ලැබ ඇති තාක් කල් ආලෝක ධාරා ඉදිරියට විහිදෙන කිසිම ඉදිරි පහනක් මෝටර් වාහනයක පාවිච්චි කරනු නොලැබිය යුතු ය.

මෝටර් වාහනවල පහන් පිළිබඳ නියෝග.

**56.** (1) කිසිම තැනැත්තකු විසින් 57 වන වගන්තියේ විධිවිධාන කිසිවක් කඩ කරමින් පළාත තුළ මහා මාර්ගයක මෝටර් වාහනයක් ධාවනය නොකළ යුතු ය.

මෝටර් වාහන 57 වන වගන්තියට අනුකූලව ධාවනය කළ යුතු බව.

(2) 57 වන වගන්තියේ විධිවිධාන කිසිවක් කඩ කිරීම සඳහා මෝටර් වාහනයක රියැදුරකුට විරුද්ධව ඇතුළත් කරන ලද යම් චෝදනාවක් සම්බන්ධයෙන් ඔහු විසින් 62 වන වගන්තියේ විධි විධාන අනුව කටයුතු කර ඇති බව ඔප්පු කිරීම ඔහු වෙනුවෙන් ප්‍රමාණවත් විත්තිවාචකයක් නොවන්නේ ය.

**57.** (1) ධාවනය කරනු ලබන මෝටර් වාහනයක්, ඒ වාහනය වෙනත් රථ වාහන පසු කර යන විට හෝ දකුණට හරවන විට හෝ හැර මාර්ගයේ වම් පැත්තට හෝ ආසන්න පැත්තට ගෙන ධාවනය කරනු ලැබිය යුතු ය :

මාර්ග නීති.

එසේ වුවද, වෙන් කරන ලද සමාන්තර රථ ගමනාගමන තීර තුනක් හෝ වැඩි ගණනක් ඔස්සේ එකම දිශාවට රථ වාහන ගමනා ගමනය කිරීම සඳහා අවසර දී ඇති මහා මාර්ගයක, ඒ මාර්ගයේ මධ්‍යයට ආසන්නතම රථ ගමනාගමනය තීරය හැර, සමාන්තර රථ ගමනාගමනය තීර දෙකක් ඔස්සේ එකම දිශාවට වාහන ධාවනය කරනු ලැබිය හැකි ය :

එසේම තවදුරටත් සමාන්තර රථ ගමනාගමන තීරයක්හි ධාවනය කරනු ලබන වාහන වෙනත් රථ වාහනවලට බාධා සිදුවන ආකාරයකින් සිය සමාන්තර රථ ගමනා ගමන තීරයෙන් සිට වෙනත් සමාන්තර රථ ගමනාගමන තීරයකට ධාවනය කරනු නොලැබිය යුතු ය.

(2) වෙනත් වාහන විසින් පසු කර යන මෝටර් වාහනයක්, ඒ වෙනත් වාහනවලට එය පසු කර යාමට ඉඩ දෙන පරිදි ධාවනය කරනු ලැබිය යුතු ය.

(3) මෝටර් වාහනයක රියැදුරුට තමා ඉදිරියෙන් ඇති මාර්ගයේ පැහැදිලි හා බාධා රහිත දර්ශනයක් ඇත්නම් මිස, වෙනත් වාහන පසු කර යනු පිණිස මෝටර් වාහනය ධාවනය කරනු නොලැබිය යුතු ය.

(4) වෙනත් රථ වාහන පසු කර යන වාහනයක් ඒ වෙනත් රථ වාහනවලට දකුණු පැත්තෙන් දකුණට තැබුරුව යා යුතු ය :

එසේ වුව ද, වාහනයක් හෝ දක්කාගෙන යනු ලබන හෝ එළවාගෙන යනු ලබන සතකු හෝ, එම අවස්ථාවේ දී සියලු අවස්ථානුගත කරුණු අනුව සාධාරණ ලෙස පෙනෙන ආරක්ෂිත පැත්ත වන්නා වූ පැත්තෙන් මෝටර් වාහනයකට ඉක්මවා යා හැකි ය. නැතහොත් පසුකළ හැකි ය.

(5) විරුද්ධ දිශාවට ගමන් කරන යම් වාහනයකට බාධා වන යම් ආකාරයකින් එකම දිශාවට ගමන් කරන වෙනත් වාහනයක පැත්තෙන් මෝටර් වාහනයක් ධාවනය කිරීම හෝ එය පසුකර යාම නොකළ යුතු ය.

(6) මහා මාර්ගයේ ඇති යම් වාහනවලට අවහිර වන යම් ආකාරයකින් මහා මාර්ගයක් හරහා යනු පිණිස හෝ මහා මාර්ගයක් හරහා යාම ආරම්භ කරනු පිණිස හෝ මහා මාර්ගයක දී හරවනු පිණිස මෝටර් වාහනයක් ධාවනය නොකළ යුතු ය.

(7) මහා මාර්ගයක් නොවන යම් ස්ථානයක සිට මහා මාර්ගයකට හෝ මහා මාර්ගයක සිට මහා මාර්ගයක් නොවන යම් ස්ථානයකට ගමන් කරන මෝටර් වාහනයක් මහා මාර්ගයේ ඇති යම් වාහනයකට අවහිර වන යම් ආකාරයකින් ධාවනය නොකළ යුතු ය.


(8) යම් මහා මාර්ගයක සිට වෙනත් යම් මහා මාර්ගයකට ගමන් කරන මෝටර් වාහනයක් ඒ වෙනත් මහා මාර්ගයේ ඇති යම් වාහනයකට අවහිර වන යම් ආකාරයකින් ධාවනය නොකළ යුතු ය.

(9) මහා මාර්ග දෙකක් හෝ වැඩි ගණනක ඡේදනයේ දී ප්‍රධාන මාර්ගය ලෙස 59 වන වගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් ප්‍රකාශිත සහ අනවිනු ලබන මහා මාර්ගයේ ඇති යම් වාහනයකට අවහිර වන යම් ආකාරයකින් ධාවනය නොකළ යුතු ය.


(10) එකම වේලාවක දී විරුද්ධ දිශාවල සිට මහා මාර්ග දෙකක හෝ වැඩි ගණනක ඡේදනයට මෝටර් වාහන දෙකක් හෝ වැඩි ගණනක් ළඟාවන්නා වූ හෝ පැමිණෙන්නා වූ සහ ඡේදනයේ එකම කොටස මත්තේ ධාවනය කිරීමේ තම අදහස ඒවායේ රියැදුරන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් විසින් අඟවන්නා වූ අවස්ථාවක, එවිට පොලිස් නිලධාරියකු විසින් හෝ ආලෝක සංඥා මගින් හෝ 59 වන වගන්තිය යටතේ දැන්වීම් මගින් හෝ ඒ ඡේදනයෙහි වාහන පාලනය කරනු නොලබන්නේ නම්, දකුණු පැත්තෙන් හෝ එයා පැත්තෙන් පැමිණෙන වෙනත් යම් මෝටර් වාහනයක් එම ස්ථානය පසු කර යන තෙක් ඡේදන ප්‍රදේශයේ ඒ කොටස මත්තේ කිසිම මෝටර් වාහනයක් ධාවනය නොකළ යුතු ය.

(11) පටු මහා මාර්ගයක දී මෝටර් වාහන දෙකක් හෝ වැඩි ගණනක් එකිනෙකා වෙත ළඟාවන අවස්ථාවක, මහා මාර්ගයේ ඇති වෙනත් වාහනවලට හෝ වෙනත් යම් වාහනයකට නිරුපද්‍රිතව ගමන් කිරීමට ඉඩ දීමේ කාර්යය සඳහා ඒ එක් එක් වාහනයේ ගමන් වේගය අඩු කිරීමට සැලැස්විය යුතු ය.

(12) රථසංචාරයෙහි නිරත පොලිස් නිලධාරියකු විසින් අන්‍යාකාරයකින් විධාන කරනු ලැබුවහොත් මිස, යම් මහා මාර්ගයක සිට වෙනත් යම් මහා මාර්ගයක වමට හරවන මෝටර් වාහනයක් පහත දැක්වෙන රූප සටහනෙහි දක්වා ඇති ආකාරයෙන් මහා මාර්ගයෙහි වම් අයිනට හැකිතාක් ආසන්නව තබා ගත යුතු ය.



(13) යම් මහා මාර්ගයක සිට, වෙනත් යම් මහා මාර්ගයකට දකුණට හරවන මෝටර් වාහනයක් පළමුවෙන් ධාවනය කිරීමෙන්, පැදවීමෙන් හෝ තල්ලු කිරීමෙන් හෝ මාර්ගයේ මැදට හැකිතාක් සමීපතර වන ලෙස හැසිරවීම සඳහා තත්ත්වයකට පත් කළ යුතු ය. ඒ වේලාවේදීම රියදුරු විසින් දකුණට හැරවීමේ තම අදහස සංඥා කළ යුතු ය. මහා මාර්ග දෙකෙහි ඡේදනයේ මැදට ආසන්න විය යුතු හැරවීමේ ලක්ෂ්‍යයට ළඟා වූ විට, ඉදිරියෙන් පැමිණෙන්නා වූ රථ වාහනවලින් තම ධාවන මඟ පැහැදිලි බව නිශ්චය කරගෙන ඒ වෙනත් මහා මාර්ගයේ දකුණට හැරවීමෙන් හැසිරවීම සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු ය.




(14) යම් ස්ථානයක සිට මහා මාර්ගයකට සහ මෝටර් වාහනයක් හැරවීම සඳහා ඉරිපාට කර ඇති තැනක ඒ මහා මාර්ගයට ඇතුළුවීමට පෙර නවත්වනු ලැබිය යුතු ය.

අනතුරු වැලැක්වීම රියැදුරකුගේ සාමාන්‍ය යුතුකම් බව.

**58.** (1) 57 වන වගන්තියෙහි කුමක් සඳහන්ව ඇත ද යම් අනතුරක් වැලැක්වීමට අවශ්‍ය වන යම් ක්‍රියා මාර්ගයක් ගැනීම මහා මාර්ගයක් ඇති සෑම මෝටර් වාහනයක රියැදුරකුගේ යුතුකම වන්නේ ය.

(2) මහා මාර්ගයක ඇති යම් මෝටර් වාහනයක රියැදුරු විසින් 57 වන වගන්තියේ විධිවිධාන කිසිවක් කඩ කිරීම, ඒ අවස්ථාවේ දී මහා මාර්ගයේ වෙනත් යම් මෝටර් වාහනයක රියැදුරකු වෙත (1) වන උප වගන්තියෙන් නියම කර ඇති යුතුකම සම්බන්ධයෙන් වූ යම් කඩකිරීමකින් ඔහු නිදහස් කරනු ලබන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

ප්‍රධාන මාර්ග ප්‍රකාශ කිරීම.

**59.** (1) ඡේදනය වන මහා මාර්ග දෙකකින් හෝ වැඩි ගණනකින් කිනම් මහා මාර්ගය ප්‍රධාන මාර්ගය ලෙස සලකනු ලැබිය යුතු දැයි ප්‍රකාශ කෙරෙන නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) නියම කරනු ලබන ආකෘතියෙහි වූ සංඥා දැක්වීම් මහා මාර්ගය සඳහා වගකිවයුතු බලධරයා විසින් මේ වගන්තිය යටතේ ප්‍රකාශ කරන ලද එක් එක් ප්‍රධාන මාර්ගය දැක්වීමේ කාර්ය සඳහා ඡේදනය වන මහා මාර්ගවල සුදුසු ස්ථානයන්හි ප්‍රදර්ශනය කොට පවත්වා ගෙන යා යුතු ය.

මත්පැන් හෝ මත් ද්‍රව්‍ය ගැනීමෙන් රිය පැදවීම අපරීක්ෂාකාරීව හෝ නොසැලකිලිමත් ලෙස රිය පැදවීම.

**60.** (1) මත් පැන් හෝ මත් ද්‍රව්‍ය කිසිවක් ගැනීමෙන් පසු කිසිම තැනැත්තකු විසින් මහා මාර්ගයක වාහනයක් පැදවීම නොකළ යුතු ය.

(1අ) කිසිම තැනැත්තකු විසින් මත් පැන් හෝ මත් ද්‍රව්‍ය කිසිවක් ගැනීමෙන් පසුව ගාස්තුවක් හෝ කුලියක් සඳහා තැනැත්තන් ගෙන යාමට අදහස් කොට ඇති යම් බස්රථයක් හෝ වෙනත් යම් මෝටර් වාහනයක් මහා මාර්ගයක පැදවීම නොකළ යුතු ය.

(1ආ) මත් පැන් හෝ මත් ද්‍රව්‍ය කිසිවක් ගැනීමෙන් පසුව මහා මාර්ගයක මෝටර් වාහනයක් පදවා ඒ මගින් යම් තැනැත්තකුට මරණය හෝ තුවාල සිදු කරන යම් තැනැත්තකු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(1ඇ) (අ) මහා මාර්ගයක මෝටර් වාහනයක රියැදුරු මත් පැන් ගෙන ඇති බවට පොලිස් නිලධරයකු විසින් සැක කරනු ලබන අවස්ථාවක, මත් පැන් පානය කොට ඇත්තේද යන වගට ප්‍රශ්වාස පරීක්ෂණයකට හෝ ඒ තැනැත්තා මත් පැන් ගෙන ඇත්තේ දැයි නිශ්චය කිරීම සඳහා ආණ්ඩුවේ හෝ පළාත් සභාවේ වෛද්‍ය නිලධරයකු විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට හෝ වහාම භාජනය වන ලෙස ඒ පොලිස් නිලධරයා විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි අතර, ඒ තැනැත්තා විසින් අවස්ථාවෝචිත පරිදි එවැනි යම් නියමයකට අනුව ක්‍රියා කළ යුතු ය.

(ආ) ඒ තැනැත්තා මත් පැන් ගෙන ඇති බව මත් පැන් ප්‍රශ්වාස පරීක්ෂණයෙන් හෝ ආණ්ඩුවේ හෝ පළාත් සභාවේ වෛද්‍ය නිලධරයකු විසින් පවත්වනු ලබන පරීක්ෂණයකින් හෙළිවන්නා වූ අවස්ථාවක හෝ එවැනි යම් පරීක්ෂණයකට භාජනයවීමට ඒ තැනැත්තා ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ අවස්ථාවක පටහැනිව සාක්ෂි ඉදිරිපත් කර ඇත්නම් මිස, ඒ තැනැත්තා මත් පැන් ගෙන ඇති බව පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.

(ඇ) මහා මාර්ගයක මෝටර් වාහනයක රියැදුරු මත් පැන් හෝ මත් ද්‍රව්‍ය කිසිවක් ගෙන ඇති බවට පොලිස් නිලධරයකු විසින් සැක කරනු ලබන අවස්ථාවක, පරීක්ෂා කරනු ලැබීම සඳහා ඒ තැනැත්තා ආණ්ඩුවේ හෝ පළාත් සභාවේ වෛද්‍ය නිලධරයකු වෙත පොලිස් නිලධරයා විසින් ඉදිරිපත් කරනු ලැබීම නීත්‍යනුකූල විය යුතු අතර, ඒ තැනැත්තා ඒ නියමයට අනුව ක්‍රියා කළ යුතු ය.

(ඇ) මහා මාර්ගයක මෝටර් වාහනයක රියදුරු මත් පැන් හෝ මත් ද්‍රව්‍ය කිසිවක් ගෙන ඇති බවට වූ ආණ්ඩුවේ හෝ පළාත් සභාවේ වෛද්‍ය නිලධාරියකුගේ වාර්තාව, පටහැණිව සාක්ෂි ඉදිරිපත් කර ඇත්නම් මිස ඒ තැනැත්තා මත් පැන් හෝ මත් ද්‍රව්‍ය කිසිවක් ගෙන ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි විය යුතු ය.

(ඈ) ආණ්ඩුවේ හෝ පළාත් සභාවේ වෛද්‍ය නිලධාරියකු විසින් කරනු ලබන එවැනි යම් පරීක්ෂණයකට භාජනයවීම ඒ තැනැත්තා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, පටහැණිව සාක්ෂි ඉදිරිපත් කර ඇත්නම් මිස, මත් පැන් හෝ මත් ද්‍රව්‍ය ගැනීමෙන් පසුව ඔහු රිය පදවමින් සිටි බවට පූර්ව නිගමනය කළ යුතු ය.

(1ඇඇ) මේ වගන්තිය යටතේ යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලැබූ බව විශ්වාස කිරීම සඳහා පොලිස් නිලධාරියකුට සාධාරණ හේතු ඇති අවස්ථාවක ඔහු විසින් ඒ තැනැත්තා වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගනු ලැබිය හැකි ය. එසේ වුවද, ඒ පොලිස් නිලධාරියා විසින්, එසේ සිරභාරයට ගනු ලැබූ තැනැත්තා, පොලිස් පරීක්ෂකයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධාරියකු වෙත හැකිතාක් ඉක්මනින් ඉදිරිපත් කළ යුතු අතර, අවස්ථානුගත කරුණු අනුව, ඒ සිරභාරයට ගැනීම යුක්ති සහගත ද නැද්ද යන්න සහ සිරභාරයට ගනු ලැබූ තැනැත්තා, තත් කාර්යය සඳහා සාදනු ලැබූ රීතිවලට අනුකූලව, වෛද්‍ය පරීක්ෂණයට භාජනය කිරීමට අවශ්‍ය වේද යන්න ඒ උසස් පොලිස් නිලධාරියා විසින් තීරණය කළ යුතු ය.

(1ඉ) (i) මත්පැන් ප්‍රශ්වාස පරීක්ෂණ පැවැත්විය යුතු ක්‍රමය සහ ආකාරය ද ;

(ii) තැනැත්තකු මත් පැන් ගෙන ඇතැයි සලකනු ලැබිය යුත්තේ ඒ තැනැත්තාගේ රුධිරයෙහි යම් ප්‍රමාණයක හෝ ප්‍රමාණයක් ඉක්මවන මද්‍යසාර සාන්ද්‍රණයක් තිබුණහොත් ද ඒ ප්‍රමාණය ද ;

(iii) මෝටර් වාහනයක රියදුරකු මත් පැන් හෝ මත් ද්‍රව්‍ය කිසිවක් ගෙන තිබේද යන්න නිශ්චය කිරීම සඳහා යම් පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකි ක්‍රමය සහ ආකාරය ද ;

(iv) තැනැත්තකු මත්ද්‍රව්‍ය කිසිවක් ගෙන ඇතැයි සලකනු ලැබිය යුත්තේ ඒ තැනැත්තාගේ රුධිරයෙහි යම් ප්‍රමාණයක හෝ යම් ප්‍රමාණයක් ඉක්මවන මත් ද්‍රව්‍ය සාන්ද්‍රණයක් තිබුණහොත් ද ඒ ප්‍රමාණය ද ;

නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) කිසිම තැනැත්තකු විසින්, අපරීක්ෂාකාරීව හෝ අන්තරාදායක ආකාරයකින් හෝ අන්තරාදායක වේගයකින් මහා මාර්ගයක මෝටර් වාහනයක් ධාවනය නොකළ යුතු ය.

(3) මහා මාර්ගය පාවිච්චි කරන වෙනත් තැනැත්තන් කෙරෙහි නොසැලකිලිමත් හෝ යුක්ති සහගත සැලකිල්ලක් නොමැතිව කිසිම තැනැත්තකු විසින් මහා මාර්ගයක මෝටර් වාහනයක් ධාවනය නොකළ යුතු ය.

මෝටර් වාහන ධාවනය කරන විට රියදුරුගේ තත්ත්වය.

61. (1) වාහනයේ සම්පූර්ණ පාලනය තමාට නොමැති හෝ සම්පූර්ණ පාලනය තබා ගැනීමට තමාට නොහැකි තත්ත්වයක සිටින විට හෝ මහා මාර්ගයේ සහ මෝටර් වාහනයට ඉදිරියෙන් වූ වාහන සම්බන්ධයෙන් සම්පූර්ණ සහ බාධා රහිත දර්ශනයක් තමාට නොමැති හෝ ලබා ගැනීමට තමාට නොහැකි තත්ත්වයක සිටින විට කිසිම තැනැත්තකු විසින්, මහා මාර්ගයක මෝටර් වාහනයක් ධාවනය නොකළ යුතු ය.

(2) මහා මාර්ගයේ දර්ශනයට සහ මෝටර් වාහනයට ඉදිරියෙන් වූ වාහනවල දර්ශනයට අවහිර කරන හෝ අවහිර කිරීමට ඉඩ ඇති තැනකොත් වාහනය පැදවීමට හෝ පාලනය කිරීමට බාධා කරවන හෝ බාධා කිරීමට ඉඩ ඇති යම් තත්ත්වයකින් තමාගේ පැත්තකින් අසුන් ගැනීමට මහා මාර්ගයක ඇති මෝටර් වාහනයක රියැදුරු විසින් කිසිම තැනැත්තකුට අවසර නොදිය යුතු ය.

(3) වාහනය පදවනු ලබන්නේ දකුණු අත පැත්තෙන් නම් හෝ එකී එක පැත්තෙන් නම්, රියැදුරු ගේ ආසනයේ දකුණු අත පැත්තෙහි තැනකොත් වාහනය පදවනු ලබන්නේ වම් අත පැත්තෙන් නම් හෝ එකී ආසන්න පැත්තෙන් නම් රියැදුරුගේ ආසනයේ වම් අත පැත්තෙහි යම් තැනැත්තකුට අසුන් ගැනීමට හෝ සිට ගෙන සිටීමට මෝටර් වාහනයක රියැදුරු විසින් අවසර නොදිය යුතු ය.

(4) මෝටර් වාහනයක රියැදුරු හෝ එය පදවන්නා ගියර් මාරු කිරීමේ දී හෝ අවශ්‍ය හස්ත සංඥා දීමේ දී හෝ වාහනයේ අත්‍යවශ්‍ය පාලන උපකරණ හැසිරවීමේ දී හෝ හැර සෑම විටම අවස්ථාවෝචිත පරිදි, සුක්කානම මත හෝ සුක්කානමේ දණ්ඩ මත තමාගේ දෑතම තබා ගත යුතු ය.

රියැදුරන් විසින් දිය යුතු සංඥා

62. (1) මෝටර් වාහනවල රියැදුරන් විසින් දෙනු ලබන සංඥා —

(අ) දිවා සහ රාත්‍රී දෙකෙහිම ප්‍රදීපනය කළ යුතු විද්‍යුත්යාන්ත්‍රික උපක්‍රමයකින් ක්‍රියාත්මක කළ යුතු ය. ඒ ප්‍රදීපනය සවිරාම විය යුතු අතර, වාහනය ඉදිරියෙන් සහ පිටුපසින් ද පැහැදිලිව දෘශ්‍යමාන විය යුතු ය. මේ ආලෝක සංඥා සහ වර්ණයෙන් විය යුතු ය. (නැතහොත් කොමසාරිස්වරයාගේ ප්‍රකාශිත බලය අනුව සුදු වර්ණයෙන් විය යුතු ය)

(ආ) ඉදිරියට යෑමට සංඥා කිරීමට අදහස් කරන විට, ප්‍රධාන පහන් දැල්වීමෙන් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) 1 වන උපවගන්තියෙහි සඳහන් ආලෝක හැරෙන්නට වෙනත් සවිරාම වූ හෝ ජීවලන රටාවකින් යුත් ආලෝකයක් වාහනයක තිබෙන හෝ ඇතුළත හෝ පාවිච්චි නොකළ යුතු ය.

(3) 1 වන උපවගන්තියෙහි දක්වා ඇති සංඥා ක්‍රමය බලාපොරොත්තු රහිතව අක්‍රියකාරී වුවහොත්, මේ ප්‍රඥප්තිය යටතේ වූ නියෝගවලින් නියම කොට ඇති හස්ත සංඥා තාවකාලිකව යොදා ගත යුතු ය.

(4) විද්‍යුත්මකව ක්‍රියාත්මක වන සංඥා නොමැති වාහනයක රියැදුරු වමට හැරීමට හෝ සිය ගමන් මඟ වම් පැත්තට වෙනස් කිරීමට හෝ ප්‍රාර්ථනයෙන්, තම දකුණු බාහුව සහ හස්තය, මෝටර් වාහනයේ දකුණු පැත්තෙන් අත්ල ඉදිරි දෙසට හරවා තිරස් ලෙස සිටිනට දිගු කර, උරහිසෙහි සිට තම බාහුව ප්‍රති දක්ෂිණාවර්තව කරකැවිය යුතු ය. විද්‍යුත්මකව ක්‍රියා කරන වාහනවල වම් පැත්තේ සංඥා දර්ශකය ක්‍රියාත්මක කිරීමෙන් මෙම සංඥා දැක්විය හැකි ය.

(5) මෝටර් වාහනයක රියැදුරු විසින්, සුදුසු යයි තමා අදහස් කරන්නේ නම් —

(අ) ඉස්සර කරන වාහනයකට, එසේ කිරීමට තැත් නොකරන සේ සංඥා කිරීම සඳහා, තම දකුණු බාහුව සහ හස්තය මෝටර් වාහනයේ දකුණු පැත්තෙන් හෝ දකුණට හැකිවුරු පැත්තෙන් අත්ල පහතට තිබෙන සේ තිරස්ව සිටිනට දිගු කර, තම බාහුව ඉහළට සහ පහළට වැනිය යුතු ය.

(ආ) ඉස්සර කරන වාහනයකට තමා පසු කොට යැමට සංඥා කිරීම සඳහා අත්ල ඉදිරි දෙසට සිටින සේ තම දකුණු බාහුව සහ හස්තය, උරහිසෙහි සිට වාහනයෙහි දකුණු පැත්තෙන් හෝ දකුණට හැඹුරු පැත්තෙන් පිටතට දික් කර බාහුව පිටුපසට සහ ඉදිරිපසට වැනීම හෝ විදුලි සංඥා ක්‍රියාත්මක කරන්නේ නම් එම අංශයේ සංඥා දර්ශනය ක්‍රියාත්මක කළ යුතු ය.

(6) මහා මාර්ග දෙකක් හෝ වැඩි ගණනක ඡේදනයක දී සේවයෙහි යෙදී සිටින පොලිස් නිලධරයකු වෙත ළඟා වන විට, මෝටර් වාහනයක රියැදුරු විසින් පොලිස් නිලධරයාට පෙනෙන පරිදි තමා යැමට අදහස් කරන දිශාවට තම බාහුව දික් කළ යුතු ය. නැතහොත් අදාළ විදුලි සංඥා ක්‍රියාත්මක කළ යුතු ය.

(7) 1 වන, 2 වන, 3 වන, 4 වන, 5 වන, සහ 6 වන උපවගන්තිවල සඳහන් සංඥා හැර වෙනත් යම් සංඥා භාවිත කිරීම නියම කරමින් හෝ ඊට බලය දෙමින් නියෝග සෑදිය හැකි ය.

63. යම් මෝටර් වාහනයක් නැවැත්වීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් යුක්ති සහගත කාර්යයක් සඳහා මහා මාර්ගයක දී අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි දුරක් සඳහා රියැදුරු විසින් වාහනය පස්සට ගැනීම නොකළ යුතු ය ; නැතහොත් ආපස්සට ගමන් කිරීමට අවසර නොදිය යුතු ය. මෝටර් වාහන පස්සට ගැනීම

64. (1) මහා මාර්ගයක වූ මෝටර් වාහනයක රියැදුරු විසින් මෝටර් වාහනයේ ළඟාවීම හෝ පිහිටීම පිළිබඳව ප්‍රමාණවත් දැනුම් දීමක්, ආරක්ෂාව අරභයා අවශ්‍ය වන තවර වූ හෝ අවස්ථාවක කාර්යක්ෂම උපකරණයක් ශබ්ද කිරීමෙන් හෝ ප්‍රධාන පහන්වල ආලෝකධාරා අවපාතනය කර දැල්වීමෙන් හෝ දිය යුතු ය. එසේ වුවද, මෝටර් වාහනයක් මහා මාර්ගයක නවතා තබා ඇති අවස්ථාවක, හදිසි අනතුරක් වැළැක්වීම සඳහා හෝ වාහනයේ හෝ එහි සිටින අයගේ ආරක්ෂාව සඳහා හෝ හැර, එම වාහනයට සවි කර ඇති සංඥා දීමේ උපකරණයක් ක්‍රියාත්මක නොකළ යුතු ය. ශබ්ද හෝ ආලෝක සංඥා

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා තනි ස්වරයක් නඩවන නලාවක් හැර, සීනු විස්ල් නඩක් හෝ නලා නඩක් නාගරික ප්‍රදේශයක සීමා ඇතුළත වූ යම් මහා මාර්ගයක ඇති යම් මෝටර් වාහනයකින් ශබ්ද කරනු නොලැබිය යුතු ය.

(3) දවසේ නියමිත යම් වේලාවක් තුළ, යම් නාගරික ප්‍රදේශයක් තුළ හෝ එහි නියමිත කොටසක් තුළ හෝ සංඥා දීමේ සියලුම උපකරණ නැතහොත් යම් නියමිත උපකරණයක් පාවිච්චි කිරීම, (1) වන උපවගන්තියේ කාර්ය සඳහා පාලනය කිරීම හෝ සීමා කිරීම හෝ පිණිස නියෝග සාදනු ලැබිය හැකි ය.

(4) යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් (3) වන උපවගන්තිය යටතේ යම් නියෝග සාදා ඇති අවස්ථාවක, (1) උපවගන්තියේ විධිවිධානවලට කුමක් සඳහන්ව ඇත ද, කිසිදු තැනැත්තකු විසින් ඒ ප්‍රදේශය තුළ එම නියෝග කඩ කරමින් යම් සංඥා දීමේ උපකරණයක් පාවිච්චි නොකළ යුතු ය.

65. මහා මාර්ගයක යම් මෝටර් වාහනයක රියැදුරු විසින්, හෝ බස් රථයක් සම්බන්ධයෙන් වන විට, එහි කොන්දොස්තර විසින් හෝ පාපුවරුවල ගමන් කිරීමට කිසිම තැනැත්තකුට අවසර නොදිය යුතු ය. තවද, නිසි ලෙස ඉදි කරන ලද ආසනයක් මත හැර, නැතහොත් අලුත්වැඩියා කරනු ලබන විට හෝ ඉන් පසුව වාහනය පරීක්ෂා කිරීමේ කාර්ය සඳහා හැර, කිසිම තැනැත්තකු විසින් පාපුවරුවල මඩවරණ මත, විළක්කය මත හෝ මෝටර් වාහනයේ පිටත කිසිම තැනැත්තකු නොයා යුතු ය. මෝටර් වාහනවල පාපුවරු ආදියෙහි ගමන් කිරීම

මෝටර් රථවල ඉදිරි අසුන්වල සිටින තැනැත්තන් සංඛ්‍යාව හා මෝටර් සයිකල්වල පසු ආසනයේ ගමන් කිරීම.

**65අ.** මගීන්ගේ ප්‍රයෝජනය සඳහා සලසා ඇති ආසනයක හෝ තනි තට්ටුවේ බස් රථයක ආසන පේළි දෙක අතර සලසා ඇති අන්තර මාර්ගයෙහි හෝ තට්ටු දෙකේ බස් රථයක පහළ තට්ටුවේ ආසන පේළි දෙක අතර සලසා ඇති අන්තර මාර්ගයෙහි හැර, මහා මාර්ගයක ඇති බස් රථයක කිසිම කොන්දොස්තරවරයකු විසින් යම් මගියකුට ගමන් කිරීමට අවසර නොදිය යුතු අතර, කිසිම මගියකු එලෙස ගමන් නොකළ යුතු ය.

බස් රථවල ගමන් කිරීම.

**66.** (1) මහා මාර්ගයක ඇති මෝටර් රථයක අයිතිකරු හෝ රියැදුරු විසින් ඒ මෝටර් රථයේ ඉදිරිපස ආසනයේ රියැදුරුට අතිරේකව තැනැත්තන් දෙදෙනකුට වැඩි ගණනකට යෑමට සැලැස්වීම හෝ අවසර දීම හෝ නොකළ යුතු ය.

(2) පැති රථයක් අනුයුක්ත කර නොමැති මෝටර් සයිකලයක රියැදුරකු විසින්, එය මහා මාර්ගයක පාවිච්චි කරනු ලබන විට, එක් තැනැත්තකුට වැඩි ගණනක් එහි නොගෙන යා යුතු අතර, රියැදුරුගේ ආසනය පිටුපස ඊට සුරක්ෂිත ලෙස සවි කරන ලද ආසනයක සයිකලයේ දෙපසට පාද විහිදා වාඩි වී සිටින ආකාරයෙන් හැර අන්‍ය ආකාරයකින් ඒ තැනැත්තා නොගෙන යා යුතු ය.

(3) මෝටර් සයිකලයක් පදවන හෝ මෝටර් සයිකලයක නැඟී යන සෑම තැනැත්තෙක්ම අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වර්ගයකට අයත් ආරක්ෂණ හිස් වැස්මක් සුරක්ෂිත ලෙස තමාගේ හිසෙහි පැළඳ සිටිය යුතු ය.

(4) මෝටර් සයිකලයක් පදවන තැනැත්තා (3) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වර්ගයකට අයත් ආරක්ෂණ හිස් වැස්මක් පැළඳ නොසිටින වෙනත් යම් තැනැත්තකු තම මෝටර් සයිකලයෙහි රැගෙන යන අවස්ථාවක, පදවන තැනැත්තා සහ ඒ තැනැත්තා යන දෙදෙනාම මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරුවන් විය යුතු ය.

ප්‍රචාරක දැන්වීම ආදිය බෙදා හැරීම.

**67.** මහා මාර්ගයක මෝටර් වාහනයක් ගමන් කරන අතරතුර එම වාහනයෙන් යම් ප්‍රචාරක දැන්වීමක්, පත්‍රිකාවක් හෝ අනු පත්‍රිකාවක් බෙදා හැරීමට ඒ මෝටර් වාහනයේ රියැදුරු විසින් යම් තැනැත්තකුට අවසර දෙනු නොලැබිය යුතු අතර, මෝටර් වාහනයේ සිටින කිසිම තැනැත්තකු විසින් එලෙස බෙදා හැරීම නොකළ යුතු ය.

ශබ්ද විකාශන උපකරණ සහ ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කිරීම.

**68.** (1) මෝටර් වාහනයට සවි කරන ලද හෝ වාහනයේ ගෙන යනු ලබන ශබ්ද විකාශන යන්ත්‍ර සහිත යම් ශබ්ද විකාශන උපකරණ පාවිච්චි කිරීම හෝ යම් තැනැත්තකුට පාවිච්චි කිරීමට අවසර දීම හෝ ධාවනයේ යෙදෙන මෝටර් වාහනයක රියැදුරු විසින් නොකළ යුතු අතර, මෝටර් වාහනය තුළ සිටින කිසිම තැනැත්තකු විසින් එසේ නොකරනු ලැබිය යුතු ය.

එසේ වුව ද විකාශන උපකරණයෙන් නිකුත් වන ශබ්දයේ පරිමාව වාහනය ඇතුළතට සීමා කරනු ලැබ එහි සිටින්නන්ට පමණක් ඇසීම සඳහා අදහස් කරන ලද බව සහතික කිරීම විශේෂ විධිමත් කරනු ලැබ ඇත්නම්, ධාවනය වන මෝටර් වාහනයක ශබ්ද විකාශන යන්ත්‍රයක් පාවිච්චි කරනු ලැබිය හැකි ය.

(2) නාවික හමුදා, ගුවන් හමුදා හෝ පොලිස් කටයුතු සඳහා හෝ තැපැල් දෙපාර්තමේන්තුවේ හෝ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ හෝ ආණ්ඩුවේ වෙනත් යම් නියමිත දෙපාර්තමේන්තුවක හෝ පළාත් සභාවක හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක හෝ කාර්ය සඳහා නැතහොත් ලංකා සංචාරක මණ්ඩලය විසින් හෝ ප්‍රයෝජනයට ගනු

ලබන යම් මෝටර් වාහනයකට නැතහොත් සංචාරකයන් ගෙන යන යම් මෝටර් වාහනයකට ඒ මෝටර් වාහනයේ ශබ්ද විකාශන යන්ත්‍ර සහිත ශබ්ද විකාශන උපකරණ පාවිච්චි කිරීම සඳහා මිලය දෙමින් කොමසාරිස්වරයා විසින් අවසර පත්‍රයක් නිකුත් කර ඇත්නම්, මේ වගන්තිය අදාළ නොවිය යුතු ය.

69. මාර්ගයක් අළුත්වැඩියා කරනු ලබන සෑම අවස්ථාවක, මාර්ගය පාවිච්චි කරනු ලබන්නන්ගේ ආරක්ෂාව සඳහා දැනුම් දීමේ සංඥා, රාත්‍රී කාලයෙහි පහන් ප්‍රදර්ශනය කරනු ලැබීමට සැලැස්වීම, ඒ අළුත්වැඩියාවන් කරන හෝ ඒ අළුත්වැඩියාවන් කරනු ලැබීමට සලස්වන තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

මාර්ග අළුත්වැඩියාවන් කරනු ලබන සෑම අවස්ථාවක දැනුම් දීමේ සංඥා ප්‍රදර්ශනය කළ යුතු බව.

70. (1) මහා මාර්ගයක දී යම් මෝටර් වාහනයක් පාවිච්චි කිරීම හේතු කොටගෙන සිදු වූ යම් අනතුරකින් යම් තැනැත්තකුට, සතෙකුට හෝ දේපළකට යම් හානියක් සිදුවන අවස්ථාවක පහත දැක්වෙන විධිවිධාන බල සහිත විය යුතු ය :—

(අ) මෝටර් වාහනයේ රියැදුරු විසින් —

(i) වාහනය වහාම නතර කළ යුතු ය.

(ii) හානිය සිදු කරනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් හෝ හානිය සිදු කරනු ලැබුවේ යම් දේපළකට හෝ සතකුට ද ඒ දේපළෙහි හෝ සතාගේ අයිතිකරු විසින් හෝ ඒ දේපළ හෝ සතා භාරව සිටින තැනැත්තා විසින් හෝ යම් පොලිස් නිලධරයකු විසින් හෝ ග්‍රාම නිලධාරී විසින් හෝ ඉල්ලා සිටිනු ලැබුවහොත් තම නම සහ ලිපිනය, වාහනයේ අයිතිකරුගේ නම සහ ලිපිනය, වාහනය හඳුනා ගැනීමේ අංකය සහ ඊට අදාළ වෙනත් විස්තර සැපයිය යුතු ය.

(iii) හානිය සිදු කරනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් ඉල්ලා සිටින යම් අවස්ථාවක හෝ ඔහු විසඥව සිටී නම් හෝ ඒ තැනැත්තාට සිදු වූ හානිය ඔහුගේ ජීවිතයට අන්තරායදායක බව පෙනී ගියහොත්, ඒ තැනැත්තා වහාම ආරෝග්‍යශාලාවකට හෝ වෛද්‍ය වෘත්තිකයකු වෙත ගෙන යා යුතු අතර, ඉන් පසුව නොපමාව ආසන්නතම පොලිස් ස්ථානය භාර නිලධරයාට අනතුර පිළිබඳව වාර්තා කළ යුතු ය ; තවද

(iv) (iii) වන ඡේදයෙහි සඳහන් නොවන සෑම අවස්ථාවක දී ම නොපමාව ආසන්නතම පොලිස් ස්ථානය භාර නිලධරයාට අනතුර පිළිබඳව වාර්තා කළ යුතු ය.

(ආ) මෝටර් වාහනයේ අයිතිකරු විසින්, හදිසි අනතුර සිදු වූ අවස්ථාවේ දී තමා සිටියේ හෝ නොසිටියේ වුව ද යම් පොලිස් නිලධරයකු හෝ ග්‍රාම නිලධාරී විසින් ඉල්ලා සිටීමේ දී වාහනයේ රියැදුරාගේ සහ හදිසි අනතුර සිදුවන අවස්ථාවේ දී වාහනය තුළ සිටි සෑම තැනැත්තකුගේම නම, ලිපිනය, විස්තරය, පූර්ව ආ ගිය තැන් පිළිබඳව වූ තමා සන්තකයේ ඇති සියළු තොරතුරු සපයනු ලැබිය යුතු අතර, එවැනි යම් ඉල්ලීමක් ඉටු කිරීමේ දී තමාගේ දැනීමේ තරමට අසත්‍ය වූ හෝ යම් විස්තරයකින් නොමග යවන සුළු වූ යම් තොරතුරක් දෙන එවැනි සෑම අයිතිකරුවෙක්ම මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(ඇ) රියැදුරු හැර, අනතුර සිදු වූ වේලාවේ දී වාහනයේ සිටි සෑම තැනැත්තකු විසින් —

(i) හානිය සිදු කරනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් හෝ හානිය සිදු කරනු ලැබුවේ යම් දේපළකට හෝ සතකුට ද ඒ දේපළෙහි හෝ සතාගේ අයිතිකරු විසින් හෝ ඒ දේපළ හෝ සතා භාරව සිටින තැනැත්තා

විසින් හෝ යම් පොලිස් නිලධරයකු විසින් හෝ ග්‍රාම නිලධාරී විසින් හෝ ඉල්ලා සිටිනු ලැබුවහොත් තම නම සහ ලිපිනය සහ වාහනයේ රියැදුරුගේ අයිතිකරුගේ නම සහ ලිපිනයත් පිළිබඳව තමා සන්තකයෙහි ඇති සියලු තොරතුරු සැපයිය යුතු ය ; නැතහොත්

(ii) තමාගේ නම සහ ලිපිනය සහ අනතුර සිදු වූ වේලාවේ දී තමා වාහනයේ සිටි බව අනතුර සිදු වී පැය විසි හතරක් ඇතුළත පොලිස් ස්ථානයක් භාර නිලධරයාට දැන්විය යුතු ය.

(2) මහා මාර්ගයක මෝටර් වාහනයක් පාවිච්චි කිරීම හේතු කොටගෙන සිදු වූ යම් අනතුරකින් යම් තැනැත්තකුට යම් පීඩාවක් සිදුවන්නා වූ සහ පොලිස් නිලධරයකු විසින් හෝ ග්‍රාම නිලධාරී විසින් හෝ පීඩාවට පත් තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් හෝ ඉල්ලා සිටිනු ලැබූ විට ඒ වාහනයට අදාළ රක්ෂණ සහතිකය හෝ ඇප සහතිකය ඒ වේලාවේ දී ඉදිරිපත් කරනු නොලබන්නා වූ අවස්ථාවක—

(අ) රියැදුරු විසින්, හැකි ඉක්මණින්, සහ කවර හෝ හේතුවක් වුව ද අනතුර සිදු වී පැය විසි හතරක් ඇතුළත පරීක්ෂා කිරීම සඳහා ඒ සහතිකය අසන්නතම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කළ යුතු ය :

එසේ වුවද සහතිකය ඉදිරිපත් කිරීමට ඒ තැනැත්තාට එසේ නියම කරනු ලැබුවේ යම් දිනයක ද ඒ දින සිට දින හයක කාලයක් ඉකුත් වීමට පෙර, ඒ දිනයේ දී ඔහු විසින් සඳහන් කරනු ලැබූ ඒ පොලිස් ස්ථානය වෙත ඔහු විසින් සහතිකය පෞද්ගලිකව ඉදිරිපත් කරනු ලැබුවහොත්, ඒ සහතිකය ඉදිරිපත් කිරීමට ඔහුගේ පැහැර හැරීමේ හේතුව නිසාම ඒ තැනැත්තා විසින් මේ උපවගන්තියේ විධිවිධාන කඩ කරනු ලැබුවේ යයි සලකනු නොලැබිය යුතු ය.

(ආ) සහතිකය ඉදිරිපත් කිරීමට රියැදුරුට නියම කරනු ලැබූ වේලාවේ දී 22 වන වගන්තියේ විධිවිධාන කඩ කරමින් ඔහු විසින් මෝටර් වාහනය ධාවනය කරනු ලැබුවේ ද නැතහොත් ධාවනය කරනු නොලැබුවේ ද යන්න නිශ්චය කිරීමේ කාර්යය සඳහා පොලිස් නිලධරයකු විසින් නියම කරනු ලබන යම් තොරතුරු මෝටර් වාහනයේ අයිතිකරු විසින් දෙනු ලැබිය යුතු ය.

පොලිස් නිලධරයාගේ හෝ වාහන පරීක්ෂකයාගේ රථ වාහන විධි විධානවලට හා සංඥාවලට අවනත විය යුතු බව.

**71.** මෝටර් වාහනය නතර කිරීමට හෝ පසු පසට පැදවීමට හෝ එහි වේගය අඩු කරවීමට හෝ අසලස්සට හැරවීමට හෝ පොලිස් නිලධරයා හෝ වාහන පරීක්ෂක විසින් සංඥා කරනු ලැබිය හැකි පැත්තකින් ගමන් කිරීමට හෝ රථ වාහන පෙළකට අනුව යාමට හෝ පොලිස් නිලධරයකු විසින් හෝ වාහන පරීක්ෂකයකු විසින් ස්වකීය කාර්යය ඉටු කිරීමෙහි ලා දෙනු ලබන සියලු වාචික විධිවිධානවලට හෝ හස්ත සංඥාවලට මෝටර් වාහනයක රියැදුරු අවනත විය යුතු ය.

භට සේනාංකයකට අණදෙන නිලධරයකුගේ ඉල්ලීම පිට මෝටර් වාහන නැවැත්විය යුතු බව.

**72.** භට සේනාංකයකට අණ දෙන හෝ යම් සතකු තමා භාරයේ තිබෙන තැනැත්තකු විසින් වාචික වශයෙන් හෝ සංඥාවක් වශයෙන් අත එසවීමෙන් හෝ මහා මාර්ගයක යම් මෝටර් වාහනයක් නැවැත්වීමට ඉල්ලීමක් කරනු ලබන කවර හෝ විටක, මෝටර් වාහනයේ රියැදුරු විසින් වහාම ඒ වාහනය නතර කළ යුතු අතර, යුක්ති සහගත ලෙස අවශ්‍ය වනතාක් කල් එය නිසලව තබා ගත යුතු ය.

පොලිස් නිලධාරියකු හෝ පළාත් පාලන ආයතනයක සහ මහා මාර්ග අධිකාරියේ හා මධ්‍යකාබිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ රථ වාහන සංඥා.

**73.** (1) (2) වන උපවගන්තිය යටතේ තත් කාර්ය සඳහා සාදනු ලබන නියෝගවලට යටත්ව —

(අ) රථ වාහන ගමනා ගමනය සම්බන්ධයෙන් යම් විධිමත් කිරීමක කාර්ය සඳහා සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිලයට පහළ නොවන පොලිස් නිලධරයකුගේ නියමය ; හෝ

(ආ) යම් ප්‍රදේශයක පළාත් පාලන ආයතනයක් භාරයේ පවත්නා මහා මාර්ගයක් සම්බන්ධයෙන් වන විට ඒ පළාත් පාලන ආයතනයේ නියමයකින් හෝ මහා මාර්ග සංවර්ධන අධිකාරිය හෝ මධ්‍යකාබිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ හෝ භාරයේ පවත්නා මහා මාර්ගයක් සම්බන්ධයෙන් වන විට අදාළ අධිකාරියේ සභාපතිවරයාගේ නියමයකින් —

(i) රථ වාහන ගමනාගමනය විධිමත් කිරීමේ හෝ රථ වාහන විසින් අනුගමනය කළ යුතු ගමන් මාර්ගය සඳහන් කිරීමේ කාර්යය සඳහා හෝ එම මහා මාර්ගයේ මෝටර් වාහන පාවිච්චියට අදාළ හෝ ඒ සම්බන්ධයෙන් වූ වෙනත් යම් කාර්යයක් සඳහා ; නැතහොත්

(ii) අනතුරුදායක තත්ත්වයක පවත්නා වූ හෝ අළුත්වැඩියා කරන්නා වූ ද තනා ගෙන යන්නා වූ ද නැවත තනා ගෙන යන්නා වූ ද යම් පාලමක් මත හෝ මහා මාර්ගයේ යම් කොටසක රථ වාහන තහනම් කිරීමේ, සීමා කිරීමේ හෝ විධිමත් කිරීමේ කාර්යය සඳහා ; හෝ

(ඇ) මහා මාර්ග සංවර්ධන අධිකාරිය හෝ මධ්‍යකාබිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් පාලන ආයතනය සහ පොලීසියේ එකඟත්වය ඇතුව, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලයේ හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක හෝ මධ්‍යකාබිර පළාතේ පෞද්ගලික බස් රථ ප්‍රවාහන අධිකාරියේ නියමයකින් —

(i) එවැනි යම් මණ්ඩලයකට අයත් බස් රථ හෝ පුද්ගලික බස් රථ නවතා තැබීම සඳහා වෙන් කරන ලද ස්ථාන ; සහ

(ii) එවැනි යම් මණ්ඩලයකට අයත් හෝ පුද්ගලික බස්රථ සඳහා බස් නැවතුම් සඳහන් කිරීමේ කාර්යය සඳහා ; තවද

රථ වාහන සංඥා සහ දැන්වීම් යම් මහා මාර්ගයක පිහිටුවනු ලැබීම හෝ ප්‍රදර්ශනය කරනු ලැබීම කළ හැකි ය. නැතහොත් යම් මහා මාර්ගයක සිට පෙනෙන පරිදි පිහිටුවනු ලැබීම හෝ ප්‍රදර්ශනය කරනු ලැබීම කළ හැකි ය.

(2) යම් රථ වාහන සංඥාවල සහ දැන්වීම්වල වැදගත්කම ප්‍රකාශ කරමින් සහ මේ වගන්තියේ කාර්යය සඳහා ඒ සංඥා සහ දැන්වීම් ඉදි කිරීම සහ ප්‍රදර්ශනය කිරීම සීමා කරමින් හෝ විධිමත් කරමින් ඒ සංඥාවල සහ දැන්වීම්වල ප්‍රමාණය, වර්ණය, වර්ගය හෝ ආකෘතිය නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉදි කරනු ලැබුවා වූ හෝ ප්‍රදර්ශනය කරනු ලැබුවා වූ සහ ඒ මෝටර් වාහනය අයත් පංතියට හෝ විස්තරයට අයත් සියලු මෝටර් වාහනවලට අදාළ විය යුතු බවට අදහස් කරනු ලැබුවා වූ සියලු රථ වාහන සංඥාවලට සහ දැන්වීම්වලට මෝටර් වාහනයක රියැදුරන් කීකරු විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය භංග කිරීමක් සඳහා වූ යම් නඩු පැවරීමක දී, යම් මහා මාර්ගයක සිට පෙනෙන පරිද්දෙන් යම් මහා මාර්ගයක ඉදි කරන ලද්ද වූ ප්‍රදර්ශනය කරන ලද්ද වූ හෝ සපයන ලද්ද වූ හෝ සෑම මාර්ග සලකුණක් හෝ දැන්වීමක්ම, පටහැනි බව ඔප්පු කරනතෙක් මිස, (1) වන උපවගන්තිය යටතේ නිසි පරිදි ඉදි කරනු ලැබූ ලෙස හෝ ප්‍රදර්ශනය කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි හැර සහ අවස්ථාවෝචිත පරිදි පළාත් පාලන ආයතනයේ හෝ මහා මාර්ග සංවර්ධන අධිකාරිය හෝ ඔස්සාකීර් පළාතේ පළාත් බඳ මාර්ග සංවර්ධන අධිකාරිය අනුමතිය ඇතිව හැර සහ (2) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයකට අනුකූලව මිස, මෝටර් වාහනවල මත පෙන්වීම සඳහා අදහස් කරනු ලබන බවට දක්වෙන යම් රථවාහන සංඥවක් හෝ දැන්වීමක් කිසිම තැනැත්තකු විසින් මහා මාර්ගයක ඉදි කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ පවත්වා ගෙන යාම හෝ මහා මාර්ගයක සිට පෙනෙන පරිදි එලෙස ඉදි කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ පවත්වා ගෙන යාම නොකළ යුතු ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා "රථ වාහන සංඥව" යන්නෙහි රථ වාහන ගමනා ගමනය ආලෝක සංඥ මඟින් විධිමත් කිරීම සඳහා වූ සංඥවක් ඇතුළත් වේ.

(7) මේ වගන්තියේ "පළාත් පාලන ආයතනය" යන්නට, ප්‍රාදේශීය සභාවක් ඇතුළත් වන අතර, මාර්ග තැනීම හා නඩත්තු කිරීම විෂයය කිසියෙන් බලය පවරනු ලැබූ සහ මේ වගන්තියේ කාර්යය සඳහා පළාත් පාලන ආයතනයක් වශයෙන් සැලකිය යුතුයෙහි පළ කරන ලද නිවේදනයක් මඟින් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබූ එවැනි යම් මණ්ඩලයක්, ආයතනයක් හෝ සංස්ථාවක් ද ඇතුළත් වේ.

ටැංකියට පෙට්‍රල් ලබා ගන්නා විට ගත යුතු ආරක්ෂාවන්.

**74.** (1) වාහනයේ ටැංකියට හෝ වාහනයෙහි හෝ ඒ මත ඇති යම් බඳුනකට පෙට්‍රල් හෝ වෙනත් ඉන්ධන තෙලක් වත් කරනු ලැබීමට හෝ මුදා හරිනු ලැබීමට පෙර, මෝටර් වාහනයේ එන්ජිම නතර කළ යුතු අතර, වාහනයේ හෝ ඒ මත ඇති යම් විදුලි පහනක් නොවන යම් පහනක් නිවා දැමිය යුතු ය.

(2) වාහනයේ ටැංකියට හෝ වාහනයෙහි හෝ ඒ මත ඇති යම් බඳුනකට පෙට්‍රල් හෝ වෙනත් ඉන්ධන තෙලක් පුරවනු ලබන හෝ මුදා හරිනු ලබන අතරතුර යම් මෝටර් වාහනයක් ඇතුළත පෙට්‍රල් පොම්පයක සිට යාර තුනක් ඇතුළත කිසිම තැනැත්තකු විසින් දුම්බීම නොකළ යුතු ය. තැනැත්තෙක් දල්වන ලද දුම් පයිප්පයක්, සුරුට්ටුවක් හෝ සිගරැට්ටුවක් ගෙන යාම නොකළ යුතු ය. තැනැත්තෙක් ගිනිකූරක් දැල්වීම නොකළ යුතු ය.

මහා මාර්ගයක මෝටර් වාහන නතර කිරීම හෝ නවතා තැබීම.

**75.** (1) (අ) යම් නාගරික ප්‍රදේශයක ඇති යම් මහා මාර්ගයක හෝ එහි කොටසක මෝටර් වාහන නතර කිරීම හෝ නවතා තැබීම තහනම් කෙරෙන සීමා කෙරෙන හෝ විධිමත් කෙරෙන හෝ මෝටර් වාහන සඳහා වෙන් කරන ලද යම් නවතා තැබීමේ ස්ථානයක් දක්වෙන දැන්වීමක් මහා මාර්ගයේ හෝ එහි කොටසක ප්‍රකට ස්ථානයක තැනෙතොත් ඒ මහා මාර්ගයේ හෝ එහි කොටසක සිට පෙනෙන පරිදි ඒ ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය විසින් හෝ එහි නියමයකින් ප්‍රදර්ශනය කරනු ලැබිය හැකි ය.

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ වරදක් සඳහා වූ යම් පැමිණිල්ලක කාර්ය සඳහා යම් ප්‍රදේශයක පළාත් පාලන ආයතනය විසින් හෝ එහි නියමයෙන් මේ වගන්තිය යටතේ ඒ ප්‍රදේශයෙහි ප්‍රදර්ශනය කරනු ලැබූ ලෙස අදහස් කෙරෙන සෑම දැන්වීමක්ම, ඊට පටහැනිව ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ පළාත් පාලන ආයතනය විසින් නීත්‍යනුකූල ලෙස ප්‍රදර්ශනය කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) යම් නාගරික ප්‍රදේශයක් ඇතුළත යම් මහාමාර්ගයක හෝ මහා මාර්ගයක කොටසක මෝටර් වාහන නතර කිරීම හෝ නවතා තැබීම තහනම් කිරීමේ, සීමා කිරීමේ හෝ විධිමත් කිරීමේ කාර්යය සඳහා හෝ මෝටර් වාහන සඳහා වෙන් කරන ලද යම් නවතා තැබීමේ ස්ථානයක් පාවිච්චි කිරීම විධිමත් කිරීමේ හෝ පාලනය කිරීමේ කාර්යය සඳහා ඒ නාගරික ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයේ ඉල්ලීම පිට නියෝග සාදනු ලැබිය හැකි ය. තවද, නියෝග එසේ සාදනු ලැබ ඇති අවස්ථාවක, පළාත් පාලන ආයතනය විසින්, ඒ නියෝගවලට අනුකූලව සහ (1) වන උප වගන්තිය යටතේ යම් දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ යම් දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම හෝ කළ යුතු ය.

(3) යම් මහා මාර්ගයක හෝ මහා මාර්ගයක කොටසක මෝටර් වාහන නතර කිරීම හෝ නවතා තැබීම (2) වන උපවගන්තිය යටතේ ප්‍රදර්ශනය කරන ලද දැන්වීමක් මගින් තහනම් කරනු ලැබ ඇති අවස්ථාවක, —

(අ) යම් නිලධරයකු විසින් හෝ අධිකාරියක් විසින් මහා මාර්ගයෙහි හෝ එහි කොටසක ඉදි කරන ලද හෝ ප්‍රදර්ශනය කරන ලද යම් රථ වාහන සංඥාවකට හෝ දැන්වීමකට කීකරු වීමේ ; හෝ

(ආ) ඒ වේලාවේ දී එම මහා මාර්ගයේ හෝ එහි කොටසෙහි රථ වාහන ගමනාගමනය කිසි පිළිවෙළකට අනුගමනය කිරීමේ ; හෝ

(ඇ) මෝටර් වාහනයකින් බැසීමට හෝ ඊට ඇතුළුවීමට යම් තැනැත්තකුට ඉඩදීමේ ; හෝ

(ඈ) බඩු පැටවීමේ හෝ බෑම කරනු ලැබිය හැකි කාලය පිළිබඳව ඒ මහා මාර්ගයට හෝ එහි කොටසට අදාළ වන (2) වන උපවගන්තිය යටතේ වූ යම් නියෝගයකින් නියම කරනු ලබන යම් සීමා කිරීම්වලට යටත්ව, මෝටර් වාහනයට බඩු පැටවීමේ හෝ ඉන් බඩු බෑමේ

කාර්ය සඳහා අවශ්‍ය යම් කාලයකට හැර, ඒ මහා මාර්ගයෙහි හෝ එහි කොටසක මෝටර් වාහනයක් නතර කර තැබීමට මෝටර් වාහනයක රියැදුරු විසින් ඉඩ දෙනු නොලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ප්‍රදර්ශනය කරන ලද යම් දැන්වීමක් මගින් හෝ (2) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් මගින් යම් මහා මාර්ගයක හෝ මහා මාර්ගයක කොටසක මෝටර් වාහන නතර කිරීම හෝ නවතා තැබීම සීමා කරනු ලැබ ඇති අවස්ථාවක, (3) වන උපවගන්තියේ සඳහන් කාර්යයන්ගෙන් එක් කාර්යයක් සඳහා හෝ අවස්ථාවෝචිත පරිදි, දැන්වීමෙහි හෝ නියෝගයෙහි සඳහන් යම් ආකාරයකින් නොවන අන්‍යාකාරයකින් හෝ එම කාලසීමාව හැර වෙනත් යම් කාල සීමාවක් තුළ ඒ මහා මාර්ගයෙහි හෝ මහා මාර්ගයක කොටසක වාහනය නතර කර තැබීමට මෝටර් වාහනයේ රියැදුරු විසින් ඉඩ දෙනු නොලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ ප්‍රදර්ශනය කරන ලද යම් දැන්වීමක් මගින් හෝ (2) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් මගින් යම් මහා මාර්ගයක හෝ මහා මාර්ගයක කොටසක මෝටර් වාහන නතර කිරීම හෝ නවතා තැබීම තහනම් කරනු ලැබ නොමැති හෝ සීමා කරනු ලැබ නොමැති අවස්ථාවක ඒ මහා මාර්ගයේ හෝ මහා මාර්ගයක කොටසක රථ වාහන ගමනා ගමනය විධිමත් කිරීමේ කාර්යය සඳහා පොලිස් නිලධරයකු විසින් හෝ ග්‍රාම නිලධාරියකු විසින් හෝ වාචික විධාන හෝ සංඥා දෙනු ලැබිය හැකි අතර පොලිස් නිලධරයා විසින් හෝ ග්‍රාම නිලධාරී විසින් නියම කරනු ලබන යම් තත්ත්වයක් හෝ යම් කාලයක් අනුව හැර, අන්‍යාකාරයකින් ඒ මහා මාර්ගයෙහි හෝ එහි කොටසෙහි මෝටර් වාහනයක් නතර කර තැබීමට ඒ මෝටර් වාහනයේ රියැදුරු විසින් ඉඩ දෙනු නොලැබිය යුතු ය.

(6) (3) වන, (4) වන සහ (5) වන උපවගන්ති අදාළ නොවන යම් මහා මාර්ගයක හෝ මහා මාර්ගයක කොටසක රථ වාහන ගමනා ගමනයට අවහිර වන හෝ අවහිර වීමට ඉඩ ඇති යම් තත්ත්වයකින් හෝ කාලයක් යම් මෝටර් වාහනයක් නතර කර තැබීමට ඒ වාහනයේ රියදුරු විසින් ඉඩ දෙනු නොලැබිය යුතු ය.

(7) මේ වගන්තියේ "පළාත් පාලන ආයතනය" යන්නෙන් ප්‍රාදේශීය සභාවක් සහ මාර්ග ඉදි කිරීමට සහ නඩත්තු කිරීමට නීතියෙන් බලය පවරනු ලැබූ, මේ වගන්තියේ කාර්යය සඳහා පළාත් පාලන ආයතනයක් ලෙස ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයකින් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ප්‍රකාශිත යම් මණ්ඩලයක්, ආයතනයක් හෝ සංස්ථාවක් ඇතුළත් වේ.

මහා මාර්ගයක මෝටර් වාහනයක් නතර කොට ඇති විට හෝ නවතා නොමැතිව තබා ඇති විට හෝ කැඩී බිඳී ඇති විට ගත යුතු ආරක්ෂාවන්

76. (1) මෝටර් වාහනයක් මහා මාර්ගයක නතර කොට හෝ නවතා තබා ඇති කවර හෝ විටෙක, ඒ මෝටර් වාහනයේ රියදුරු විසින්, මහා මාර්ගයේ අයිනට හැකිතාක් ආසන්නව හෝ මහා මාර්ගයෙහි හෝ ඒ අසල ප්‍රදර්ශනය කරනු ලැබ ඇති මාර්ග සංඥාවකින් හෝ දැන්වීමක් මගින් දක්වා ඇති යම් තත්ත්වයකින් හෝ ආකාරයකින් හැකියොත් රාජකාරියෙහි නිරත පොලිස් නිලධාරියකු විසින් ප්‍රදර්ශනය කරනු ලබන මාර්ග සංඥාවකින් හෝ දැන්වීමක් මගින් දක්වන යම් තත්ත්වයකින් හෝ ආකාරයකින් වාහනය තැබිය යුතු ය.

(2) මෝටර් වාහනයක් මහා මාර්ගයක නතර කොට හෝ නවතා තබා ඇති අතරතුර, කිසිවකු නොමැතිව මෝටර් වාහනය රඳවා යාමට අවශ්‍ය වන කවර හෝ විටෙක ඒ මෝටර් රථයේ රියදුරු විසින් වාහනයෙන් ඉවත්ව යාමට පෙර එහි එන්ජිම නැවැත්විය යුතු අතර, තමා බැහැරව සිටිය දී වාහනය ගෙන යාමෙන් හෝ ගෙන යනු ලැබීමට ප්‍රතිපක්ෂව නිසි ආරක්ෂාවන් ගත යුතු ය.

(3) හදිසි අනතුරකින්, යාන්ත්‍රික අක්‍රියතාවකින් හෝ ටයර් අක්‍රිය වීමකින් ක්‍රියා විරහිත වූ යම් මෝටර් වාහනයක් යම් මහා මාර්ගයක තබා යාම අවශ්‍ය වන අවස්ථාවක රාත්‍රියේ දී මහා මාර්ගයේ එසේ තබා ගිය වාහනයේ රියදුරු විසින්, මහා මාර්ගයේ ඇති වාහනයේ තත්ත්වය පැහැදිලි ලෙස දක්වෙන පරිදි වාහනයේ ඉදිරිපස ආලෝකමත් කරනු ලැබිය යුතු ය.

(4) පොලිස් නිලධාරියකුගේ මතය අනුව මහා මාර්ගයක නවතනු ලැබූ හෝ තාවකාලිකව රඳවනු ලැබූ මෝටර් වාහනයකින්, හෝ යම් වස්තුවකින්, දෙයකින් හෝ ද්‍රව්‍යයකින් යම් මහා මාර්ගයක හෝ එහි මහජන ගමනා ගමනයට යම් අවහිරයක් සිදුවන අවස්ථාවක, ඒ පොලිස් නිලධාරියා විසින් ඒ අවහිරයට හේතු වන මෝටර් වාහනය හෝ වෙනත් වස්තුව, දෙය හෝ ද්‍රව්‍ය ඉවත් කරනු ලැබීමට සැලස්වා ඒ ඉවත් කිරීමේ වියදම් අයිතිකරුගෙන් අය කර ගනු ලැබිය හැකි ය.

(5) 4 වන උපවගන්තිය යටතේ මෝටර් වාහනයක්, වස්තුවක්, දෙයක් හෝ ද්‍රව්‍යයක් ඉවත් කරනු ලැබීමේ දී සද්භාවයෙන් සිදු වූ යම් හානියක් සඳහා එකී පොලිස් නිලධාරියකු අලාභ ගෙවීමට යටත් නොවිය යුතු ය.

මාර්ග පාවිච්චි කරන්නන්ගේ මග පෙන්වීම සඳහා නියෝග

77. (1) රථවාහන ගමනා ගමනය නියාමනය කිරීමට, විධිමත් කිරීමට සහ පාලනය කිරීමට අදාළ විධාන ඇතුළුව, මාර්ග පාවිච්චි කරන තැනැත්තන්ගේ මග පෙන්වීම සඳහා නියෝග සැදීමට බලය පවරන ලද බලධාරියකුට නිසි බවට පෙනී යන යම් විධාන අඩංගු මාර්ගෝපදේශ සංග්‍රහයක් නියම කරමින් මේ ප්‍රඥප්තිය යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) මේ ප්‍රඥප්තියේ 109 වන වගන්තියෙහි කුමක් සඳහන්ව ඇතද, (1) වන උප වගන්තිය යටතේ නියෝග මගින් නියම කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහයේ යම් විධානයක් නොපිළිපැදීම පමණකින්ම මේ ප්‍රඥප්තියේ අර්ථානුකූලව වරදක්

නොවන්නේ ය. එසේ වුව ද ඒ කටයුතු කිරීම (මේ ප්‍රඥප්තිය යටතේ වරදක් සඳහා වූ නඩු කටයුතු ඇතුළුව සිවිල් නඩුවක හෝ අපරාධ නඩුවක) යම් නඩු කටයුත්තක දී එම නඩු කටයුත්තේ දී ප්‍රස්තුත යම් කරුණක් තහවුරු කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට නැඹුරු වන වශයෙන් එම නඩු කටයුතුවල යම් පාර්ශවකරුවකු විසින් විශ්වාසය තැබිය යුතු ය.

77අ. (1) කිසිදු තැනැත්තකු විසින් — ධාවනකාලය.

(අ) පැය හතරහමාරකට වැඩි යම් අඛණ්ඩ කාලසීමාවක් සඳහා ; හෝ

(ආ) යම් ධාවනය කිරීමේ කාලසීමාවක් ආරම්භයේ සිට ගණන් බලනු ලබන යම් පැය විසිහතරක කාල සීමාවක දී රියැදුරාට යටත් පිරිසෙයින් අනුයාමී වශයෙන් පැය දහයක විවේකයක් නොතිබෙන පරිදි

යම් කුලී මෝටර් රථයක්, වෑන්ට් රථයක්, මෝටර් ට්‍රයිසිකල්වැන් රථයක්, මෝටර් ට්‍රයිසිකල් වෑන්ට් රථයක් හෝ මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් ධාවනය කිරීම නැතහොත් තමා විසින් සේවයෙහි නියුක්ත කරවනු ලැබූ හෝ තමාගේ නියමයන්ට යටත් වූ යම් තැනැත්තකුට ධාවනය කිරීමට සැලැස්වීම හෝ අවසර දීම හෝ කරනු නොලැබිය යුතු ය.

(2) රියැදුරාට විවේකය හා නැවුම් බව ලැබීමට හැකි විය යුතු පැය භාගයකට නොඅඩු අන්තරයකින් වෙන් කරනු ලබන්නේ නම් මිස, (1) වන උපවගන්තියේ කාර්යය සඳහා යම් කාල සීමා දෙකක් හෝ වැඩි ගණනක්, අඛණ්ඩ කාල සීමාවක් වශයෙන් සැලකිය යුතු ය.

78. (1) යම් නාගරික ප්‍රදේශයක් සඳහා වූ පළාත් පාලන ආයතනය විසින් මෝටර් ට්‍රයිසිකල් වැන් රථවල, බස් රථවල හෝ ලොරිවල හෝ යම් නිශ්චිත පංතියක හෝ විස්තරයක මෝටර් ට්‍රයිසිකල් වැන් රථවල, බස් රථවල හෝ ලොරිවල පාවිච්චිය සඳහා එම ප්‍රදේශය ඇතුළත පොදු නැවතුම් පොළවල් එකක් හෝ වැඩි ගණනක් සපයනු ලැබිය හැකි ය. මෝටර් ට්‍රයිසිකල් වැන්රථ, බස්රථ සහ ලොරි සඳහා පොදු නැවතුම් පොළවල්.

(2) යම් නාගරික ප්‍රදේශයක් සඳහා වූ යම් පළාත් පාලන ආයතනයක් විසින් සපයන ලද පොදු නැවතුම් පොළවල් සඳහා වූ විධිවිධාන සතුටුදායක නොවන බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වන යම් අවස්ථාවක, සාදන ලද නියෝගවලට අනුකූලව ඒ ප්‍රදේශය ඇතුළත පොදු නැවතුම් පොළවල් පිහිටුවීම සහ ඒවා පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය යයි කොමසාරිස්වරයා විසින් සලකනු ලබන යම් විධිවිධාන සැලසීමට ඔහුට බලය පවරන නියෝග සාදනු ලැබිය හැකිය.

79. (අ) යම් බස් රථයක අයිතිකරු, රියැදුරු හෝ කොන්දොස්තර විසින් යම් ගමන් මාර්ගයක හෝ මිනා මාර්ගයක යම් ගමනක් සම්බන්ධයෙන් යම් බස් රථයක් පාවිච්චි කරනු ලබන්නේ බස්රථ ධාවන අවසර පත්‍රයක බලය යටතේ ද ඒ බස්රථ ධාවන අවසර පත්‍රයේ යම් කොන්දේසියක් නිසා ඒ ගමන් මාර්ගය හෝ මිනා මාර්ගය සම්බන්ධයෙන් බලය දෙනු ලැබූ ගාස්තුව ඉක්මවමින් යම් ගාස්තුවක් යම් මගියකු ගෙන් ඉල්ලීම හෝ භාර ගැනීම නොකළ යුතු ය ; නැතහොත් මගියා සඳහා අධික ගාස්තු අය කිරීමට විරුද්ධව තහනම.

(ආ) යම් ගමන් මාර්ගයක හෝ මිනා මාර්ගයක ගමනක් සම්බන්ධයෙන් ඒ අවසර පත්‍රයේ යම් කොන්දේසියක් නිසා ඒ ගමන සම්බන්ධයෙන් බලය දෙනු ලැබූ ගාස්තුවට අඩු යම් ගාස්තුවක් යම් මගියකුගෙන් භාර ගැනීම හෝ භාර ගැනීමට එකඟවීම නොකළ යුතු ය.

අධික ගාස්තු අයකර ගැනීම.

80. (1) යම් බස් රථයක යම් ගමනක් වෙනුවෙන් 79 වන වගන්තියෙන් සඳහන් බලය දෙන ලද ගාස්තුවට අධික යම් ගාස්තුවක් ගෙවීමට කිසිදු තැනැත්තකු තමා විසින් ඇතුළත් වී ඇති යම් එකඟවීමකින් නොබැඳිය යුතු ය. තවද කිසිවකට අදාළ වන ඒ බලය දෙන ලද ගාස්තුවට අධික යම් ගාස්තුවක් ගෙවන ලද යම් තැනැත්තකු විසින් ඒ මුදල ගෙවනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාගෙන් ගෙවනු ලැබූ අධික මුදල ආපසු ලබාගැනීමට හිමිකම් තිබිය යුතු ය.

(2) 79 වන වගන්තියේ (අ) ඡේදයෙහි විධිවිධාන කඩ කිරීමක් පිළිබඳව යම් අධිකරණයක් විසින් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක, එම කඩ කිරීම සඳහා අධිකරණය විසින් නීත්‍යනුකූලව පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අතිරේකව, අවස්ථාවෝචිත පරිදි බලය දෙනු ලැබූ ඉහළම ගාස්තුවට හෝ බලය දෙනු ලැබූ ගාස්තුවට හෝ එකතු වූ ගාස්තුවට හෝ වැඩිපුර එම තැනැත්තා වෙත ගෙවනු ලැබූ යම් මුදලක් ආපසු ගෙවිය යුතු යයි අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේදී අධිකරණය විසින් පනවනු ලැබිය හැකි දඩ මුදල ඉක්මවන්නේ වුවද, ඒ මුදල අධිකරණය විසින් පනවන ලද දඩයක ආකාරයෙන් අයකර ගනු ලැබිය යුතු ය.

(3) බස් රථයක, බිඳ වැටීමක් හෝ අයිතිකරුගේ හෝ අයිතිකරුගේ යම් සේවකයකුගේ නොසැලකිල්ලක් හේතු කොට ගෙන තම ගමනාන්තයට ළඟා වීමට යම් බස්රථයක් අපොහොසත් වුවහොත්, යම් ගමනක් සඳහා ගාස්තුව යථා පරිදි ගෙවා ඇති බස් රථයක යම් මගියකු විසින් ඉල්ලා සිටින විට, එසේ ගෙවන ලද සම්පූර්ණ ගාස්තුව අය කර ගැනීමට ඔහුට හිමිකම ඇත්තේ ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ගාස්තුවක් අය කර ගනු ලැබිය හැකි අවස්ථාවක, එම ගාස්තුව අය කර ගැනීමට හිමිකම් ඇති මගියා විසින් ඉල්ලා සිටි විට, ගාස්තුව භාර ගනු ලැබූ තැනැත්තා විසින් එය ආපසු ගෙවිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය කඩ කිරීමක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක, ඒ කඩ කිරීම සඳහා අධිකරණය විසින් නීත්‍යනුකූල ලෙස නියම කරනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අතිරේකව, ගාස්තුව ආපසු ගෙවීමට අණවක් කරනු ලැබිය හැකි ය. තවද, ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී අධිකරණය විසින් පනවනු ලැබිය හැකි දඩ මුදල ඉක්මවන්නේ වුව ද අධිකරණය විසින් පනවන ලද දඩයක ආකාරයෙන් ඒ ගාස්තුව අයකර ගනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධාන යටතේ අය කර ගනු ලැබිය හැකි යම් ගාස්තුවක් හෝ ගාස්තුවක කොටසක් අයකර ගැනීම සඳහා වූ යම් සිවිල් ප්‍රතිකර්මයක් කෙරෙහි මේ වගන්තියේ කිසිවක් බල නොපෑ යුතු ය.

ගාස්තු අයකර ගැනීම.

81. (1) යම් බස් රථයක කිසියම් ගමනක් සඳහා ගාස්තුව වශයෙන් ප්‍රසිද්ධ පළකර ලෙස තමාගෙන් අයවිය යුතු හෝ එබඳු යම් ගමනක යෙදෙන අතරතුර දී බස් රථයකට තමා විසින් සිදු කරන ලද යම් හානියක් සඳහා අලාභ වශයෙන් අයවිය යුතු යයි හිමිකම් පෑවා වූ හෝ රුපියල් පනහක් නොඉක්මවන යම් මුදලක් ගෙවීමට බැඳී සිටින යම් තැනැත්තකු, අවස්ථාවෝචිත පරිදි බස් රථයේ අයිතිකරු විසින් හෝ ඒ මුදල ලබා ගැනීමට අයිතිකරු විසින් බලය දෙන ලද යම් සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් හෝ කරන ලද ඉල්ලීමක් මත ඒ මුදල ගෙවීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, ගමන ආරම්භ කළා වූ හෝ අවසාන කළා වූ හෝ හානිය සිදු කළා වූ ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය විසින්, රථයේ අයිතිකරු විසින් කරන ලද පැමිණිල්ලක් මත, හා එම පැමිණිල්ලෙහි කියනු ලබන කරුණු ලඝු වශයෙන් ඔප්පු කිරීම මත, ගාස්තු වශයෙන් එසේ අයවිය යුතු මුදල හෝ හානිය සම්බන්ධයෙන් අලාභ වශයෙන් වූ මුදලක් හා

අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි, බස් රථයේ අයිතිකරු, රියැදුරු හෝ කොන්දොස්තර විසින් අධිකරණයෙහි පෙනී සිටීමේ දී වැය වූ කාලය සම්බන්ධයෙන් වූ ගාස්තු සහ වන්දි අයිතිකරු වෙත ගෙවිය යුතු යයි ඒ තැනැත්තාට අණ කරනු ලැබිය හැකි ය. තවද මේ වගන්තිය යටතේ ගෙවිය යුතු යයි අණ කරනු ලැබූ සෑම මුදලක්ම, ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේදී අධිකරණය විසින් පනවනු ලැබිය හැකි දඩ මුදල ඉක්මවන්නේ වුවද අධිකරණය විසින් පනවන ලද දඩයක ආකාරයෙන් අයකර ගනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් කරන ලද ආඥාවකින් අසාධාරණයට පත් වූ යම් තැනැත්තකු විසින්, ආඥාව අපරාධ නඩුවක දී හෝ කාරණයක දී මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් ප්‍රකාශයට පත් කරන ලද අවසානාත්මක ආඥාවක් ලෙස සලකා ඒ ආකාරයෙන් ම අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, එවැනි අභියාචනයක් සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ XXVIII වන පරිච්ඡේදය අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

82. මගීන් විසින් බස් රථ තුළ අතපසුවෙන් දමා යන දේපළවල ආරක්ෂිත භාරය හා ඒවා නැවත භාරදීම හෝ බැහැර කිරීම සඳහා විධිවිධාන සලස්වමින් හා ඒ සම්බන්ධයෙන් අය කරනු ලැබිය හැකි සහ එවැනි දේපළ සොයා ගනු ලබන්නන්ට තිළිණ වශයෙන් ගෙවිය හැකි මුදල් ප්‍රමාණ නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය. බස් රථ තුළ දමා යන දේපළ

83. (1) මගී මාර්ගයක ඇති පෞද්ගලික කෝච් රථයක් තුළ කවර වූ හෝ වේලාවක සිටින තැනැත්තන් සංඛ්‍යාව එම පෞද්ගලික කෝච් රථ සඳහා වූ ආදායම් බලපත්‍රයෙහි සඳහන් උපරිම සංඛ්‍යාව ඉක්මවන අවස්ථාවක හෝ නියම කරනු ලබන බඩු හෝ තැනැත්තකුගේ පෞද්ගලික ගමන් බඩු නොවන බඩු මගී මාර්ගයක ඇති මෝටර් රථයක් හෝ පෞද්ගලික කෝච් රථයක් තුළ තිබී සොයා ගනු ලබන අවස්ථාවක හෝ එහි රියැදුරු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතු ය : පෞද්ගලික කෝච් රථ තුළ වැඩියෙන් සංඛ්‍යාවට වැඩිපුර තැනැත්තන් සහ මෝටර් රථ හෝ පෞද්ගලික රථ තුළ පෞද්ගලික ගමන් බඩු නොවන බඩු ගෙනයාම.

එසේ වුව ද, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් සඳහන් කරනු ලබන යම් දිනයක යම් පෞද්ගලික කෝච් රථයක් තුළ තැනැත්තන් ගෙනයාම සම්බන්ධයෙන්, කෝච් රථය එම දිනයේ දී එසේ සඳහන් කරන ලද ප්‍රදේශයක එසේ සඳහන් කරන ලද කාර්යයක් සඳහා පාවිච්චි කරන්නේ නම්, මේ උප වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(2) මගී මාර්ගයක මෝටර් රථයක් තුළ කවර හෝ වේලාවක සිටින තැනැත්තන්ගේ සංඛ්‍යාව (එහි රියැදුරු ඇතුළුව) හය ඉක්මවන අවස්ථාවක, එහි රියැදුරු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා —

(අ) මෝටර් රථයක හෝ පෞද්ගලික කෝච් රථයක වෙනම් අසුනක අසුන් නොගන්නා වයස අවුරුදු තුනට අඩු දරුවකු තැනැත්තකු වශයෙන් ගණන් නොගත යුතු ය ;

(ආ) අවස්ථාවෝචිත පරිදි, මෝටර් රථයේ හෝ කෝච් රථයේ රියැදුරු තැනැත්තකු වශයෙන් ගණන් ගත යුතු ය ; තවද

(ආ) දරුවන් දෙදෙනකු, එක් එක් දරුවා වයස අවුරුදු තුනට වැඩි අවුරුදු දොළහට අඩු වන විට, එක් තැනැත්තකු වශයෙන් ගණන් ගත යුතු ය.

(4) මෝටර් රථ සහ පෞද්ගලික කෝච් රථ තුළ පෞද්ගලික ගමන් මලු වශයෙන් ගෙන යා හැකි භාණ්ඩවල හෝ ඇසුරුම් පෙට්ටිවල හැකියාවන් මෝටර් රථ සහ පෞද්ගලික කෝච් රථ තුළ ගෙන යා හැකි පෞද්ගලික ගමන් මලු නොවන මලුවල ස්වභාවය, විස්තරය හෝ බර විහිත කෙරෙමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(5) යම් මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකලයක් හෝ පෞද්ගලික කෝච් රථයක් යම් විස්තරයක භාණ්ඩ ගෙන යාම සඳහා යොදා ගත යුතු යයි 21 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයකින් බලය දෙනු ලැබූ අවස්ථාවක, එම විස්තරයේ භාණ්ඩ මෝටර් රථයේ, මෝටර් ට්‍රයිසිකලයේ හෝ පෞද්ගලික කෝච් රථයේ ගෙන යාමේ හේතුව නිසාම පමණක් කිසිදු තැනැත්තකු මේ වගන්තියේ යම් විධිවිධානයක් කඩ කරනු ලැබුවාක් මෙන් සලකනු නොලැබිය යුතු ය.

බස් රථ තුළ මඟීන්ගේ සංඛ්‍යාව වැඩිපුර තැනැත්තන් හෝ මඟීන් සහ පෞද්ගලික ගමන් මලු නොවන මලු ගෙනයාම.

84. (1) මගී මාර්ගයක බස් රථයක් තුළ කවර හෝ වේලාවක දී සිටින මඟීන් සංඛ්‍යාව එම බස් රථය සඳහා වූ ආදායම් බල පත්‍රයෙහි සඳහන් උපරිම සංඛ්‍යාව ඉක්මවන අවස්ථාවක හෝ නියම කරනු ලැබිය හැකි මලු හෝ මඟියකුගේ පෞද්ගලික ගමන් මලු නොවන මලු මගී මාර්ගයක බස් රථයක් තුළ තිබී සොයාගනු ලැබූ අවස්ථාවක, බස් රථයේ කොන්දොස්තර වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා —

(අ) පහත සඳහන් තැනැත්තන් මඟීන් වශයෙන් ගණන් නොගත යුතු ය :—

(i) බස්රථයක් තුළ වෙනම අසුනක අසුන් නොගන්නා අවුරුදු තුනකට අඩු දරුවෙක් ;

(ii) බස් රථයක රියැදුරු ;

(iii) බස් රථයක කොන්දොස්තර ; සහ

(iv) බස් රථයක අයිතිකරු විසින් සේවයෙහි නියුක්ත කරන ලද්දා, නියමිය හැකි පරිද්දෙන් "පරීක්ෂක" යන වචනය ලකුණු කරන ලද ලෝහමය ලාංඡනයක් පැළඳ ඇති ප්‍රවේශ පත්‍ර පරීක්ෂකයෙක්.

(ආ) දරුවන් දෙදෙනකු එක් එක් දරුවා වයස අවුරුදු තුනකට වැඩි සහ අවුරුදු දොළහට අඩු වන විට, එක් මඟියකු වශයෙන් ගණන් ගත යුතු ය.

(3) බස් රථ තුළ පෞද්ගලික ගමන් මලු වශයෙන් ගෙන යා හැකි භාණ්ඩවල හෝ ඇසුරුම් පෙට්ටිවල හෝ බස් රථ තුළ ගෙන යා හැකි පෞද්ගලික ගමන් මලු නොවන මලුවල ස්වභාවය, විස්තරය හෝ බර විහිත කරමින් නියෝග සාදනු ලැබිය හැකිය.

(4) යම් බස් රථයක්, යම් විස්තරයක භාණ්ඩ ගෙන යාම සඳහා යොදා ගත යුතු යයි 21 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයකින් බලය ලැබූ අවස්ථාවක, එම විස්තරයේ භාණ්ඩ බස් රථයේ ගෙන යාමේ හේතුව නිසාම පමණක් කිසිදු තැනැත්තකු මේ වගන්තියේ යම් විධිවිධානයක් කඩ කරනු ලැබුවාක් මෙන් සලකනු නොලැබිය යුතු ය.

**85.** බස් රථයක හෝ පෞද්ගලික කෝච් රථයක රියැදුරු හෝ කොන්දොස්තර විසින් ඒ සඳහා වූ ආදායම් බලපත්‍රයට අනුකූලව, අවස්ථාවෝචිත පරිදි, එහි ගෙන යා හැකි තැනැත්තන්ගේ හෝ මගීන්ගේ සම්පූර්ණ සංඛ්‍යාව එම අවස්ථාවේ දී ගෙන යාමේ හේතුව නිසා, බස් රථයට හෝ කෝච් රථයට ඇතුළු නොවන ලෙස යම් තැනැත්තකුගෙන් ඉල්ලා සිටිනු ලබන කවර හෝ අවස්ථාවක දී එම තැනැත්තා බස් රථයට හෝ කෝච් රථයට ඇතුල්වීම හෝ ඇතුල්වීමට තැත් කිරීම නො කළ යුතු ය. බස් රථ හෝ පෞද්ගලික කෝච් රථ පිරී පවතින විට තැනැත්තන් ඇතුළත් නොවිය යුතු බව.

**86.** කුලී සඳහා නවතා ඇති හෝ ගමන් කරන බස් රථයක කිසිම අයිතිකරුවකු රියැදුරකු හෝ කොන්දොස්තරවරයකු විසින් හෝ අයිතිකරු, රියැදුරු හෝ කොන්දොස්තර වෙනුවෙන් ක්‍රියා කරන තැනැත්තකු විසින් මගීන්ගේ හෝ මගීයකු විය හැකි අයකුගේ අවධානය යොමු කරවනු පිණිස ඇමතීම, ශබ්දයක් කිරීම හෝ යම් උපකරණයක් නැඩවීම නොකළ යුතු ය. මගීන් සඳහා කැඳවීම.

**87.** (1) සෑම බස් රථයකම අයිතිකරු විසින් එම බස් රථය සම්බන්ධයෙන්, නියෝගවලට අනුකූලව නිදහස් කිරීමක් කරනු ලැබ ඇත්තේ නම් මිස, නියමිත ආකෘතියෙහි වූ ලේඛනයක් තබා, පවත්වා ගෙන යා යුතු අතර, බස් රථය මගී මාර්ගයක යොදවනු ලබන එක් එක් අවස්ථාව සම්බන්ධයෙන් පහත දැක්වෙන විස්තර ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබිය යුතු ය :— බස් රථවල අයිතිකරුවන් විසින් ලේඛන තැබිය යුතු බව.

(අ) බස් රථය අයිතිකරුගේ ගරාජයෙන් හෝ ස්ථානයෙන් පිටවන සහ එහි ආපසු ලඟා වන දිනය හා වේලාව ;

(ආ) රියැදුරුගේ නම හා ඔහුගේ රියැදුරු බලපත්‍රයේ අංකය ; සහ

(ඇ) කොන්දොස්තරගේ නම හා කොන්දොස්තරගේ බලපත්‍රයේ අංකය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ලේඛනයෙහි කරනු ලබන සෑම සටහනක් ම, ඒ සටහන කරනු ලැබුවේ යම් බස් රථයක් සම්බන්ධයෙන් ද එහි රියැදුරු විසින් අත්සන් කරනු ලැබිය යුතු අතර, බස් රථයක් සම්බන්ධයෙන් වන විට, එහි කොන්දොස්තර විසින් ද අත්සන් කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ තබනු ලබන සෑම ලේඛනයක්ම පරීක්ෂකයකු විසින් හෝ පොලිස් නිලධාරියකු විසින් ඉල්ලනු ලැබූ කල්හි පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

**88.** යම් බස් රථයක් සම්බන්ධයෙන් නියෝගවලට අනුකූලව නිදහස් කිරීමක් ප්‍රදානය කොට ඇත්නම් මිස, සෑම බස් රථයක රියැදුරු විසින්, යම් ගමනක් සඳහා බස් රථය පාවිච්චි කරනු ලබන එක් එක් අවස්ථාව වෙනුවෙන් ඒ ගමන සම්බන්ධයෙන් 87 වන වගන්තිය යටතේ ලේඛනයෙහි කරන ලද සටහන් වල පිටපත් ඇතුළත් නියමිත ආකෘතියෙහි වූ වාර්තා පත්‍රයක් එහි ගෙන යා යුතු අතර, පොලිස් නිලධාරියකු විසින් නියම කරනු ලබන කවර හෝ විටෙක පරීක්ෂා කිරීම සඳහා එය ඉදිරිපත් කළ යුතු ය. තවද, නියම කරනු ලබන පරිදි, ඒ ගමනට සහ ආපසු ගමනට අදාළ වැඩිදුර විස්තර නියමිත ආකාරයෙන් සහ නියමිත අන්තර කාලයන්හි දී වාර්තා පත්‍රයෙහි සටහන් කළ යුතු ය. වාර්තා පත්‍ර එක් එක් බස් රථයෙහි ගෙන යා යුතු බව.

**89.** (1) (3) වන උපවගන්තියෙහි අන්‍යාකාර විධිවිධාන සලසා ඇති පරිදි හැර, යම් මගී මාර්ගයක පාවිච්චි කරනු ලබන සෑම බස් රථයකම බලපත්‍රලත් කොන්දොස්තරවරයකු සිටිය යුතු ය. බලපත්‍ර ලත් කොන්දොස්තරවරයකු බස් රථයක සිටිය යුතු බව සහ ඔහු විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම.

(2) කොන්දොස්තරවරයා විසින් "කොන්දොස්තර" යන වචනය තම ඇඳුමෙහි ප්‍රකට කොටසක පැහැදිලි ලෙස ලකුණු කරවා ගත යුතුය. නැතහොත් "කොන්දොස්තර" යන වචනය දරන පැහැදිලි අකුරින් වූ ලෝහ ලාංඡනයක් ප්‍රකට තත්ත්වයකින් පැළඳිය යුතු ය.

(3) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක බස් රථයක් කවර හෝ වේලාවක නියම කර ඇති ස්ථාන දෙකක් අතර මගීන් ගැනීමේ හෝ බෑමේ කාර්යය සඳහා වෙනත් යම් ස්ථානයක නොනවත්වා ධාවනය සඳහා යොදා ඇති විට ඒ බස් රථය සම්බන්ධයෙන් (1) වන උප වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(4) (3) වන උපවගන්තියෙහි අනුසාර විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, බස් රථයක කොන්දොස්තර විසින් සෑම මගියකුටම තමාගේ ගාස්තුව ගෙවූ කල්හි, ගමන සඳහා වූ ගාස්තුව හා ගාස්තු අදියරේ නමින් හෝ අංකයෙන් ඒ මගියාගේ ගමනාරම්භය හා ගමනාන්තය සඳහන් කෙරෙන අනුක්‍රමික අංකයක් යෙදූ ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

උපරිම පැටවුම් බර හෝ උපරිම අක්ෂ පැටවුම් බර ඉක්මවූ බඩු ලොරියක හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක ගෙන යාම.

**90.** (1) මහා මාර්ගයක ලොරියක් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් තුළ කවර වූ හෝ වේලාවක දී තිබෙන බඩුවල බර, එම ලොරිය හෝ එම මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය සඳහා වූ ආදායම් බලපත්‍රයේ සඳහන් උපරිම පැටවුම් බර හෝ උපරිම අක්ෂ පැටවුම් බර ඉක්මවන අවස්ථාවක හෝ පැටවුම් බර නිසා අනතුරක් සිදුවිය හැකි අවස්ථාවක, ලොරියේ හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයේ රියැදුරු, 109 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) පොලිස් නිලධරයකුගේ මතය අනුව, මහා මාර්ගයක යම් ලොරියක් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක්, එම ලොරිය හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය සඳහා වූ ආදායම් බලපත්‍රයෙහි සඳහන් කර ඇති යම් උපරිම පැටවුම් බර ප්‍රමාණයක් වේ ද, එම පැටවුම් බර ප්‍රමාණය ඉක්මවා බඩු ගෙන යන්නා වූ හෝ ඒ පොලිස් නිලධරයාගේ මතය අනුව යම් මහාමාර්ගයක් පාවිච්චි කරන්නකුට අනතුරුදායක වන ආකාරයකින් එහි පටවන ලද බඩු ගෙන යන්නා වූ හෝ අවස්ථාවක, ඒ පොලිස් නිලධරයා විසින් ලොරිය හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය රඳවා තබා ගැනීම, සහ —

(අ) තමාගේ මතය අනුව, ලොරිය හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය සඳහා වූ ආදායම් බලපත්‍රයෙහි සඳහන් කර ඇති යම් උපරිම පැටවුම් බර ප්‍රමාණයක් වේද, එම ලොරියේ හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය එම පැටවුම් බර ප්‍රමාණය ඉක්මවා බඩු ගෙන යන්නා වූ යම් අවස්ථාවක, එවැනි යම් අතිරික්ත බඩු හෝ එහි කොටසක් ඉවත් කිරීම හෝ ඉවත් කරනු ලැබීමට සැලැස්වීම සිදු කොට, ලොරියේ හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයේ අයිතිකරුට නැතහොත් ඒ බඩුවල අයිතිකරුට ඒ බඩු ආපසු දෙනු ලබනතුරු, ඒවායේ ආරක්ෂාව සහතික කරනු පිණිස අවශ්‍ය සියලුම පියවර ගැනීම ; හෝ

(ආ) කෙසේ වුවද, මහා මාර්ගය පාවිච්චි කරන්නකුට අනතුරුදායක වන ආකාරයකින් ලොරියක හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක බඩු පටවා ගෙන යන්නා වූ අවස්ථාවක, මහා මාර්ගය පාවිච්චි කරන්නන්ට අනතුරුදායක නොවන ආකාරයෙන් ඒ බඩු නැවත පැටවීමට සැලැස්වීම,

කළ හැකි ය.

**91.** (1) ලොරියක රියැදුරුට අමතරව එහි තැනැත්තන්ගේ පස් දෙනකුට වැඩි සංඛ්‍යාවක් ගෙන නොයා යුතු ය. තවද යම් තැනැත්තෙක් — ලොරියක ගෙන යා හැකි තැනැත්තන්.

(අ) ලොරියේ අයිතිකරු වෙතොත්, හෝ එය කුලියට ගන්නා වෙතොත් , හෝ

(ආ) ලොරියෙහි ගෙන යනු ලබන බඩුවල අයිතිකරු වෙතොත් හෝ එම බඩු කුලියට ගන්නා වෙතොත් ; හෝ

(ඇ) (අ) සහ (ආ) ඡේදවල විස්තර කරන ලද තැනැත්තන් හෙත් එන් තැනැත්තකුගේ සේවකයකු හෝ අනු යෝජිතයකු වෙතොත් මිස,

ඔහු ලොරියක එලෙස ගෙන නොයා යුතු ය :

එසේ වුවද, නියමිත නිලධාරියකු විසින්, ස්වකීය අභිමතය අනුව, යම් කාර්යය සඳහා නිකුත් කරන ලද විශේෂ අවසර පත්‍රයක බලය යටතේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල විස්තර කරන ලද තැනැත්තකුගෙන් කවර හෝ තැනැත්තන් හය දෙනෙකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් ලොරියක ගෙන යා හැකි ය ;

එසේම තවදුරටත් කොමසාරිස්වරයා විසින්, ස්වකීය අභිමතය අනුව, යම් කාර්යය සඳහා නිකුත් කරන ලද විශේෂ අවසර පත්‍රයක බලය යටතේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල විස්තර කරන ලද තැනැත්තන් නොවන කවර හෝ තැනැත්තන් සංඛ්‍යාවක් ලොරියක ගෙන යා හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම විශේෂ අවසර පත්‍රයක්ම නියමිත ආකෘතිය අනුව විය යුතු අතර, ඒ ආකෘතියෙහි දක්වා ඇති කොන්දේසිවලට යටත්විය යුතු ය.

**92.** යම් මහා මාර්ගයක ට්‍රේලරයක් ඇදනු ලැබූ යම් මෝටර් වාහනයක් පාවිච්චි කරනු ලබන අවස්ථාවක, ට්‍රේලරයෙහි හඳුනාගැනීමේ අංකයට අමතරව එය ඇදනු ලැබ ඇත්තේ යම් මෝටර් වාහනයකට ද ඒ මෝටර් වාහනයේ හඳුනා ගැනීමේ අංකය ද ට්‍රේලරයේ ප්‍රදර්ශනය කළ යුතු ය. ට්‍රේලරයේ හඳුනාගැනීමේ අංකය.

**93.** (1) (අ) මහා මාර්ගය හෝ නියමිත ප්‍රදේශයක මහා මාර්ග හෝ යම් නියමිත මහා මාර්ගයක් හෝ මහාමාර්ගයක කොටසක් සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් මෝටර් වාහන හෝ යම් නියමිත පංතියකට හෝ විස්තරයකට අයත් මෝටර් වාහන තහනම් කරමින් සීමා කරමින් හෝ පාලනය කරමින් ; මෝටර් වාහන පිළිබඳ නියෝග.

(ආ) නියමිත පංතියකට හෝ විස්තරයකට අයත් සියලු මෝටර් වාහන හෝ ඉන් කිසිවක් ඉදිකිරීම හා උපකරණ සජ්ජිත කිරීම සහ පාවිච්චි කිරීම පිළිබඳව මේ පනතේ ප්‍රකාශිත ලෙසම විධිවිධාන සලසා නොමැති යම් කොන්දේසියක් හෝ නියමයක් නියම කරමින් ;

(ඇ) සාමාන්‍යයෙන් මෝටර් වාහන විසින් හෝ යම් නියමිත පංතියකට හෝ විස්තරයකට අයත් මෝටර් වාහන විසින්, නියම කරනු ලබන යම් සීඝ්‍රතා වැඩිම නිවාරක නියමයක් අනුව කටයුතු කළ යුතු බවට විධිවිධාන සලසමින් ;

(ඈ) මෝටර් කෝච් රථවල පෙට්‍රල් තෙල් හෝ වෙනත් ඉන්ධන, අම්ල වර්ග සහ වෙනත් අන්තරායදායක හෝ පිපිරෙනසුලු ද්‍රව්‍ය ගෙන යාම තහනම් කරමින්, සීමා කරමින් හෝ විධිමත් කරමින් ;

(ඉ) මගී රථ අයිතිකරුවන් විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ මගී රථවල කොන්දොස්තරවරුන් සහ ප්‍රවේශ පත්‍ර පරීක්ෂකවරුන් සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සඳහා විධිවිධාන සලස්වමින් ;

(ඊ) බස්රථවල රියැදුරන්ගේ, කොන්දොස්තරවරුන්ගේ සහ ප්‍රවේශ පත්‍ර පරීක්ෂකවරුන්ගේ කාර්යය නියම කරමින් සහ හැසිරීම විධිමත් කරමින් ;

(උ) බස්රථ සම්බන්ධයෙන් කොන්දොස්තරවරුන් ගේ බලපත්‍ර ප්‍රදානය කිරීම සඳහා නියමිත අවම අධ්‍යාපන හෝ වෙනත් සුදුසුකම් නියම කරමින් ;

(ඌ) මේ ප්‍රඥප්තිය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් බලපත්‍රය දරන්නා වරදකරු කරනු ලැබීම මත ඒ බලපත්‍රවල කරනු ලැබිය යුතු සටහන් කිරීම සඳහා විධිවිධාන සලස්වමින් ;

(එ) බස්රථ සඳහා වූ නැවැත්වීමේ ස්ථානවල මගී පෝලිම් තැබීම විධිමත් කිරීම සහ පාලනය කිරීම, ඒ නැවැත්වීමේ ස්ථානවල තැබිය යුතු පහසුකම් සහ ඒ පහසුකම් පාවිච්චි කිරීම සඳහා කරනු ලැබිය යුතු ගාස්තු සඳහා විධිවිධාන සලස්වමින් ;

(ඒ) බස්රථ සඳහා නැවැත්වීමේ ස්ථාන හෝ පොදු නැවතුම් පොළවල් පාවිච්චි කිරීම නියම කරමින් සහ සාමාන්‍යයෙන් සියලු මහා මාර්ගවල හෝ යම් නිශ්චිත ප්‍රදේශයක මහා මාර්ගවල හෝ යම් නිශ්චිත මහා මාර්ගවල හෝ මහා මාර්ගයක කොටසක බස්රථ නතර කිරීම හෝ නැවැත්වීම සීමා කරමින් ;

(ඔ) බස්රථවල රියැදුරන් සහ කොන්දොස්තරවරුන් විසින් ලාංඡන පැළඳිය යුතු බවට විධිවිධාන සලස්වමින් ;

(ඕ) බස්රථවල මගීන්ගේ හැසිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා විධිවිධාන සලස්වමින් ;

(ක) බස් රථ සම්බන්ධයෙන් —

(i) මේ ප්‍රඥප්තිය හෝ යම් නියෝගයක යම් විධිවිධානයක් කඩකරන තැනැත්තෙකු ඒ බස්රථ රියැදුරන් හෝ කොන්දොස්තරවරුන් විසින් නැතහොත් එවැනි රියැදුරන්ගේ හෝ කොන්දොස්තරවරුන්ගේ ඉල්ලීම පිට යම් පොලිස් නිලධාරියකු විසින් හෝ එවායින් ඉවත් කිරීමේ බලය දෙමින් ;

(ii) බස්රථවල රියැදුරන් හෝ කොන්දොස්තරවරුන් විසින් මේ ප්‍රඥප්තිය හෝ යම් නියෝගයක යම් විධිවිධානයක් කඩ කරන්නේ යයි යුක්ති සහගත ලෙස සැකකරනු ලබන එවැනි මගීන්ට, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් ඉල්ලූ විට, පොලිස් නිලධාරියකු වෙත හෝ එවැනි රියැදුරන් හෝ කොන්දොස්තරවරුන් වෙත දිය යුතු යයි නියම කරමින් ;

(iii) බස් රථවල රියැදුරන් හෝ කොන්දොස්තරවරුන් විසින් එවැනි මගීන්ගෙන් තමා යාමට අදහස් කරන ගමන හෝ ගිය ගමන ප්‍රකාශ කිරීමට ද ඒ සම්පූර්ණ ගමන සඳහා ගාස්තුව ගෙවීමට හා ඒ සඳහා නියමිත ප්‍රවේශ පත්‍ර පිළිගැනීමට ඉල්ලා සිටියහොත් එසේ කිරීමට එවැනි මගීන්ට නියම කරමින් ;

(iv) බස් රථවල රියැදුරන් හෝ කොන්දොස්තරවරුන් විසින් නැතහොත් එවැනි ලියාපදිංචි අයිතිකරුවන් විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, ප්‍රවේශපත්‍ර දරන්නන් විසින් තමන් වෙත නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ගමනෙහි යෙදෙන කාලය තුළ දී ඉදිරිපත් කිරීමට හා ගමන අවසානයේ දී සමර්පණය කිරීමට නියම කරමින් ;

(v) බස් රථවල රියැදුරන් හෝ කොන්දොස්තරවරුන් විසින් බස්රථවල මගීන්ට, ඔවුන් විසින් මුදල් ගෙවනු ලැබූ විට ඒවායින් ඉවත්වන ලෙස ඉල්ලා සිටියහොත්, එසේ ඉවත්වීමට නියම කරමින් ;

(vi) ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලබන්නේ යම් කාලසීමාවක් සඳහා ද ඒ කාලසීමාව ඉකුත්වීමේ ප්‍රවේශ පත්‍ර දරන්නන් විසින් ප්‍රවේශ පත්‍ර පවාරණය කිරීම නියම කරමින් ;

(ග) යම් නියමිත ප්‍රදේශයක ඇති පොදු නැවතුම් පොළක් හෝ යම් පොදු නැවතුම් පොළක් සම්බන්ධයෙන් —

(i) පොදු නැවතුම් පොළ පාවිච්චි කිරීම විධිමත් කරමින් සහ තත්කාර්යය වෙනුවෙන් අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා බලය දෙමින් ;

(ii) ඒ අවසර පත්‍ර සඳහා අය කළ යුතු ගාස්තු සහ ඒ අවසර පත්‍ර නිකුත් කිරීම අය කරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් ප්‍රසිද්ධ කිරීමේ ආකාරය නියම කරමින් ;

(iii) මෝටර් වාහන පොදු නැවතුම් පොළට ඇතුළු විය හැකි හෝ පිටවිය හැකි ආකාරය හෝ පොදු නැවතුම් පොළ ඇතුළත මෝටර් වාහන නැවතිය යුතු ආකාරය නියම කරමින් ;

(iv) පොදු නැවතුම් පොළ පාවිච්චි කරන මෝටර් වාහනවල රියැදුරන්ගේ සහ කොන්දොස්තරවරුන්ගේ හැසිරීම විධිමත් කරමින් සහ පාලනය කරමින් ;

(v) පොදු නැවතුම් පොළෙහි මෝටර් වාහන පිරිසිදු කිරීම හෝ අළුත්වැඩියා කිරීම තහනම් කරමින් හෝ සීමා කරමින් ;

(vi) තැනැත්තන් පොදු නැවතුම් පොළට ප්‍රවේශවීම හෝ ඇතුළුවීම සීමා කරමින් සහ පොදු නැවතුම්පොළට ඇතුළුවන තැනැත්තන්ගේ හැසිරීම විධිමත් කරමින් ;

(ච) 88 වන වගන්තියෙන් නියමිත වාර්තා පත්‍රයෙහි බස්රථයක රියැදුරකු විසින් සටහන් කරනු ලැබිය යුතු විස්තර සහ ඒ විස්තර සටහන් කරනු ලැබිය යුතු ආකාරය සහ ඒවා සටහන් කරනු ලැබිය යුතු අන්තර කාලයන් නියම කරමින් ;

(ඡ) යම් බස්රථයක් සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් 87 වන හා 88 වන වගන්තිවල විධිවිධානවලින් නිදහස් කිරීමක් දෙනු ලැබිය හැක්කේ කවර අවස්ථාවල දී ද යන බව හා කවර කොන්දේසිවලට යටත්ව ද යන බව නියම කරමින් ;

(ජ) තත්කාලීනව ශ්‍රී ලංකා ආණ්ඩුවේ කාර්ය හෝ පළාත් සභාවක කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන යම් ලොරියක් හෝ මෝටර් ට්‍රයිසිකල් වැනි රථයක් සම්බන්ධයෙන් මේ කොටසේ යම් නියමිත විධිවිධානයක් අදාළ නොවිය යුතු බවට විධිවිධාන සලස්වමින්

නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) යම් පළාත් පාලන ආයතනයක් විසින් වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අතුරු ව්‍යවස්ථා හෝ නියෝග සාදනු ලැබිය හැකි යම් කාරණයක් සඳහා හෝ ඒ සම්බන්ධයෙන් ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන සීමාවක් ඇතුළත යම් ප්‍රදේශයකට අදාළ විය යුතු කිසිම නියෝගයක් පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමතිය ඇතිව හැර සාදනු නොලැබිය යුතු ය.

(3) 50 වන වගන්තිය හෝ 51 වන වගන්තිය හෝ 52 වන වගන්තිය හෝ 53 වන වගන්තිය යටතේ කිසිම නියෝගයක් මහා මාර්ග විෂයය භාර අමාත්‍යවරයාගේ හෝ පළාත් සභාවේ මහාමාර්ග විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මිස සාදනු නොලැබිය යුතු ය.

අත්හැර දමූ මෝටර් වාහන බැහැර කිරීම.

**94.** (1) මහාමාර්ගයක යම් කොටසක අත්හැර දමූ මෝටර් වාහනයක් යම් අවහිරයක් හෝ හිරිහැරයක් වන පරිදි එසේ අත් හැර දමනු ලැබ ඇති අවස්ථාවක දී කොමසාරිස්වරයා හෝ බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා හෝ පළාත් පාලන ආයතනයක හෝ සම්බන්ධිත ස්ථානය භාර පොලිස් නිලධරයකු හෝ විසින් සාමාන්‍යයෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් භාරදෙන ලද දැන්වීමක් මගින් අවහිරය හෝ හිරිහැරය ඉවත් කිරීමට පියවර ගන්නා ලෙස ඒ වාහනයේ අයිතිකරුට හෝ එය භාර තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාර දෙන ලද්දේ යම් වාහනයක අයිතිකරුවකු හෝ යම් වාහනයක් භාර තැනැත්තකු වෙත ද ඒ සෑම අයිතිකරුවකු හෝ තැනැත්තකු විසින්ම දැන්වීමෙහි දක්වා ඇති නියමයන්ට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(3) යම් හේතුවක් නිසා අත්හැර දමූ වාහනයක අයිතිකරු සොයා ගත නොහැකි නම් හැකහොත් ඔහු හෝ එය භාර තැනැත්තා (1) වන උපවගන්තිය ,යටතේ භාර දෙන ලද යම් දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින්නේ නම්, කොමසාරිස්වරයා හෝ බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා හෝ පළාත් පාලන ආයතනය හෝ පොලිස් නිලධරයා හෝ විසින් වාහනය ඉවත් කරනු ලැබීමට සැලැස්විය හැකි අතර. එය බැහැර කිරීම සඳහා අවශ්‍ය විය හැකි නියමයන් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ සද්භාවයෙන් කරන ලද යම් නියමයක් සම්බන්ධයෙන් කොමසාරිස්වරයාට හෝ බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයකුට හෝ පළාත් පාලන ආයතනයකට හෝ පොලිස් නිලධරයකුට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩු කටයුතු පැවරීම හෝ පවත්වා ගෙන යාම නොකරනු ලැබිය යුතු ය.

තරග සහ පරීක්ෂණ පැවැත්වීමට හැකි කරන නියමයන්

**94අ.** (1) පළාත තුළ යම් මෝටර් මාර්ග තරගයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට හැකි කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින්, පොලිස්පතිවරයාගේ නිර්දේශය මත, නියමයන් මගින් —

(අ) ඒ තරගය හෝ පරීක්ෂණය පවත්වනු ලබන යම් නියමිත මහා මාර්ගය හෝ මහා මාර්ග සහ යම් යාබද සහ යාවත මහා මාර්ගයක් සහ එවැනි යම් මහා මාර්ගයක කොටසක් යම් නියමිත දිනයක හෝ දිනවල හැකහොත් යම් නියමිත දිනයක හෝ දිනවල යම් නියමිත කාලයක් තුළ රථ වාහන ගමනාගමනයට වසා තැබිය යුතු බවට ;

(ආ) වේග සීමාවලට සහ පළාත තුළ මහා මාර්ගවල මෝටර් වාහන ධාවනය කිරීමට අදාළ වෙනත් ප්‍රඥප්තියක විධිවිධාන ඒ තරගයට හෝ පරීක්ෂණයට සහභාගිවන තැනැත්තන් සහ ඒ තරගයේ දී හෝ පරීක්ෂණයේ දී ධාවනය කරනු ලබන මෝටර් වාහන සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු බවට ;

(ඇ) ඒ තරගයට හෝ පරීක්ෂණයට සහභාගී වන සෑම තැනැත්තෙක් සහ තරගය හෝ පරීක්ෂණය පැවැත්වීම සඳහා වගකිව යුතු තැනැත්තන් නියමයෙහි සඳහන් සියලු කොන්දේසි අනුව කටයුතු කරන බවට

ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) ඒ තරගයේ දී හෝ පරීක්ෂණයේ දී මෝටර් වාහන පැදවීම කිරීමෙන් උද්ගත වන, සහභාගී වන්නකු නොවන වෙනත් යම් තැනැත්තකුට මරණය හෝ කායික පීඩාවක් සිදු කිරීම සම්බන්ධයෙන් හෝ එවැනි වෙනත් යම් තැනැත්තකුගේ දේපළට අලාභ සිදු කිරීම සම්බන්ධයෙන් දරනු ලැබිය හැකි යම් වගකීමකට ප්‍රතිපත්තිව තරගයට හෝ පරීක්ෂණයට සහභාගිවන සෑම මෝටර් වාහනයක අයිතිකරු සහ සෑම සහභාගිවන්නකු රක්ෂණය කෙරෙන බලාත්මකව ඇති රක්ෂණ ඔප්පුවක් ඇති බවට අමාත්‍යවරයා සෑහීමට පත් වන්නේ නම් මිස, යම් මාර්ග තරගයක් හෝ පරීක්ෂණයක කාර්ය සඳහා (1) වන උපවගන්තිය යටතේ කිසිම නියමයක් කරනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නියමයක් බල සහිතවීමට යටත් පිරිසෙයින් පැහැදිලි දින දෙකකට පෙර, කොමසාරිස්වරයා විසින් යටත් පිරිසෙයින් දිනපතා ප්‍රවෘත්ති පත්‍ර දෙකක පළ කෙරෙන දැන්වීමක් මඟින්, තරගය හෝ පරීක්ෂණය පවත්වනු ලබන බව සහ යම් මහා මාර්ගයක් හෝ මහා මාර්ගයක කොටසක් රථ වාහන ගමනාගමනය සඳහා වසා තබනු ලබන බවට දැන්වීමක් දෙනු ලැබිය යුතු ය. (1) වන උපවගන්තිය යටතේ වූ නියමය කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ ඉල්ලීම මත ද ඒ තැනැත්තා විසින්, ඒ එක් එක් දැන්වීම සම්බන්ධයෙන් ගාස්තුව ගෙවනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයකින් රථ වාහන ගමනාගමනය සඳහා වසා තබන ලද යම් මහා මාර්ගයකින් හෝ මහා මාර්ගයක කොටසකින් ඉවත්වීමට හෝ තම භාරයේ ඇති යම් වාහනයක් එවැනි යම් මහා මාර්ගයකින් හෝ මහා මාර්ගයක කොටසකින් ඉවත් කිරීමට යම් පොලිස් නිලධාරියකු විසින් නියම කරනු ලැබූ විට, එසේ කිරීමට ප්‍රතික්ෂේප කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

(5) මේ ප්‍රඥප්තියේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක ඇතුළත් යම් විධානයක් බල සහිත විය යුතු ය. තවද, එවැනි යම් විධානයක් කඩ කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු ය.

**95.** (1) යම් මෝටර් වාහනයක යාන්ත්‍රික තත්ත්වය හෝ ඒට සවි කරන ලද ටයර්වල තත්ත්වය නිසැක වශයෙන් දැන ගැනීමේ කාර්යය සඳහා යම් පරීක්ෂකවරයකු විසින් හෝ බලයලත් නිලධාරියකු විසින් — මෝටර් වාහන සෝදිසි කිරීමේ සහ පරීක්ෂා කිරීමේ බලය.

(අ) මහා මාර්ගයක මෝටර් වාහනයක් හෝ එහි සවි කරනු ලැබූ යම් රෝදයක් හෝ සුදුසු තත්ත්වයක නොපවතින බව විශ්වාස කිරීමට හිතුව සාධාරණ හේතු තිබේ නම්, ඒ වාහනය නවත්වනු ලැබිය හැකි ය ;
තවද —

(i) නියමයෙහි නිශ්චිතව දක්වා ඇති රියැදුරුට පහසු යම් ස්ථානයක දී වාහනය පරීක්ෂණය සඳහා ඉදිරිපත් කිරීමට වාහනයේ රියැදුරුට ලිඛිත නියමයකින් විධාන කළ හැකි ය ; හෝ

(ii) ඒ පරීක්ෂණයේ කාර්යය සඳහා වාහනය රඳවා තැබිය හැකි ය ;
තවද

(ආ) මෝටර් වාහනය යම් අනතුරකට සම්බන්ධව වී ඇති හෝ අනතුරකට සම්බන්ධව වී ඇතැයි සැක කරනු ලබන යම් අවස්ථාවක, එය නවර ස්ථානයක තිබුණ ද, එයට ඇතුළු වීම, පරීක්ෂා කිරීම සහ සෝදිසි කිරීම කරනු ලැබිය හැකි ය. තවද, ඒ කාර්යය සඳහා එය නැවැත්වීමට නියම කරනු ලැබිය හැකි ය. තැනහොත් තත් කාලයෙහි වාහනය තබා ඇති හෝ තබා ඇත්තේ යයි සැක කරනු ලබන නවර හෝ ස්ථානයකට ඇතුළු විය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ යම් පරීක්ෂකවරයකු විසින් හෝ බලයලත් නිලධරයකු විසින් හෝ නිකුත් කරන ලද සෑම නියමයක පිටපතක්, මෝටර් වාහනයේ රියදුරු විසින් නම් කරනු ලැබුවා වූ සහ නියමයෙහි සඳහන් කරනු ලැබුවා වූ ස්ථානය පිහිටියේ යම් ප්‍රදේශයක් ඇතුළත ද ඒ ප්‍රදේශය වෙනුවෙන් පත් කරන ලද පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. නැතහොත් සම්පූර්ණ විස්තර ඔහු විසින් නොපමාව පරීක්ෂකවරයාට දැන්විය යුතු ය.

(3) වාහනයේ අයිතිකරු විසින් හෝ රියැදුරු විසින් ඉල්ලා සිටි විට, කොමසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා තමාට නිකුත් කරන ලද ලිඛිත අධිකාරයක් පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂකවරයා විසින් ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ නවර හෝ වේලාවක දී යම් මෝටර් වාහනයක් නැවැත්වීම ඊට ඇතුළුවීම හෝ පරීක්ෂා කිරීම පරීක්ෂකවරයකු විසින් නොකළ යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා පරීක්ෂා කිරීම පිණිස මෝටර් වාහනයක් ඉදිරිපත් කර ඇත්තේ යම් පරීක්ෂකවරයකු වෙත ද ඒ පරීක්ෂකවරයා විසින් පැය හයකට වඩා දීර්ඝ කාලයක් එම වාහනය රඳවා නොගත යුතුය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා 'බලයලත් නිලධරයා' යන්නෙන් —

(අ) පොලිස් සැරයන්වරයකුගේ නිලයක සහ ඉන් ඉහළ නිලයක යම් පොලිස් නිලධරයෙක් ; හෝ

(ආ) පොලිස්පතිවරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද වෙනත් යම් පොලිස් නිලධරයෙක් ; හෝ

(ඇ) කොමසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද යම් නිලධරයෙක්

අදහස් වේ.

මෝටර් වාහන පරීක්ෂා කිරීමේ සහ සෝදිසි කිරීම නියම කිරීමට කොමසාරිස්වරයාගේ බලය.

96. (1) කොමසාරිස්වරයා විසින්, මෝටර් වාහනයක් ලියාපදිංචි කිරීමට පෙර වුවද, පසුව වුවද යම් අවස්ථාවක තමා විසින් සඳහන් කරනු ලබන යම් පහසු ස්ථානයකට මෝටර් වාහනය ගෙන එනු ලැබීමට ද එය පරීක්ෂා කරනු ලැබීමට සහ විභාග කරනු ලැබීමට ද නියම කරනු ලැබිය හැකි ය. තවද අවශ්‍ය වුවහොත් —

(අ) මෝටර් වාහනය මේ පනතේ හෝ යම් නියෝගයක නියමයන්ට අනුකූල නොවන බව ;

(ආ) මෝටර් වාහනය සම්බන්ධයෙන් තමා වෙත සපයන ලද තොරතුරු කිසිවක් අසත්‍ය හෝ සාවද්‍ය බව ;

(ඇ) මෝටර් වාහනය සේවයෙහි යෙදවිය හැකි තත්ත්වයකින් නොවන බව ;

(ඈ) මෝටර් වාහනය ලියාපදිංචි කිරීමෙන් පසුව, මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ අධිකාරියේ පූර්ව අනුමතිය නොමැතිව එහි බර, පරිමාණය, ස්වභාවය හෝ ආසන ඉඩකඩ වෙනස් කරනු ලැබ ඇති බව විශ්වාස කිරීමට තමාට හේතු ඇත්නම් එහි බර කිරීම සහ මැනීම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මෝටර් වාහනයක් විභාග කිරීමෙන් හා පරීක්ෂා කිරීමෙන් පසුව, එම වාහනය මේ ප්‍රඥප්තියේ හෝ යම් නියෝගයක නියමයන්ට අනුකූලව ක්‍රියා කර නොමැති බවට හෝ එම වාහනය සේවා ගත කළ හැකි තත්ත්වයක නොපවතින බවට හෝ එම වාහනයේ බර, පරිමාණ, ස්වභාවය හෝ ආසන ඉඩකඩ, ලියාපදිංචි කිරීමෙන් පසු පූර්ව අනුමතිය නොමැතිව වෙනස් කර ඇති බවට හෝ කොමසාරිස්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, එම අයිතිකරු වෙත කර දෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින් ඔහු විසින් දැන්වීමෙහි සඳහන් දෝෂ ඉවත් කර ඇති බව එම උපවගන්තිය යටතේ වැඩිදුර විභාග කිරීමෙන් හා පරීක්ෂා කිරීමෙන් පසු කොමසාරිස්වරයා සෑහීමට පත්වන තුරු, එම වාහනය පාවිච්චි කිරීම තහනම් කරනු ලැබිය හැකි ය. එසේ සෑහීමට පත්වන අවස්ථාවක කොමසාරිස්වරයා විසින් දැන්වීම ප්‍රත්‍යාදේශ කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ දැන්වීමකින් මෝටර් වාහනයක් පාවිච්චි කිරීම තහනම් කරනු ලැබ ඇති අවස්ථාවක, දැන්වීම ඒ වගන්තිය යටතේ ප්‍රත්‍යාදේශ කරනු ලබන තෙක්, කිසිම තැනැත්තකු විසින් ඒ මෝටර් වාහනය පාවිච්චි කරනු ලැබීමට සැලැස්වීම හෝ අවසර දීම හෝ නොකළ යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් මෝටර් වාහනයක් පාවිච්චි කිරීම තහනම් කරනු ලැබ ඇති අවස්ථාවක, දැන්වීම ප්‍රත්‍යාදේශ කරන තුරු, ආදායම් බලපත්‍රය පරිරෝධ කළ හැකි වන පරිදි එය පවාරණය කරන ලෙස ඒ වාහනයේ ලියාපදිංචි අයිතිකරුට කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් නියම කරනු ලැබිය හැකි අතර, එවැනි නියමයක් කරන ලද්දේ නම්, ඒ ලියාපදිංචි අයිතිකරු විසින් තමාවෙත එය දන්වනු ලැබූ දින සිට දින දහයක් ඇතුළත ඊට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

(5) (3) වන උපවගන්තියේ විධිවිධාන කඩ කිරීමේ වරදට වරදකරු වන යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හා දෙවන හෝ තදනන්තර වරදකරු කරනු ලැබීමකට, රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු ය.

අනුමත ගරාජ සහ අනුමත ලොරි පරීක්ෂකවරයන්.

**97.** (1) රජයට, ආණ්ඩුවකට හෝ පළාත් සභාවකට හෝ අර්ධ ආණ්ඩු හෝ පළාත් පාලන මණ්ඩලයකට හෝ පෞද්ගලික සමාගමකට හෝ පුද්ගලයකුට අයත් වූ ගරාජයක් විසින් නියමිත ආකෘතියෙහි තත්කාර්යය සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට හා නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට, කොමසාරිස්වරයා විසින්, නියමයක් මගින්—

(අ) නියමයෙහි සඳහන් ඒ තැනැත්තාගේ සෑම ගරාජයක් හෝ වෙනත් ව්‍යාපාරික ස්ථානයක්ම, මෝටර් කෝච් රථ හා ලොරි සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීමට පෙර, ඒවා 8 වන වගන්තියෙන් නියමිත වාර්ෂිකව පරීක්ෂා කිරීමේ හා සහතික කිරීමේ කාර්ය සඳහා අනුමත ගරාජයක් බව ; සහ

(ආ) ඒ නියමයෙහි සඳහන් එවැනි යම් ගරාජයක සේවයෙහි නියුක්ත කරන ලද ඒ තැනැත්තා සහ වෙනත් සෑම තැනැත්තකුම, එම ගරාජයේ මෝටර් කෝච් රථ හා ලොරි පරීක්ෂා කිරීමේ හා සහතික කිරීමේ කාර්ය සඳහා එක් එක් තැනැත්තා අනුමත කරන ලද පරීක්ෂකවරයකු බව

ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

යම් අනුමත කළ ගරාජයකට හෝ අනුමත කළ පරීක්ෂකවරයකුට නිකුත් කරන ලද බලය දීමේ ලිපියක දක්වා ඇති කොන්දේසි අතුරින් යම් කොන්දේසියක් කඩකිරීමක් සිදු වී ඇති නම් මේ වගන්තිය යටතේ කරන ලද යම් නියමයක් කොමසාරිස්වරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ වෙනස් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක සඳහන් එක් එක් අනුමත ගරාජයක් සම්බන්ධයෙන් අවුරුද්දක් තුළ දී එම ගරාජයේ පරීක්ෂා කරනු ලැබිය හැකි සහ සහතික කරනු ලැබිය හැකි උපරිම වාහන සංඛ්‍යාව කොමසාරිස්වරයා විසින් ඒ නියමයෙන් නියම කරනු ලැබිය හැකි ය.

මෝටර් කෝච් රථ ආදිය සඳහා සහතික නිකුත් කිරීම.

98. (1) මෝටර් කෝච් රථයක්, මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක්, ලොරියක්, මෝටර් අවමංගල්‍ය රථයක් හෝ මෝටර් ගිලන් රථයක් සම්බන්ධයෙන් 6 වන වගන්තියෙහි සඳහන් සහතිකය ලබා ගැනීමේ කාර්යය සඳහා එය නියම බලධරයකු ඉදිරියේ ඉදිරිපත් කරනු ලැබූ විට, එම බලධරයා විසින්, එවැනි විභාගයක් කිරීමක් සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට එය විභාග කරනු ලැබිය යුතු අතර, එය පාවිච්චිය සඳහා යෝග්‍ය ද නැද්ද යන බව ලියවිල්ලකින් සහතික කරනු ලැබිය යුතු ය. මේ උප වගන්තිය යටතේ පරීක්ෂා කරන ලද යම් මෝටර් වාහනයක් පාවිච්චි කිරීම සඳහා යෝග්‍ය බවට වූ සහතිකයක් "යෝග්‍යතා සහතිකයක්" යනුවෙන් මේ ප්‍රඥප්තියේ සඳහන් කරනු ලැබේ.

(2) යම් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් යෝග්‍යතා සහතිකයක් නිකුත් කිරීමේ දී, එම මෝටර් වාහනය පාවිච්චි කිරීමට අදාළව මහජන ආරක්ෂාව සඳහා අවශ්‍ය යයි තමා සලකන කොන්දේසි නියම බලධරයකු විසින් එහි ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(3) යම් මෝටර් කෝච් රථයක්, මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක්, ලොරියක්, මෝටර් අවමංගල්‍ය රථයක් හෝ මෝටර් ගිලන් රථයක් පාවිච්චි කිරීම සඳහා නුසුදුසු බවට සහතික කිරීමේ දී නියම බලධරයා විසින් ඒ සඳහා තමාගේ හේතු දැක්විය යුතු ය.

(4) යම් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වූ යෝග්‍යතා සහතිකයක්—

(අ) එම මෝටර් වාහනය ලොරියක්, මෝටර් අවමංගල්‍ය රථයක් හෝ මෝටර් ගිලන් රථයක් නම්, එය නිකුත් කළ දිනයේ සිට අවුරුද්දක් සඳහා බලාත්මකව තිබිය යුතු ය ; තවද

(ආ) එම මෝටර් වාහනය මෝටර් කෝච් රථයක් නම්, එය නිකුත් කළ දිනයේ සිට අවුරුද්දක් සඳහා හෝ ඒ සහතිකයේ සඳහන් කරනු ලැබිය හැකි මාස ගණනකට නොඅඩු වූ වඩා කෙටි කාලයක් සඳහා හෝ බලාත්මකව තිබිය යුතුය.

(5) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ පරීක්ෂා කිරීමෙන් පසු, පාවිච්චි කිරීම සඳහා නුසුදුසු බවට සහතික කරනු ලැබූ යම් මෝටර් කෝච් රථයක, මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක, ලොරියක, මෝටර් අවමංගල්‍ය රථයක හෝ මෝටර් ගිලන් රථයක ලියාපදිංචි අයිතිකරු විසින් නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු, ඒ සහතිකය නිකුත් කිරීමට විරුද්ධව කොමසාරිස්වරයා වෙත අභියාචනයක් කළ හැකි අතර, ඒ අභියාචනය සම්බන්ධයෙන් කොමසාරිස්වරයාගේ තීරණය අවසානාත්මක වන්නේ ය.

(6) මේ වගන්තිය යටතේ යම් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද යෝග්‍යතා සහතිකය —

(අ) එම මෝටර් වාහනයේ ගෙන යා යුතු ය ; තව ද

(ආ) පොලිස් නිලධරයකු, ග්‍රාමසේවා නිලධරයකු හෝ මේ ප්‍රඥප්තිය යටතේ පත් කරන ලද පරීක්ෂකවරයෙකු නැතහොත් සහතික කරන නිලධරයකු හෝ කොමසාරිස්වරයා විසින් ලියවිල්ලක් මඟින් බලය පවරන ලද යම් තැනැත්තකු හෝ විසින් ඉල්ලා සිටි විට පරීක්ෂා කිරීම සඳහා ඉඩ සැලසිය යුතු ය.

එසේ වුවද ඉදිරිපත් කරන ලෙස අධිකරණයක් හෝ කොමසාරිස්වරයා හෝ බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයෙකු හෝ විසින් නියම කරනු ලැබූ විට ඒ සහතිකය ඒ මෝටර් වාහනයෙන් ඉවත් කොට ඉදිරිපත් කළ යුතු ය.

(7) මේ වගන්තියේ "හිමි බලධරයා" යන යෙදුමෙන් මේ ප්‍රඥප්තිය යටතේ පත් කරන ලද සහතික කිරීමේ බලධරයකු නැතහොත් මෝටර් වාහන පරීක්ෂකයකු හෝ 97 වන වගන්තිය සහ මේ වගන්තියේ කාර්ය සඳහා කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද පරීක්ෂකවරයෙකු හෝ අදහස් වේ.

**98අ.** 98 වන වගන්තියේ කුමක් සඳහන් වුව ද, 6 වන වගන්තියේ සඳහන් යම් මෝටර් වාහනයක් සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර, ඒ මෝටර් වාහනය වාර්ෂිකව පරීක්ෂා කිරීම හා සහතික කිරීම, අවස්ථාවෝචිත පරිදි, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයට හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයකට අයත් මෝටර් වාහන සම්බන්ධයෙන් අදාළ මණ්ඩලය විසින් ඒ වෙනුවෙන් බලය පවරන ලද යම් නිලධරයකු විසින් කරනු ලැබිය යුතු අතර එවැනි යම් වාහනයක් සම්බන්ධයෙන් එවැනි යම් නිලධරයකු විසින් නිකුත් කරන ලද යෝග්‍යතා සහතිකයක්, මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා 98 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක වාහන සම්බන්ධයෙන් වාර්ෂික පරීක්ෂා කිරීම හා සහතික කිරීම.

**99.** (1) මෙහි පහත දැක්වෙන පැනිවලට හෝ විස්තරවලට අයත් සියලු මෝටර් වාහනවලට, එනම් මෝටර් ටුවිසිකල් වැනි රථ, මෝටර් කෝච් රථ සහ ලොරිවලට, මේ වගන්තිය අදාළ විය යුතු අතර, "මේ වගන්තිය අදාළ වන මෝටර් වාහනය" යන යෙදුම මේ වගන්තියේ කවර වූ තැනක යෙදුන ද එය ඒ අනුව තේරුම් ගත යුතු ය.

මෝටර් ටුවිසිකල් වැනි රථ, මෝටර් කෝච් රථ සහ ලොරි පරීක්ෂා කිරීම සහ ඒවායේ පැවිච්චිය සහතික කිරීම.

(2) මේ වගන්තිය අදාළ වන යම් මෝටර් වාහනයක් පාවිච්චි කරනු ලබන්නේ යම් ප්‍රදේශයක් ඇතුළත ද ඒ ප්‍රදේශයේ බලපත්‍ර නිකුත් කරන බලධරයාට එම වාහනය පාවිච්චි කිරීම සඳහා සුදුසු බව තහවුරු කිරීමට හේතු ඇත්නම් නියමයෙහි සඳහන් කරනු ලබන යම් වේලාවක සහ ස්ථානයකට පරීක්ෂා කිරීම සඳහා වාහනය ඉදිරිපත් කරන ලෙස ඔහු විසින් වාහනයේ ලියාපදිංචි අයිතිකරුට ලිඛිත නියමයක් මඟින් විධාන කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ මෝටර් වාහනයක් සම්බන්ධයෙන් කරන ලද යම් නියමයක් අනුව ලියාපදිංචි අයිතිකරු විසින් කටයුතු කරනු ලැබ නොමැති අවස්ථාවක, දක්වීමෙහි සඳහන් කරනු ලබන යම් වේලාවක සහ ස්ථානයකට හෝ ලියාපදිංචි අයිතිකරු විසින් තත්කාර්යය සඳහා කරන ලද ඉල්ලීමක් මත බලපත්‍ර නිකුත් කරන බලධරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් වේලාවක සහ

ස්ථානයකට පරීක්ෂා කිරීම සඳහා වාහනය ඉදිරිපත් කරනු ලබන තෙක්, බලපත්‍ර නිකුත් කරන බලධරයා විසින් ස්වකීය අභිමතය අනුව ලිඛිත දැන්වීමක් මඟින් ඒ වාහනය පාවිච්චි කිරීම තහනම් කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය අදාළ වන මෝටර් වාහනයක් පරීක්ෂා කරනු ලැබීමේ දී පාවිච්චි කිරීම සඳහා නුසුදුසු යයි තීරණය කරනු ලබන අවස්ථාවක, පරීක්ෂකවරයා විසින් වාහනයෙහි සොයා ගන්නා ලද සියලු දෝෂ සම්බන්ධයෙන් සම්පූර්ණ ලැයිස්තුවක් පරීක්ෂකවරයා විසින් තම වාර්තාවට ඇමිණිය යුතු අතර, එම වාර්තාවේ සහ ලැයිස්තුවේ පිටපතක් ලියාපදිංචි අයිතිකරුට, බලපත්‍ර නිකුත් කරන බලධරයාට සහ කොමසාරිස්වරයාට භාර දිය යුතු ය. නැතහොත් ඉදිරිපත් කළ යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ යම් මෝටර් වාහනයක් පරීක්ෂා කිරීමෙන් පසුව, එය පාවිච්චි කිරීම සඳහා නුසුදුසු බව පරීක්ෂකවරයාගේ තීරණය වන අවස්ථාවක, සියලු අවශ්‍ය අළුත්වැඩියා කිරීම්, ගැලපුම් හෝ වෙනස් කිරීම් ක්‍රියාත්මක කොට පරීක්ෂකවරයකු විසින්, වැඩිදුර පරීක්ෂා කිරීමෙන් පසුව, පාවිච්චි කිරීම සඳහා වාහනය සුදුසු බවට බලපත්‍ර නිකුත් කරන බලධරයාට සහතික කරනු ලබන තෙක්, බලපත්‍ර නිකුත් කරන බලධරයා විසින් ලිඛිත දැන්වීමක් මඟින් ඒ වාහනය පාවිච්චි කිරීම තහනම් කළ යුතු ය.

(6) මේ වගන්තිය අදාළ වන්නා වූ සහ (5) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් මඟින් පාවිච්චි කිරීම තහනම් කරනු ලැබ ඇත්තා වූ, යම් මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු විසින්, වාහනය පාවිච්චි කිරීම සඳහා නුසුදුසු බවට (4) වන උපවගන්තියෙහි සඳහන් පළමුවන පරීක්ෂණයෙන් පසුව වුව ද නැතහොත් (5) වන උපවගන්තියෙහි සඳහන් වැඩිදුර පරීක්ෂණයෙන් පසුව වුව ද, පරීක්ෂකවරයාගේ තීරණයට විරුද්ධව කොමසාරිස් වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(7) (6) වන උපවගන්තිය යටතේ යම් අභියාචනයක් කරනු ලැබූ විට, අභියාචනය ඉදිරිපත් කර ඇත්තේ යම් පරීක්ෂකවරයකුගේ තීරණයකට විරුද්ධව ද ඒ පරීක්ෂකවරයා හැර වෙනත් යම් පරීක්ෂකවරයකු මඟින්, කොමසාරිස්වරයා විසින්, ස්වකීය අභිමතය අනුව අභියාචනයට අදාළ මෝටර් වාහනය පරීක්ෂා කිරීමට සැලැස්විය යුතු ය. තව ද ඒ තීරණය ස්ථිර කළ හැකි ය. නැතහොත් ඒ තීරණය ප්‍රතිවර්තනය කොට වාහනය පාවිච්චි කිරීම සඳහා සුදුසු බවට සහතික කරනු ලැබිය හැකි ය. එවැනි යම් අභියාචනයක් පිළිබඳ කොමසාරිස්වරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

(8) මේ වගන්තිය අදාළ වන්නා වූ සහ (5) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් මඟින් පාවිච්චි කිරීම තහනම් කරනු ලැබ ඇත්තා වූ යම් මෝටර් වාහනයක්, ඒ වගන්තියේ සඳහන් වැඩිදුර පරීක්ෂණයකින් පසුව පරීක්ෂකවරයකු විසින් හෝ (7) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් හෝ පාවිච්චි කිරීම සුදුසු බවට සහතික කරනු ලැබ ඇති අවස්ථාවක, දැන්වීම නිකුත් කරනු ලැබූ බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින් එම දැන්වීම ප්‍රත්‍යාදිෂ්ට කළ යුතු ය.

(9) මේ වගන්තිය අදාළ වන මෝටර් වාහනයක පාවිච්චිය (5) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් මඟින් තහනම් කර ඇති අවස්ථාවක —

(අ) ඒ දැන්වීම, (8) වන උපවගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ට කරන තෙක් කිසිදු තැනැත්තකු විසින් ඒ වාහනය පාවිච්චි කිරීම හෝ ඒ වාහනය පාවිච්චි කිරීමට සැලැස්වීම නොකළ යුතු ය. තව ද

(ආ) දැක්වීම එසේ ප්‍රතික්ෂේප කරන තෙක් ඒ වාහනයේ ආදායම් බලපත්‍රය පරිරෝධ කිරීම පිණිස, ඒ බලපත්‍රය තමා වෙත පවරාණය කරන ලෙස, ඒ වාහනය සඳහා ආදායම් බලපත්‍රය නිකුත් කළ බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින්, වාහනයේ ලියාපදිංචි අයිතිකරුට ලියවිල්ලක් මගින් නියම කළ හැකි අතර එවැනි නියමයක් කරනු ලැබුවහොත් ඒ නියමය තමා වෙත දන්වනු ලැබී දින දහයක් ඇතුළත, ලියාපදිංචි අයිතිකරු විසින්, ඒ නියමය අනුව ක්‍රියා කළ යුතු ය.

(10) මේ වගන්තිය යටතේ මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වූ සෑම පරීක්ෂණයක් ම, පරීක්ෂකවරයකු විසින් ක්‍රියාත්මක කළ යුතු අතර, බලපත්‍ර නිකුත් කරන බලධරයාගේ හෝ කොමසාරිස්වරයාගේ ඉල්ලීම මත විනා, කිසිම පරීක්ෂකවරයකු විසින් එවැනි යම් පරීක්ෂණයක් ක්‍රියාත්මක නොකළ යුතු ය.

(11) මේ වගන්තිය යටතේ පරීක්ෂා කරනු ලැබූ සෑම මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු විසින්, (4) වන උපවගන්තියේ හෝ (5) වන උපවගන්තියේ හෝ (7) වන උපවගන්තියේ කාර්යය සඳහා ක්‍රියාත්මක කරන ලද එක් එක් පරීක්ෂණය වෙනුවෙන් නියමිත ගාස්තුවක් ගෙවිය යුතු ය.

100. (1) පරීක්ෂකවරයකුට අවශ්‍ය වුවහොත් ස්වකීය අධිකාර බලය ඉදිරිපත් කර, සවස හෝ වේලාවක දී යම් ලොරියකට නැතහොත් මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයකට ඇතුළුවීමට සහ එය පරීක්ෂා කිරීමට ද එම කාර්යය සඳහා ඒ ලොරිය නැතහොත් මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය සාධාරණ කාලයකට එය රඳවා තබා ගැනීමට ද හිමිකම් තිබිය යුතු අතර ලොරියක් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් තමා ඇතුළු විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති යම් ස්ථානයකට, කාරණයකට අදාළ අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන, සවස හෝ යුක්ති සහගත වේලාවක දී ඔහු විසින් ඇතුළුවිය හැකි ය. යම් තැනැත්තෙක්, පරීක්ෂකවරයකුගේ කාර්යය ඉටු කිරීමේ දී ඔහුට අවහිර කරන්නේ නම් හෝ ලොරිය නැතහොත් මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය නැවැත්වීමට නියම කරනු ලැබූ විට එසේ නැවැත්වීම පැහැර හරින්නේ නම් ඒ තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

ලොරි සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ පරීක්ෂා කිරීම සහ ඒවායේ පාවිච්චිය තහනම් කිරීම.

(2) ලොරියක් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් (1) වන උපවගන්තිය යටතේ පරීක්ෂා කිරීමේ දී ඒ ලොරියේ හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයේ ඇති යම් දෝෂ නිසා, ඒ දෝෂවලට පිළියම් යොදන තුරු ඒ ලොරිය හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය සේවය සඳහා නුසුදුසු බව හෝ නුසුදුසු බවට පත්වීමට ඉඩ ඇති බව පරීක්ෂකවරයාට පෙනී ගියහොත් එම ලොරිය හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය පාවිච්චි කිරීම ඔහු විසින් තහනම් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, පරීක්ෂකවරයාගේ මතය අනුව, ඒ දෝෂ දවස් දහයකට වැඩි නොවන යම් කාලසීමාවක් ඇතුළත පිළියම් කළ හැකි දෝෂ වන්නා වූ ද මහජන ආරක්ෂාවට ක්ෂණික අවදානමක් ඇති කරන දෝෂ නොවන්නා වූ ද අවස්ථාවක එම කාලසීමාව ඉකුත් වීමට පෙර, තහනම ක්‍රියාත්මක නොවිය යුතු අතර, ඒ දෝෂවලට පිළියම් යොදා ඇති බවට හෝ යොදා නොමැති බවට සෑහීමකට පත් වූ යම් පරීක්ෂකවරයකු විසින් ඒ කාලසීමාව ඉකුත් වීමට පෙර ඒ තහනම අස් කරගතහොත් ඒ කාල සීමාව ඉකුත් වූ විට ද තහනම ක්‍රියාත්මක නොවිය යුතු ය.

(3) ලොරියක් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් පාවිච්චි කිරීම, පරීක්ෂකවරයකු විසින් මේ වගන්තිය යටතේ ඉහත සඳහන් පරිදි තහනම් කරනු ලැබූ අවස්ථාවක, ඔහු විසින් ඒ තහනම පිළිබඳව, ලොරියේ හෝ මෝටර් ට්‍රයිසිකල්

වෑන් රථයේ ලියාපදිංචි අයිතිකරුට ද, පරීක්ෂා කරන අවස්ථාවේ එය භාරව සිටින තැනැත්තාට ද, කොමසාරිස්වරයාට ද නියමිත ආකෘතියෙහි වූ දැන්වීමක් අප්‍රමාදව දිය යුතු ය.

මෙයට ඉහත උපවගන්තියේ අතුරු වගන්තියේ නිශ්චය කොට දක්වා ඇති දෝෂවල හේතුව මත වූ තහනම් කිරීමක් සම්බන්ධයෙන් වන විට මේ උපවගන්තිය යටතේ දෙනු ලබන දැන්වීමක, පරීක්ෂකවරයාගේ මතය අනුව දෝෂවලට පිළියම් යෙදිය හැකි කාලසීමාව නිශ්චිතව සඳහන් කළ යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වූ තහනම් කිරීමක්, ඒ පිළිබඳ දැන්වීම, ලොරියේ හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයේ හෝ ලියාපදිංචි අයිතිකරුට නැතහොත් එය භාරව සිටින තැනැත්තාට දෙනු ලැබූ විගස, (2) වන උපවගන්තියේ සලසා ඇති විධිවිධානවලට යටත්ව, ක්‍රියාත්මක වන අතර එතැන් සිට මෙහි මින් මතු දැක්වෙන විධිවිධානවලට අනුකූලව ඉවත් කරනු ලබන තෙක් ඒ තහනම බල පැවැත්විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ වූ ක්‍රියාත්මක වී ඇති තහනම් කිරීමක් යම් පරීක්ෂකවරයකු විසින් එම ලොරිය හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය සේවය සඳහා සුදුසු බවට ඔහු සෑහීමකට පත්වුවහොත්, ඉවත් කළ හැකි ය.

(6) තහනමක් ඉවත් කිරීමට පරීක්ෂකවරයකු විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් අතෘප්තියට පත් තැනැත්තකු විසින්, එම ලොරිය හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය පරීක්ෂා කිරීම සඳහා කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ නිලධරයකු ලවා පරීක්ෂා කරවා ගැනීමට කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් කළ හැකි ය. එවැනි ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාරණය තමා වෙත යොමු කරනු ලැබූ විට, එම ලොරිය හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය සේවයට සුදුසු යයි ඒ නිලධරයා සලකන්නේ නම් ඔහු විසින් ඒ තහනම ඉවත් කළ යුතු ය.

(7) කොමසාරිස්වරයා විසින් බලය දෙන ලද නිලධරයකු විසින් තහනමක් ඉවත් කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් අතෘප්තියට පත් තැනැත්තකු විසින්, නියමිත කාලය ඇතුළත සහ නියමිත ආකාරයට කොමසාරිස්වරයා වෙත අයාචනය කළ හැකි ය. එසේ අයාචනය කළ විට ඒ අයාචනය සම්බන්ධයෙන් යෝග්‍ය යැයි තමා සලකන නියමයක් කිරීමට කොමසාරිස්වරයාට බලය තිබිය යුතු අතර, එවැනි යම් නිගමනයක්, ඒ නිලධරයා කෙරෙහි අනුගාමී විය යුතු ය.

(8) යම් පරීක්ෂකවරයකු හෝ කොමසාරිස්වරයා විසින් බලය දෙනු ලැබූ නිලධරයකු හෝ විසින් තහනමක් අත්හැර ගන්නා ලද හෝ ඉවත්කර ගන්නා ලද අවස්ථාවක අත්හැර ගැනීම හෝ ඉවත්කර ගැනීම පිළිබඳව, ඔහු විසින් ලොරියේ හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයේ හෝ ලියාපදිංචි අයිතිකරුට සහ කොමසාරිස්වරයාට අප්‍රමාදව දැන්වීමක් කළ යුතු ය.

(9) මේ වගන්තිය යටතේ වූ තහනමක්, ලොරියක් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් හෝ සම්බන්ධයෙන් ක්‍රියාත්මකව පවතින විට, කිසිදු තැනැත්තකු විසින් ඒ ලොරිය හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය පාවිච්චි කිරීම හෝ පාවිච්චි කිරීමට සැලැස්වීම නැතහොත් ඉඩදීම හෝ නොකළ යුතු ය.

(10) (9) වන උපවගන්තියේ විධිවිධාන කඩ කිරීමේ වරදට වරදකරු වන යම් තැනැත්තෙක් මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයක දී වරදකරු කරනු ලැබූ විට, පළමු වරට කරනු ලැබූ වරද සම්බන්ධයෙන් වූ විට, රුපියල් දෙසිය පණහකට නොවැඩි දඩයකට හා දෙ වන වරට කරනු ලබන හෝ

සඳහන්කර වරදක් සම්බන්ධයෙන් වූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම ද යටත් විය යුතු ය.

ලොරිවල සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථවල පැටවුම් බර සහ මෝටර් වාහනවල ගෙන යන තැනැත්තන් හෝ මගීන් සංඛ්‍යාව නිශ්චය කිරීමට ඇති බලය.

**101.** (1) යම් ලොරියක හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක සම්පූර්ණ පැටවුම් බර හෝ අක්ෂ පැටවුම් බර නිශ්චය කිරීමේ කාර්යය සඳහා කවර වූ හෝ අවස්ථාවක දී යම් පරීක්ෂකවරයකු හෝ පොලිස් සැරයන්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින් මහා මාර්ගයක ගමන් කරන යම් ලොරියක් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් නවතා, තමාගේ අධිකාරය ඉදිරිපත් කිරීමට ඉල්ලා සිටියහොත්, එසේ කිරීමෙන් පසු රෝද තුලාවක්, කිරුම් තැලම්බක් හෝ මෝටර් වාහනවල බර කිරීම සඳහා වූ වෙනත් යන්ත්‍රයක් භාවිත කරමින් ලොරියේ, මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයේ පැටවුම් බර හා අක්ෂ පැටවුම් බර නිශ්චය කිරීමට සාධාරණ පියවර ගනු ලැබිය හැකි අතර, එම කාර්යය සඳහා එක් කාලයේ ලොරිය හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය භාරව සිටින තැනැත්තාට, ආසන්නතම රෝද තුලාව, කිරුම් තැලම හෝ මෝටර් වාහනවල බර කිරීම සඳහා වූ යන්ත්‍රය වෙත එය ධාවනය කිරීමට හෝ එය ධාවනය කරනු ලැබීමට අවසර දීමට නියම කරනු ලැබිය හැකි ය.

(2) යම් මෝටර් වාහනයක්, අවස්ථාවෝචිත පරිදි, ගෙන යන තැනැත්තන්ගේ හෝ මගීන්ගේ සංඛ්‍යාව නිශ්චය කිරීමේ කාර්යය සඳහා, බලයලත් නිලධරයකු විසින් යම් මහා මාර්ගයක ගමන් කරන එම වාහනය නවත්වනු ලැබිය හැකි අතර තමාගේ අධිකාරය ඉදිරිපත් කිරීමට ඉල්ලා සිටියහොත්, එසේ කිරීමෙන් පසු එම කාර්යය සඳහා අවශ්‍ය සියලු සාධාරණ පියවර ගනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා යම් ලොරියක හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක බර කිරනු ලැබූ අවස්ථාවක දී, එහි බර කිරීමට පෙර, ලොරියෙන් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයෙන්, බසින ලෙස ඉල්ලා සිටියහොත්, එසේ කිරීම එම ලොරියේ හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයේ සිටින සෑම තැනැත්තකුගේම කාර්යය විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ, යම් ලොරියක් හෝ යම් මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් පටවන ලද බරක් සහිත කිරනු ලැබූ අවස්ථාවක දී බර පටවන ලද ලොරියේ හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයේ බර සහ ලොරිය හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය සඳහා එක් කාලයේ බල පවත්නා බලපත්‍රයෙහි සඳහන් කොට ඇති එහි තාරබර අතර ඇති වෙනසේ ප්‍රමාණය, ඊට පටහැනිව කරුණු ඔප්පු කරන තෙක්, එහි ගෙන ගිය බඩුවල බර වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන, සහතික කරන නිලධරයකු හා පොලිස් නිලධරයකු සම්බන්ධයෙන් වන විට, පරීක්ෂකවරයකුට අදාළ වනසේ දුරට අදාළ විය යුතු නමුත්, නිල ඇඳුමෙන් යුත් පොලිස් නිලධරයකු විසින් යම් අධිකාරයක් ඉදිරිපත් කරනු ලැබීම අවශ්‍ය නොවිය යුතු ය.

ලොරිවල හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථවල ගෙන යන ලේඛන ඉදිරිපත් කිරීම.

**102.** (1) පරීක්ෂකවරයකු හෝ පොලිස් සැරයන්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින්, කවර හෝ අවස්ථාවක දී තමාගේ අධිකාරය ඉදිරිපත් කිරීමට ඉල්ලා සිටියහොත් එසේ කිරීමෙන් පසු, යම් ලොරියක් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් භාරව සිටින තැනැත්තාට, මේ පනතේ යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝග යටතේ ලොරියේ හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයේ ගෙන යාමට හෝ එහි රියැදුරා වෙත තබා ගැනීමට නියම කරනු ලැබූ යම්

ලේඛනයක් ඉදිරිපත් කිරීමට සහ එය පරීක්ෂා කිරීමට සහ එය පිටපත් කර ගැනීමට අවසර දීමට නියම කරනු ලැබිය හැකි අතර, එම කාර්යය සඳහා පරීක්ෂා කිරීම සහ පිටපත් කිරීම සඳහා අවශ්‍ය විය හැකි කාලයක් තුළ ලොරිය හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය නවතා රඳවා ගැනීම කරනු ලැබිය හැකි ය. තව ද, පරීක්ෂකවරයකු විසින් හෝ පොලිස් නිලධරයකු විසින් එසේ කිරීමට නියම කරනු ලැබූ විට දී, යම් තැනැත්තකු විසින් පරීක්ෂකවරයාට හෝ පොලිස් නිලධරයාට එවැනි යම් ලේඛනයක් ඉහත කී පරිදි ඉදිරිපත් කිරීම හෝ පිටපත් කර ගැනීමට ඔහුට අවසර දීම පැහැර හරිනු ලැබුවහොත්, එම තැනැත්තා මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන, කොමසාරිස්වරයා විසින් බලය දෙනු ලැබූ නිලධරයකු හෝ සහතික කරන ලද නිලධරයකු හෝ පොලිස් නිලධරයකු හෝ සම්බන්ධයෙන් වන විට, පරීක්ෂකවරයකුට අදාළ වන තාක් දුරට අදාළ විය යුතු නමුත් නිල ඇඳුමෙන් යුත් පොලිස් නිලධරයකු විසින් යම් අධිකාරයක් ඉදිරිපත් කරනු ලැබීම අවශ්‍ය නොවිය යුතු ය.

මෝටර් කෝච් රථ පරීක්ෂා කිරීම සහ පාවිච්චි කිරීම තහනම් කිරීම.

**103.** (1) යම් සහතික කරන නිලධරයකුට හෝ යම් පරීක්ෂකවරයකුට, කවර වූ හෝ අවස්ථාවක දී, තමාගේ අධිකාරය ඉදිරිපත් කිරීමට ඉල්ලා සිටියහොත්, එසේ කිරීමෙන් පසු, යම් මෝටර් කෝච් රථයකට ඇතුළුවීමට සහ එය පරීක්ෂා කිරීමට ද, එම කාර්යය සඳහා මෝටර් කෝච් රථය නවතා, පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය කාලයක් තුළ එය රඳවා තබා ගැනීමට ද හිමිකම් තිබිය යුතු අතර, අවස්ථානුගත කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින්, සාධාරණ විය හැකි කවර හෝ වේලාවක දී, ඒ මෝටර් කෝච් රථය තබා ඇති බවට විශ්වාස කිරීමට හේතු ඇති යම් ස්ථානයකට ඇතුළුවීමට ද හැකි ය. එවැනි යම් නිලධරයකුට, පරීක්ෂකවරයකුට තම කාර්යය ඉටු කිරීමේ දී යම් තැනැත්තකු අවහිර කරන්නේ නම් හෝ මෝටර් කෝච් රථයක් නැවැත්වීමට නියම කරනු ලැබූ විට එය එසේ නැවැත්වීම පැහැර හැරියහොත් හෝ ඒ තැනැත්තා මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මෝටර් කෝච් රථයක් පරීක්ෂා කිරීමේ දී, මෝටර් කෝච් රථයෙහි ඇති යම් දෝෂ නිසා, අවස්ථාවෝචිත පරිදි, එම දෝෂවලට පිළියම් කරන තෙක් සේවය සඳහා නුසුදුසු බව හෝ නුසුදුසු වීමට ඉඩ ඇති බව සහතික කරන නිලධරයාට හෝ පරීක්ෂකවරයාට පෙනී යන්නේ නම්, යම් මහා මාර්ගයක එය පාවිච්චි කිරීම ඔහු විසින් තහනම් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, සහතික කරන නිලධරයාගේ හෝ පරීක්ෂකවරයාගේ හෝ පොලිස් නිලධරයාගේ මතය අනුව, ඒ දෝෂ පැය හතලිස් අටක් නොඉක්මවන යම් කාලසීමාවක් ඇතුළත පිළියම් කරගත හැකි ආකාරයේ දෝෂ වන අවස්ථාවක දී සහ මහජන ආරක්ෂාවට කෙළින්ම අවදානමක් නොවන දෝෂ වන අවස්ථාවක දී, එම කාලසීමාව ඉකුත්වීමට පෙර එම තහනම ක්‍රියාත්මක නොවිය යුතු ය. තව ද, ඒ දෝෂ පිළියම් කරනු ලැබූ බවට හෝ පිළියම් කරමින් පවතින බවට, (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ යම් සහතික කරන නිලධරයකු හෝ යම් පරීක්ෂකවරයකු සෑහීමට පත් වී, එම කාලසීමාව ඉකුත්වීමට පෙර තහනම් කිරීම ඉවත් කර ගන්නේ නම්, එම කාලසීමාව ඉකුත් වීමෙන් පසු ඒ තහනම ක්‍රියාත්මක නොවිය යුතු ය.

(3) මෝටර් කෝච් රථයක් පාවිච්චි කිරීම, මේ ප්‍රඥප්තිය යටතේ යම් සහතික කරන නිලධරයකු විසින් හෝ පරීක්ෂකවරයකු විසින් තහනම් කරනු ලැබූ අවස්ථාවක දී, එකී ලියාපදිංචි අයිතිකරුට, එය පරීක්ෂා කරන අවස්ථාවේ දී, එය භාරව සිටින තැනැත්තාට හෝ කොමසාරිස්වරයාට ඒ තහනම් කිරීම සම්බන්ධව

නියමිත ආකෘතියෙහි වහාම දැනුම් දිය යුතු ය. මීට ඉහතින් වූ උපවගන්තියෙහි අනුවගන්තියෙහි සඳහන් කරනු ලැබූ දෝෂ මත තහනම් කිරීමක් කරනු ලැබ ඇති අවස්ථාවක දී, මේ උපවගන්තිය යටතේ කරනු ලැබූ දැන්වීමෙහි සහතික කරන නිලධරයාගේ හෝ පරීක්ෂකවරයාගේ මතය අනුව ඒ දෝෂ පිළියම් කරනු ලැබිය හැකි කාලසීමාව, අවස්ථාවෝචිත පරිදි, සඳහන් කළ යුතු ය.

(4) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ වගන්තිය යටතේ පනවනු ලැබූ තහනම් කිරීමක්, එම තහනම් කිරීම අදාළ වන්නා වූ මෝටර් කෝච් රථයේ ලියාපදිංචි අයිතිකරුට හෝ එය භාරව සිටින තැනැත්තාට හෝ ඒ පිළිබඳව දැන්වීමක් කළ වහාම, එම තහනම් කිරීම ක්‍රියාත්මක විය යුතු අතර, ඊට පසු මෙහි මින් මතු දක්වා ඇති විධිවිධානවලට අනුකූලව එම තහනම ඉවත් කරන තෙක් එය බලපැවැත්විය යුතු ය.

(5) තහනම් පනවනු ලැබුවේ යම් මෝටර් කෝච් රථයක් සම්බන්ධයෙන් ද, ඒ මෝටර් කෝච් රථය සේවය සඳහා සුදුසු යයි තමා සෑහීමට පත්වුවහොත් මේ වගන්තිය යටතේ ක්‍රියාත්මක වූ තහනම් කිරීමක්, (1) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ යම් සහතික කරන නිලධරයකු හෝ යම් පරීක්ෂකවරයකු හෝ විසින් ඉවත් කරනු ලැබිය හැකි ය.

(6) මේ වගන්තිය යටතේ කරනු ලැබූ තහනම් කිරීමක් ඉවත් කිරීමට යම් සහතික කරන නිලධරයකු හෝ පරීක්ෂකවරයකු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම නිසා අසාධාරණයට පත් තැනැත්තකු තහනම් කිරීම ක්‍රියාත්මක වන්නේ යම් මෝටර් කෝච් රථයක් සම්බන්ධයෙන් ද, ඒ මෝටර් කෝච් රථය කොමසාරිස්වරයා විසින් ඒ කාර්යය සඳහා ලියවිල්ලකින් බලය දෙනු ලැබූ නිලධරයකු ලවා පරීක්ෂා කරවීම සඳහා කොමසාරිස්වරයාට ඉල්ලීමක් කළ හැකි අතර, එවැනි යම් ඉල්ලීමක් කරනු ලැබූ විට, ඒ නිලධරයා විසින් ඒ කාරණය ඔහුට යොමු කිරීමෙන් පසු එය සේවය සඳහා සුදුසු යයි ඔහු අදහස් කරන්නේ නම් ඒ තහනම ඉවත් කරනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ පනවනු ලැබූ තහනමක් ඉවත් කිරීම, කොමසාරිස්වරයා විසින් බලය දෙනු ලැබූ නිලධරයකුගේ ප්‍රතික්ෂේප කිරීමෙන් අසාධාරණයට පත් තැනැත්තකුට, ආයාචනයක් සම්බන්ධයෙන් තමා සුදුසු යයි සලකන පරිදි යම් නියෝගයක් කිරීමට බලය ඇති කොමසාරිස්වරයාට නියමිත කාලය ඇතුළත දී සහ නියමිත ආකාරයට ආයාචනා කළ හැකි අතර, එවැනි යම් නියෝගයක් ඒ නිලධරයා කෙරෙහි අනුගාමී විය යුතු ය.

(8) යම් සහතික කරන නිලධරයකු, පරීක්ෂකවරයකු හෝ කොමසාරිස්වරයා විසින් බලය දෙනු ලැබූ නිලධරයකු මේ වගන්තිය යටතේ තහනමක් අත් හැර යනු ලබන හෝ ඉවත් කරනු ලබන අවස්ථාවක දී, ඒ තහනම අදාළ වන්නා වූ මෝටර් කෝච් රථයේ ලියාපදිංචි අයිතිකරුට සහ කොමසාරිස්වරයාට එම ඉවත් කිරීම හෝ අත්හැර ගැනීම සම්බන්ධයෙන් වහාම දැන්වීමක් කළ යුතු ය.

(9) මේ වගන්තිය යටතේ වූ තහනම් කිරීමක් මෝටර් කෝච් රථයක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන කාලය තුළ දී කිසිදු තැනැත්තකු විසින් එම තහනමට අදාළ මෝටර් කෝච් රථය යම් අවස්ථාවක මහා මාර්ගයක පාවිච්චි කිරීම හෝ පාවිච්චි කරනු ලැබීමට සැලැස්වීම හෝ අවසර දීම හෝ නොකළ යුතු ය.

(10) (9) වන උපවගන්තියේ විධිවිධාන කඩ කිරීමේ වරදට වරදකරු වන යම් තැනැත්තකු, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබුවිට පළමු වරට කරනු ලැබූ වරද

සම්බන්ධයෙන් වූ විට රුපියල් දෙසිය පණහක් නොඉක්මවන දඩයකට හා දෙවන වරට කරනු ලබන හෝ පසුකාලීන වරදක් සම්බන්ධයෙන් වූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

නියෝග.

**104.** (අ) මෝටර් වාහනයකට චාලක ශක්තිය හෝ ආලෝකය සැපයීම සඳහා පාවිච්චි කරනු ලබන වාෂ්ප බොයිලේරු, ගෑස් සිලින්ඩර හෝ පීඩනය යටතේ ක්‍රියාත්මක වන වෙනත් යන්ත්‍ර කලින් කල සෝදිසි කිරීම සඳහා හෝ පරීක්ෂා කිරීම සඳහා, වාහන පරීක්ෂා කිරීමේ ගාස්තුව ගෙවීම සඳහා විධිවිධාන සැලස්වන්නා වූ ; සහ

(ආ) මෝටර් වාහන පරීක්ෂා කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රම සහ අදාළ කළ යුතු පරීක්ෂණ සහ මේ ප්‍රඥප්තිය යටතේ ඒ පරීක්ෂණයෙන් පසුව සැපයිය යුතු වාර්තාවල සැකැස්ම සහ ස්වභාවය නියම කරන්නා වූ

නියෝග සාදනු ලැබිය හැකි ය.

දැන්වීම් භාරදීම ආදිය

**105.** මේ කොටසේ කාර්යය සඳහා වූ සෑම දැන්වීමක් හෝ නියමයක්ම භාරදීම හෝ දැනුම් දීම, එය අදාළ වන මෝටර් වාහනයේ ලියාපදිංචි අයිතිකරුට පෞද්ගලිකව භාර දීමෙන් හෝ ඔහු සාමාන්‍යයෙන් පදිංචි ස්ථානයට හෝ ඔහු අවසන් වශයෙන් පදිංචිව සිටි බව දන්නා ස්ථානයට ලියාපදිංචි කළ ලිපියක් මඟින් තැපෑලෙන් යැවීමෙන් හෝ කළ හැකි අතර, තැපෑලෙන් යවන අවස්ථාවක, ඒ ලිපිය තැපැල් කරනු ලැබූ දිනයට පසුව එළඹෙන තුන්වන දිනයේ දී එය භාර දෙනු ලැබූ ලෙස සැලකිය යුතු ය. තව ද, ඒ දැන්වීම හෝ නියමය ඇතුළත් ලිපිය නිසි පරිදි ලිපිනය ලියා තැපැල් කළ බව ඔප්පු කිරීම, එවැනි භාර දීම හෝ එවැනි නියමයක් දැනුම් දීම ඔප්පු කිරීම එනිසා ප්‍රමාණවත් විය යුතු ය.

## IV වන කොටස

### පරිපාලනය සහ කාර්ය පටිපාටිය

*නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.*

106. (1) (අ) මෝටර් වාහන පළාත් කොමසාරිස්වරයා ;

(ආ) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා කලින් කල අවශ්‍ය විය හැකි යම් නියෝජ්‍ය සහ සහකාර කොමසාරිස්වරුන් ;

(ඇ) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා කලින් කල අවශ්‍ය විය හැකි යම් පාලක කිරීමේ නිලධාරයන් සහ මෝටර් වාහන පරීක්ෂකවරුන්

ලෙස හෝ වශයෙන් ක්‍රියා කිරීමට තැනැත්තන් බස්නාහිර පළාතේ පළාත් රාජ්‍ය සේවයට නිලධාරයන් පත් කිරීමේ බලයලත් ව්‍යවස්ථාපිත බලධාරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා කලින් කල අවශ්‍ය විය හැකි වෙනත් යම් නිලධාරයන් සහ සේවකයන් ද එපරිද්දෙන් පත් කරනු ලැබිය හැකි ය.

(3) මේ ප්‍රඥප්තිය යටතේ කොමසාරිස්වරයා වෙත පැවරෙන යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් කොමසාරිස්වරයාගේ විධාන යටතේ සහකාර හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් හෝ කොමසාරිස්වරයා විසින් ස්වකීය අත්සන යටතේ ලියවිල්ලකින් බලය දෙනු ලැබූ වෙනත් නිලධාරයකු විසින් හෝ ක්‍රියාත්මක කළ හැකි ය, නැතහොත් ඉටුකළ හැකි ය.

(4) මේ ප්‍රඥප්තිය යටතේ බලතල ක්‍රියාත්මක කරන හෝ කර්තව්‍ය ඉටුකරන හෝ සියලු තැනැත්තන්, නිලධාරයන් සහ සේවකයන් දණ්ඩනීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

*කොමසාරිස්වරයාගේ සාමාන්‍ය කර්තව්‍ය සහ කාර්ය.*

107. මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව, කොමසාරිස්වරයා වෙත පහත දැක්වෙන කර්තව්‍ය කාර්ය භාර කරනු ලැබිය යුතු ය :—

(අ) පාරේ මගීන් සහ බඩු ප්‍රවාහනය පාලනය කිරීම, සංවිධානය කිරීම සහ ඒකාබද්ධ කිරීම ;

(ආ) මේ ප්‍රඥප්තියේ හෝ මේ ප්‍රඥප්තිය යටතේ නැතහොත් වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ කොමසාරිස්වරයා වෙත පැවරී ඇති හෝ නියම කර ඇති වෙනත් බලතල, කාර්ය සහ කර්තව්‍ය.

*මෝටර් වාහන උපදේශක සභාව.*

108. (1) සභාපතිවරයා වශයෙන් කොමසාරිස්වරයාගෙන් සහ අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි වූ ද සංඛ්‍යාවෙන් පහළොවකට නොවැඩි විය යුතු වූ ද වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත මෝටර් වාහන උපදේශක සභාවක් විය යුතු ය. එකී වෙනත් තැනැත්තන් සංඛ්‍යාවට මෙහි පහත සඳහන් එක් එක් දෙපාර්තමේන්තුව, මණ්ඩලය සහ ආයතනය වෙනුවෙන්, එනම් :—

(අ) පොලිස් දෙපාර්තමේන්තුව ;

(ආ) මහා මාර්ග සංවර්ධන අධිකාරිය ;

(ඇ) බස්නාහිර පළාතේ බස්රථ ප්‍රවාහන අධ්‍යක්ෂ ;

(ඈ) බස්නාහිර පළාතේ පළාත් බඳ මාර්ග සංවර්ධන අධිකාරිය ;

(ඉ) ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය ;

(ඊ) අනතුරු වැළැක්වීමේ ලංකා සංගමය ;

(ඩ) ලංකා ඔටෝමොබයිල් සංගමය ;
(ඪ) ලංකා සංචාරක මණ්ඩලය ;
(ණ) බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව ;
(ත) කොළඹ මහ නගර සභාව.

වෙනුවෙන් එක් එක් නියෝජිතයා බැගින් ඊට ඇතුළත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන සභාවේ සෑම සාමාජිකයකු ම, ඔහු කලින් ධුරය අත්හරින්නේ නම් හෝ අමාත්‍යවරයා විසින් එම ධුරයෙන් ඉවත් කරනු ලබන්නේ නම් මිස, පත් කරනු ලබන අවස්ථාවේ දී අමාත්‍යවරයා විසින් නිර්ණය කරනු ලබන අවුරුදු තුනකට නොවැඩි යම් කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය. කාලය ඉකුත් වීම නිසා ධුරය අත්හරින එවැනි යම් සාමාජිකයකු නැවත පත් කිරීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

(3) මෝටර් රථ ගමනාගමනය විධිමත් කිරීම හෝ උපදෙස් සඳහා කොමසාරිස්වරයා විසින් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි මේ ප්‍රඥප්තිය පරිපාලනය කිරීම හා සම්බන්ධව සියලු කරුණු පිළිබඳ කොමසාරිස්වරයාට උපදෙස් දීම සභාවේ කාර්යය වන්නේ ය.

(4) අවශ්‍ය යයි තමා සලකන කවර විටෙක වුව ද කොමසාරිස්වරයා විසින් සභාවේ රැස්වීම් කැඳවනු ලැබිය හැකි අතර, එක් එක් අර්ධ වර්ෂයක් තුළ දී යටත් පිරිසෙයින් එක් වරක්වත් ඔහු විසින් රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය :

එසේ වුව ද, සභාවේ සාමාජිකයන් අතරින් හයදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් රැස්වීමක් කැඳවනු ලැබිය යුතු යයි ලියවිල්ලකින් කොමසාරිස්වරයාගෙන් ඉල්ලනු ලැබූ කවර විටෙක වුව ද ඔහු විසින් රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය.

(5) සභාවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලස්වීමින් සහ සභාවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියම කරමින් සභාව විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. එවැනි යම් නියෝගවලට යටත් ව, සභාව විසින් සභාවේ ම කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

## V වන කොටස

### වැරදි දණ්ඩන සහ අධිකරණයේ නඩු කටයුතු

109. (1) (අ) මේ පනතේ හෝ යම් නියෝගයක යම් විධිවිධානයක් මේ පනතේ යම් විධිවිධානයක් යටතේ හෝ යම් නියෝගයක් යටතේ නීත්‍යානුකූල ලෙස නිකුත් කරන ලද, සාදන ලද හෝ දෙන ලද යම් අණකට, විධානයක්, ඉල්ලීමක්, නියම කිරීමක් හෝ දැන්වීමක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින ; නැතහොත්

පනත, නියෝග, අණ, ආදිය කඩ කිරීම.

(ආ) මේ පනත යටතේ ප්‍රදානය කරන ලද හෝ නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් දරන්නකු වශයෙන්, අවස්ථාවෝචිත පරිදි, ඒ අවසර පත්‍රයේ හෝ බලපත්‍රයේ යම් කොන්දේසියක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ පනතේ යම් විධිවිධානයක් හෝ යම් නියෝගයක් කඩකරමින් මෝටර් වාහනයක් පැදවීම කරන්නා වූ හෝ මෝටර් වාහනයක් සම්බන්ධයෙන් යම් දෙයක් කරන්නා වූ හෝ නොකර හරින්නා වූ අවස්ථාවක —

(අ) ඒ විධිවිධානයෙන් හෝ නියෝගයෙන් නියම කරන ලද ඒ කඩ කිරීම සම්බන්ධයෙන් වූ යම් කාර්යයක් හෝ සහතිකයක් හෝ වගකීමක් පවරනු ලැබ ඇත්තා වූ යම් තැනැත්තකු වේනම්, ඒ තැනැත්තා වරදකට වරදකරු විය යුතු ය ; සහ

(ආ) ඒ විධිවිධානයෙන් හෝ නියෝගයෙන්, ඒ කඩ කිරීම සම්බන්ධයෙන් වූ කාර්යයක්, සහතිකයක් හෝ වගකීමක් රියැදුරුට හෝ අයිතිකරුට ප්‍රකාශිතව ම නියම කරනු ලැබ නොතිබුණ වුව ද, මෝටර් වාහනයේ රියැදුරු සහ අයිතිකරු ද මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

එසේ වුව ද —

(i) තමාගේ යම් ක්‍රියාවක්, නොකර හැරීමක්, පැහැර හැරීමක් හෝ අනපේක්ෂාවක් නිසා කඩ කිරීම සිදු නොවූ බව අධිකරණය තෘප්තිමත් වන පරිදි රියැදුරු විසින් ඔප්පු කරනු ලබන්නේ නම්, ඔහු (ආ) ඡේදය අනුව මේ පනත යටතේ වරදකට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය ;

(ii) කඩ කිරීම තමාගේ අනු දැනීමක් නොමැතිව හෝ තමාගේ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් නිසා සිදු කරන ලද බව හෝ ඒ කඩ කිරීම වැළැක්වීම සඳහා යුක්ති සහගත පූර්වාරක්ෂාවක් තමා විසින් යොදන ලද බව අධිකරණය තෘප්තිමත් වන පරිදි අයිතිකරු ඔප්පු කරනහොත්, ඒ කඩ කිරීම සිදු කරනු ලබන අවස්ථාවේ දී මෝටර් වාහනය තුළ තමා නොසිටියේ නම්, ඔහු (ආ) ඡේදය අනුව මේ පනත යටතේ වරදකට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය ;

(iii) 49 සිට 94 දක්වා වූ වගන්තිවල යම් විධිවිධානයක් හෝ (යම් කාර්යයක්, සහතිකයක් හෝ වගකීමක් අයිතිකරු වෙත ප්‍රකාශිතව ම නියම නොකරන විධිවිධානයක් හෝ නියෝගයක් නොවන) 93 වන වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ කඩ කිරීමක් සම්බන්ධයෙන් වන විට, ඒ කඩ කිරීම සඳහා ඔහු ආධාර සහ අනුබල දී ඇත්නම් මිස, (ආ) ඡේදය අනුව මේ පනත යටතේ අයිතිකරු වරදකට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

තැත් කිරීම සහ අනුබල දීම.

**110.** මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කිරීමට තැත් කරන හෝ වරදක් කිරීමට අනුබල දෙන යම් තැනැත්තෙක් වරදකට වරදකරු විය යුතු ය.

වරද සඳහා අවස්ථාවේදී ම දඩ නියම කිරීම.

**110අ.** (1) මේ ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ I වන තීරුවේ දක්වා ඇති යම් වගන්තියක විධිවිධාන කඩ කරන තැනැත්තෙක් එවැනි යම් වගන්තියක විධිවිධාන යටතේ නීත්‍යානුකූලව නිකුත් කරන ලද හෝ දෙන ලද යම් නියමයක්, විධානයක්, ඉල්ලා සිටීමක් නියම කිරීමක් හෝ දැන්වීමක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තෙක් මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) පොලිස් නිලධරයකු විසින් අල්ලා ගනු ලැබූ විට මේ ප්‍රඥප්තියේ උපලේඛනයේ I වන තීරුවේ දක්වා ඇති යම් වගන්තියක විධිවිධාන කඩ කිරීමක් ගැන හෝ එවැනි යම් වගන්තියක විධිවිධාන යටතේ නීත්‍යානුකූලව නිකුත් කරන ලද, සාදන ලද හෝ දෙන ලද යම් නියමයක්, විධිවිධානයක්, ඉල්ලා සිටීමක්, නියම කිරීමක් හෝ දැන්වීමක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම ගැන වරද පිළිගන්නා යම් තැනැත්තකු ඔහු එසේ කිරීමට කැමති නම් ඒ වරද සම්බන්ධයෙන් නඩු පැවරීම වෙනුවට ඔහු වරද පිළිගනුයේ I වන තීරුවේ නියමිතව දක්වා ඇති සවර වරදක් සම්බන්ධයෙන් ද එම උපලේඛනයේ III වන තීරුවේ දක්වා ඇති ප්‍රමාණයට අනුරූප වන දඩයක් ගෙවීම කළ හැකි ය. එවැනි ගෙවීමක් මහනුවර පළාතේ මෝටර් රථ ප්‍රවාහන කාර්යාලයේ දී හෝ පළාත තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක ද කළ යුතු අතර ඒ ගෙවීම පිළිබඳ සාක්ෂි එසේ අල්ලා ගනු ලැබූ දින සිට සති දෙකක් ඇතුළත, එසේ අල්ලා ගැනීම කරන පොලිස් නිලධරයා විසින් නම් කරන ලද පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වෙත පෞද්ගලිකව භාරදීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ඉදිරිපත් කළ යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වූ දණ්ඩනය.

**110ආ.** තම රියැදුරු බලපත්‍රය අත් හිටුවීමේ හෝ අවලංගු කිරීමේ තැනැත්තෙක් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා තම නුසුදුස්සකු බව ප්‍රකාශ කිරීමේ නියමයක් බලාත්මකව පවතිද්දී, සවර වූ හෝ අවස්ථාවක මෝටර් වාහනයක් මහා මාර්ගයක පැදවීමෙන් මේ ප්‍රඥප්තියේ 48 වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට යටත් විය යුතු ය.

මත් පැන් හෝ මත් ද්‍රව්‍ය පරිභෝජනය කිරීමෙන් පසුව රිය ධාවනය කිරීම සම්බන්ධයෙන් දණ්ඩනය.

**111.** 60 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධි විධාන කඩ කිරීමේ වරදට වරදකරු වන යම් තැනැත්තෙක්, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම සහ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා ඔහුගේ රියදුරු බලපත්‍රය අත්හිටුවනු ලැබීමට හෝ යටත් විය යුතු ය.

මත් පැන් හෝ මත් ද්‍රව්‍ය පරිභෝජනය කිරීමෙන් පසුව ඇතැම් මෝටර් වාහන ධාවනය කිරීම සම්බන්ධයෙන් දණ්ඩනය.

**111අ.** 60 වන වගන්තියේ (1අ) වන උපවගන්තියේ විධි විධාන කඩ කිරීමේ වරදට වරදකරු වන යම් තැනැත්තෙක්, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් තුන් දහසකට නොවැඩි දඩයකට සහ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ ඔහුගේ රියදුරු බලපත්‍රය අවලංගු කරනු ලැබීමට හෝ යටත් විය යුතු ය.

**111ආ.** 60 වන වගන්තියේ 1 (ආ) වන උපවගන්තියේ විධිවිධාන කඩ කිරීමේ වරදට වරදකරු වන යම් තැනැත්තෙක් මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට —

මත් පැන් හෝ මත් ද්‍රව්‍ය පරිභෝජනය කිරීමෙන් පසුව මෝටර් වාහන ධාවනය කිරීම නිසා තැනැත්තකුට මරණය හෝ තුවාල සිදු කිරීම සම්බන්ධයෙන් දණ්ඩනය.

(අ) ඔහු යම් තැනැත්තකුගේ මරණය සිදු කරනුයේ නම් අවුරුදු දෙකකට නොඅඩු වූ ද, අවුරුදු දහයකට නොවැඩි වූ ද කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ ඔහුගේ රියදුරු බලපත්‍රය අවලංගු කිරීමට ;

(ආ) ඔහු යම් තැනැත්තකුට තුවාල සිදු කරනුයේ නම්, රුපියල් පන්දහසකට නොඅඩු දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම සහ ඔහුගේ රියදුරු බලපත්‍රය අවලංගු කිරීමට,

යටත් විය යුතු ය.

**112.** (1) 60 (2) වන උපවගන්තියේ විධිවිධාන කඩ කිරීමේ වරදට වරදකරු වන යම් තැනැත්තෙක්, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් හත් සිය පනහකට නොඅඩු දඩයකට ද, දෙ වන වරට වරදකරු කරනු ලැබීමක දී රුපියල් එක් දහසකට නොඅඩු දඩයකට සහ ඔහුගේ රියදුරු බලපත්‍රය අත්හිටුවනු ලැබීමට ද, තුන් වන වරට හෝ තදනන්තර වරදකරු කරනු ලැබීමක දී රුපියල් එක් දහස් පන්සියයකට නොවැඩි දඩයකට සහ ඔහුගේ රියදුරු බලපත්‍රය අවලංගු කරනු ලැබීමට ද නැතහොත් මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

අනවධානයෙන් හෝ අසැලකිලිමත් ලෙස රිය ධාවනය සම්බන්ධයෙන් දණ්ඩනය.

(2) 60 (3) වන උපවගන්තියේ විධිවිධාන කඩ කිරීමේ වරදට වරදකරු වන යම් තැනැත්තෙක්, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොඅඩු දඩයකට ද දෙ වන වරට වරදකරු කරනු ලැබීමක දී රුපියල් එක් දහසකට නොඅඩු දඩයකට ද තුන් වන වරට හෝ තදනන්තරව වරදකරු කරනු ලැබීමක දී රුපියල් එක් දහස් පන්සියයකට නොවැඩි දඩයකට සහ ඔහුගේ රියදුරු බලපත්‍රය මාස හයක කාලයක් සඳහා අත්හිටුවනු ලැබීමට ද යටත් විය යුතු ය.

නොසැලකිලිමත් ලෙස රිය ධාවනය සම්බන්ධයෙන් දණ්ඩනය.

**113.** 22 වගන්තියේ හෝ 98 වන වගන්තියේ 6 වන උපවගන්තියේ හෝ විධිවිධාන කඩ කිරීමේ වරදට වරදකරු වන යම් තැනැත්තෙක්, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයකට නොඅඩු දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

තෙවන පාර්ශ්ව අවදානම් පිළිබඳ රක්ෂණ සහතිකය හෝ ඇප සහතිකය නැතහොත් තැන්පතු සහතිකයක් නොමැතිව රිය ධාවනය කිරීම සඳහා දණ්ඩනය.

**114.** (අ) මෙහි පහත සඳහන් කාර්යයන් සඳහා වූ එනම් —

අසත්‍ය තොරතුරු සැපයීම සම්බන්ධයෙන් දණ්ඩනය

(i) කොන්දෙස්තර බලපත්‍රයක් හෝ යම් නියෝගයකින් නියමිත වෙනත් යම් බලපත්‍රයක් ලබා ගැනීම හෝ ඒ බලපත්‍රයක් අලුත් කිරීම ; හෝ

(ii) එවැනි යම් බලපත්‍රයක යම් වෙනසක් කිරීම හෝ නිවැරදි කිරීම සඳහා වූ යම් ඉල්ලුම්පත්‍රයක තැනහොත් යම් ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් හෝ

(ආ) 1 වන කොටස යටතේ වූ යම් ඉල්ලුම් පත්‍රයක තැනහොත් යම් ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් හෝ,

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ තැනහොත් යම් නියෝගයක් යටතේ නීත්‍යනුකූලව ඉල්ලා සිටිනු හෝ නියමිත යම් තොරතුරක් දීමේ දී තමාගේ දැනීම අනුව අසත්‍ය වූ හෝ යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන්

නොමඟ යවන සුළු වූ ප්‍රකාශයක් කරන යම් තැනැත්තෙක්, මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොඅඩු දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

ආදායම් බලපත්‍ර ආදිය අනුකරණය කිරීම සම්බන්ධයෙන් දණ්ඩනය.

**115.** (1) යෝග්‍යතා සහතිකයක්, මෝටර් වාහනයක් සඳහා වූ ආදායම් බලපත්‍රයක්, 46 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අවසරපත්‍රයක්, කොන්දොස්තර බලපත්‍රයක් හෝ වෙනත් යම් සහතිකයක් තැනහොත් බලපත්‍රයක් හෝ මේ ප්‍රඥප්තිය යටතේ හෝ යම් නියෝගයක් යටතේ නිකුත් කරන ලද තැනහොත් නිකුත් කරන ලදැයි පෙනෙන එවැනි යම් අවසර පත්‍රයක්, සහතිකයක හෝ බලපත්‍රයක අනුපිටපතක් —

(අ) වංචනික ලෙස පාවිච්චි කරන තැනහොත් පාවිච්චි කිරීමට වෙනත් තැනැත්තෙකුට ඉඩ හරින ; හෝ

(ආ) අනුකරණය කරන, වෙනස් කරන, විච්ඡේදනය කරන, විරූප කරන හෝ විනාශ කරන යම් තැනැත්තෙක් මේ ප්‍රඥප්තිය යටතේ වරදකරු වන අතර

මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්දහසකට නොඅඩු දඩයකට ද, දෙ වන වරට හෝ තදනන්තර වරදකරු කරනු ලැබීමක දී රුපියල් එක්දහස් පන්සියයකට නොඅඩු දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

(2) (අ) යම් රක්ෂණ සහතිකයක් හෝ ඇප සහතිකයක් ව්‍යාජ ලෙස සාදන හෝ අනුකරණය කරන හෝ වෙනස් කරන තැනහොත් එවැනි යම් සහතිකයක් ව්‍යාජ ලෙස සාදන ලද බව හෝ අනුකරණය කරන ලද බව හෝ වෙනස් කරන ලද බව දැන දැන එය පාවිච්චි කරන හෝ වෙනත් තැනැත්තකු විසින් පාවිච්චි කිරීමට ඉඩසලස්වන හෝ වෙනත් තැනැත්තකුට එය පාවිච්චි කිරීමට ඉඩ දෙන ; හෝ

(ආ) යම් රක්ෂණ සහතිකයක් හෝ ඇප සහතිකයක් වංචනික ලෙස පාවිච්චි කරන හෝ වෙනත් යම් තැනැත්තකු විසින් වංචනික ලෙස පාවිච්චි කිරීමට සලස්වන තැනහොත් ඉඩ හරින ; හෝ

(ඇ) රක්ෂණ සහතිකයක් හෝ ඇප සහතිකයක් ලබා ගැනීමේ කාර්යය සඳහා දැන දැනම යම් අසත්‍ය ප්‍රකාශයක් කරන හෝ යම් වැදගත් තොරතුරක් හෙළිදරව් නොකර සිටින

යම් තැනැත්තෙක් මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට නො අඩු දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

(3) යම් වැදගත් විස්තරයක් විෂයයෙහි ලා අසත්‍ය බව තමා දන්නා යම් රක්ෂණ සහතිකයක් හෝ ඇප සහතිකයක් නිකුත් කරන යම් තැනැත්තෙක්, මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොඅඩු දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

**116.** මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ තැනැත්තා සංස්ථාවක් හෝ හවුල් ව්‍යාපාරයක් වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයෙක් ම හෝ හවුල් ව්‍යාපාරයේ සෑම සාමාජිකයෙක් ම, වරද කරන ලද්දේ තමාගේ දැනීමක් නොමැතිව බව හෝ වරද කිරීම වළක්වාලීමෙහි ලා තමා සියලු උද්යෝගයෙන් යුතුව ක්‍රියාකළ බව ඔහු ඔප්පු කරනහොත් මිස, ඒ එක් එක් තැනැත්තා ඒ වරදට වරදකරු විය යුතු ය. සංස්ථාවක් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් කරනු ලබන වැරදි.

**117.** මේ ප්‍රඥප්තිය යටතේ වූ යම් වරදක් මෝටර් වාහනයක් පාවිච්චි කිරීම හෝ ධාවනය කිරීම සම්බන්ධයෙන් සිදුකරන ලද බව දැන දැනම හෝ එසේ කරන ලද බවට විශ්වාස කිරීමට තරම් හේතු ඇතිව, ඒ වරද සිදුකිරීම පිළිබඳව යම් සාක්ෂියක්, වරදකරු නීත්‍යානුකූලව දඬුවම් කිරීමෙන් වසන් කිරීමේ චේතනාවෙන් අතුරුදහන් වීමට සැලැස්වන, නැතහොත්, එම චේතනාවෙන්ම අසත්‍ය බවට තමා දන්නා හෝ විශ්වාස කරන, වරද පිළිබඳ යම් තොරතුරක් දෙන යම් තැනැත්තෙක්, ඒ වරද දණ්ඩ නීති සංග්‍රහයේ 38(3) වන සහ 198 වන වගන්තිවල අර්ථානුකූලව සිදු කෙරුණු වරදක් නොවන අවස්ථාවක, මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට නොඅඩු දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය. වරදකට අදාළ සාක්ෂි අනාවරණය කිරීමට පැහැරහැරීම හෝ අසත්‍ය තොරතුරු සැපයීම සම්බන්ධයෙන් දණ්ඩනය.

**118.** වෙනත් දඬුවමක් සඳහා මේ ප්‍රඥප්තියේ ප්‍රකාශිතවම විධිවිධාන සලසා නොමැති යම් වරදකට වරදකරු වන යම් තැනැත්තකු, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙසිය පනහකට නොඅඩු දඩයකට ද ; දෙ වන වරට වරදකරු කරනු ලැබීමක දී රුපියල් පන්සියයකට නොඅඩු දඩයකට ද තුන් වන වරට හෝ පසුව්තර වරදකරු කරනු ලැබීමක දී රුපියල් හත් සිය පනහකට නොඅඩු දඩයකට සහ ඔහුගේ රියදුරු බලපත්‍රය අවලංගු කරනු ලැබීමට ද යටත් විය යුතු ය. පොදු දණ්ඩනය

**118අ.** (1) මේ ප්‍රඥප්තිය යටතේ නියම කරනු ලැබිය හැකි යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව යම් මහෙස්ත්‍රාත් අධිකරණයක නඩු කටයුතු පවරා ඇත්තා වූ ද යම් දේපළකට අලාභයක් හෝ වෙනත් යම් තැනැත්තකුට හානියක් හෝ ඇතුළත් වන හදිසි අනතුරක්, එම වරද කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් හෝ ඒ වරද කිරීම හේතු කොට ගෙන හෝ සිදු වී නොමැත්තා වූ ද අවස්ථාවක, 1979 ඇතැම් වැරදි සම්බන්ධයෙන් අධිකරණය විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

අංක 15 දරන අපරාධ නඩු විධිවිධාන සංග්‍රහ පනතේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, අධිකරණය විසින් සිතාසිය සමග පළමු කී තැනැත්තාට නිකුත් කරන දැන්වීමේ සඳහන් දිනයේ දී හෝ ඊට පෙර ඒ තැනැත්තා —

(අ) ඒ වරද කළ බව එම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා අමතා යවන ලිපියක් මගින් පිළිගතහොත් ;

(ආ) දැන්වීමෙහි සඳහන් මුදල් ප්‍රමාණය රෙජිස්ට්‍රාර්වරයාට ගෙවතහොත් ;

සිතාසියේ සඳහන් වේලාවේ දී සහ ස්ථානයේ දී ඒ තැනැත්තා පෙනී සිටීම අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරමින් දැන්වීමක් නිකුත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට නිකුත් කරන දැන්වීමෙහි එම උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නියමිත කොට දක්වන මුදල් ප්‍රමාණය, එම තැනැත්තාට නිකුත් කරන ලද සිතාසියේ සඳහන් වරද සඳහා නීත්‍යනුකූලව අධිකරණය විසින් දඩයක් වශයෙන් පැනවිය හැකි මුදල් ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අධිකරණයක් විසින් දැන්වීමක් නිකුත් කරනු ලැබූ තැනැත්තෙකු ඒ දැන්වීමේ විධිවිධාන අනුව ක්‍රියා කරන අවස්ථාවක, එම තැනැත්තාට නිකුත් කර ඇති සිතාසියේ සඳහන් වරද සම්බන්ධයෙන් වරදකරු කිරීමේ තීන්දුවක් අධිකරණය විසින් වාර්තාගත කර, එම දැන්වීමට අනුකූලව ඔහු විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණයට සමාන දඩයක් ගෙවන ලෙස දණ්ඩන නියමයක් කොට, ඒ දඩය ඔහු විසින් ගෙවන ලද බවද වාර්තාගත කළ යුතු ය.

(4) මේ වගන්තියෙහි "මහේස්ත්‍රාත් අධිකරණය" යන්නට නාගරික මහේස්ත්‍රාත් අධිකරණයක් ද ඇතුළත් වේ.

සීඝ්‍ර ක්‍රියාත්මක වීමෙන් රියැදුරු බලපත්‍ර අත්හිටුවීම.

118ආ. මෝටර් වාහනයක රියැදුරාට විරුද්ධව —

(අ) (i) අපරික්ෂාකාරී හා නොසැලකිලිමත් ලෙස රිය ධාවනය කිරීම ; හෝ

(ii) අධික වේගයෙන් රිය ධාවනය කිරීම ; හෝ

(iii) ජීවිත හානියට හෝ බරපතළ හානි ඇතිවීමට හේතු වූ හදිසි අනතුරක් සිදු කිරීම පිළිබඳව නඩු පවරනු ලබන අවස්ථාවක ; හෝ

(ආ) ඔහු ජීවිත හානියට හේතු වූ හදිසි අනතුරකට සම්බන්ධව වන්නා වූ හා එම කාරණය විභාගකිරීම සඳහා මහේස්ත්‍රාත්වරයකුට යොමු කරන ලද අවස්ථාවක

ඒ වාහනයේ රියැදුරාගේ බලපත්‍රය අත්හිටුවනු ලැබීමට පොලීසිය විසින් කරනු ලබන ඉල්ලීමක් මත, මහේස්ත්‍රාත්වරයා විසින් නඩු කටයුතු හෝ විභාගය අවසන් වන තුරු, බලපත්‍රය එසේ අත්හිටුවීමට තම අභිමතය අනුව අණ කරනු ලැබිය හැකි ය.

බලපත්‍ර ගාස්තුව අයකර ගැනීමට ආඥා කිරීමට අධිකරණයට ඇති බලය.

119. (1) 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය කඩ කරමින් මෝටර් වාහනයක සන්තකය දැරීමේ හෝ මෝටර් වාහනයක් පාවිච්චි කිරීමේ වරදට යම් අධිකරණයක් විසින් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබුවා වූ ද, අයවිය යුතුව ඇති ගාස්තු හා අධිභාරයක් වේනම් එය ද මුදල් ප්‍රමාණය සඳහන් වන, නිකුත් කිරීමේ බලධරයා විසින් අත්සන් කරන ලද සහතිකයක් ඉදිරිපත් කරනු ලැබුවා වූ ද අවස්ථාවක, අධිකරණය විසින්, එම වරද සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අතිරේකව, එම මුදල් ප්‍රමාණයට සමාන මුදලක් ඒ අධිකරණය විසින් පනවන ලද දඩ මුදලක් වූවාක් සේ ඒ තැනැත්තාගෙන් අයකර

ගන්නා ලෙස අණ කළ යුතු ය. තව ද එවැනි යම් මුදලක් ස්ථිරය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා අධිකරණය විසින් නියම කළ හැකි දඩ මුදල් ප්‍රමාණය ඉක්මවාලුව ද ඒ තැනැත්තාගෙන් එසේ අයකර ගත හැකි ය. අධිකරණය විසින් අයකර ගනු ලැබූ විට, එවැනි යම් මුදලක් ම, බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා වෙත යැවිය යුතු අතර, එම මෝටර් වාහනය සඳහා වූ ආදායම් බලපත්‍රයක් මත ගෙවිය යුතු වූ ගාස්තුව පිළිබඳව කටයුතු කරන ආකාරයෙන් ම මේ ප්‍රඥප්තිය යටතේ, බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින්, ඒ මුදල සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් ආඥාවක් කර ඇත්තේ යම් වරදකරු කිරීමක ප්‍රතිඵලයක් වශයෙන් ද ඒ වරදකරු කිරීමට විරුද්ධව, ඒ ආඥාවෙන් අසතුටට පත් යම් තැනැත්තකු විසින් අභියාචනයක් කරනු ලබන්නේ නම්, ඒ තැනැත්තා විසින් ඒ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනය කළ හැකි අතර, එවැනි අභියාචනයකට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ XXVIII වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) යම් මෝටර් වාහනයක් වෙනුවෙන් යම් වර්ෂයක් හෝ වර්ෂයකින් කොටසක් සඳහා අවශ්‍ය ආදායම් බලපත්‍රය මත ගෙවිය යුතු ගාස්තුවට සහ අධිභාරයක් වේ නම් එයට ද සමාන මුදලක් (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් ප්‍රකාර හෝ (2) වන උපවගන්තිය යටතේ අභියාචනාධිකරණය විසින් කරන ලද ආඥාවක් ප්‍රකාර හෝ යම් තැනැත්තකුගෙන් අය කර ගන්නා ලද්දා වූ ද, එම වාහනය මහා මාර්ගයක පාවිච්චි කිරීම සඳහා යෝග්‍ය වන්නා වූ සහ මෝටර් වාහනවලට බලපත්‍ර දීම සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ වෙනත් සියලු නියමයන් එම මෝටර් වාහනය සම්බන්ධයෙන් පිළිපැද ඇත්තා වූ ද අවස්ථාවක, එම මෝටර් වාහනය වෙනුවෙන් බලපත්‍රයක් සඳහා යථා පරිදි 1 වන කොටස යටතේ ඉල්ලුම් කරනු ලැබුවේ නම් සහ ඒ බලපත්‍රය මත ගෙවිය යුතු ගාස්තු මුදල ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කරනු ලැබුවේ නම්, ආදායම් බලපත්‍රය නිකුත් කරන ආකාරයට ම, ඒ වාහනය සඳහා බලපත්‍රයක්, එම වර්ෂය හෝ වර්ෂයකින් කොටසක් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින් නිකුත් කළ යුතු ය.

**120.** 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 90 වන වගන්තියේ කාර්යය සඳහා මෝටර් වාහනයක්, එම වාහනයේ සත් කාලයේ ලියාපදිංචි අයිතිකරු වන තැනැත්තාගේ දේපළ ලෙස සැලකිය යුතු ය.

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 90 වන වගන්තියේ කාර්යය සඳහා මෝටර් වාහනයක් ලියාපදිංචි අයිතිකරුගේ දේපළ ලෙස සැලකිය යුතු බව.

## VI වන කොටස

### වෙනත් විධිවිධාන

ගාස්තු.

**121.** (1) නියමිත ගාස්තුවක් පිළිබඳව මේ ප්‍රඥප්තියෙහි සඳහන් කිරීමක් කර ඇති යම් විටෙක දී, ඒ සඳහන් කිරීම, නියෝග මගින් නියමිත අවස්ථාවට උචිත විය හැකි ගාස්තු පිළිබඳව කරන ලද සඳහන් කිරීමක් සේ සැලකිය යුතු ය : තවද මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝගවලින් ප්‍රකාශිතවම අන්‍යාකාර විධිවිධාන සලසා ඇත්තම් මිස එවැනි සෑම ගාස්තුවක්ම—

(අ) මුදලින් හෝ චෙක්පතක්, මුදල් ඇණවුමක් හෝ තැපැල් ඇණවුමක් මගින් ගෙවනු ලැබිය හැකි ය.

(ආ) බස්නාහිර පළාතේ පළාත් සභා අරමුදලට බැර කළ යුතු ය.

(2) 28 වන සහ 98 වන වගන්ති යටතේ අනුමත කරන ලද පරීක්ෂකවරයාට මෝටර් කෝච් රථයක්, මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් හෝ ලොරියක් පරීක්ෂා කිරීම සඳහා ගෙවන ලද ගාස්තුව තමා වෙත තබා ගැනීමට කොමසාරිස්වරයා විසින් බලය දෙනු ලැබිය හැකි ය.

(3) මේ ප්‍රඥප්තිය යටතේ ඉල්ලුම්කරුවකු විසින් ඒ අවසර පත්‍රය සඳහා ගාස්තුව ගෙවනු ලබන්නා වූ ද මේ ප්‍රඥප්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීම ඉල්ලුම්කරු විසින් පැහැර හැරීමේ හේතුව නොවන අන් හේතුවක් නිසා එම අවසර පත්‍රය නිකුත් කරනු නොලබන්නා වූ අවස්ථාවක, තමා විසින් ගෙවන ලද ගාස්තුව කොමසාරිස්වරයාගෙන් ආපසු ලබා ගැනීමට ඒ ඉල්ලුම්කරුට හිමිකම ඇත්තේ ය.

(4) මේ ප්‍රඥප්තිය යටතේ අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම්කරුවකු විසින් අවසර පත්‍රය සඳහා ගාස්තුව වශයෙන් එම ගාස්තුවට වැඩි මුදලක් ගෙවනු ලැබූ අවස්ථාවක, ඒ වැඩිපුර ගෙවන ලද මුදල කොමසාරිස්වරයාගෙන් ආපසු ලබා ගැනීමට ඒ ඉල්ලුම්කරුට හිමිකම ඇත්තේ ය.

නාගරික ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීමේ බලය.

**122.** පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත ප්‍රදේශය නොවන යම් නිශ්චිත ප්‍රදේශයක් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා නාගරික ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

ඉල්ලීමෙහි ඇතුළත් කරුණු සනාථ කිරීම.

**123.** මේ ප්‍රඥප්තිය යටතේ යම් දෙයක් කිරීම සඳහා ඉල්ලීමක් කරනු ලබන්නේ යම් නිලධරයකු හෝ බලධරයකු වෙත ද ඒ නිලධරයා හෝ බලධරයා විසින්, ඉල්ලීමෙහි දක්වන ලද කරුණු කිසිවක් සහ වෙනත් යම් අවශ්‍ය තොරතුරක් තමා සෑහීමට පත්වන ආකාරයෙන් සනාථ කිරීමට නියම කරනු ලැබිය හැකි ය.

අනුපිටපත් නිකුත් කිරීම.

**124.** (1) මේ ප්‍රඥප්තිය හෝ යම් නියෝගයක් යටතේ යම් සහතිකයක්, අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් දෙන ලද හෝ නිකුත් කරන ලද යම් නිලධරයකු හෝ බලධරයකු විසින්, ඒ සහතිකය, අවසර පත්‍රය හෝ බලපත්‍රය, නැති වූ බව, විනාශ වූ බව, විකෘති වූ බව හෝ පළුදු වූ බව තමා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබූ විට, එයට හිමිකම් ලබන තැනැත්තා වෙත සහතිකයක්, අවසර පත්‍රයේ හෝ බලපත්‍රයේ අනුපිටපතක් හෝ අදාළ බලපත්‍රයක් සම්බන්ධයෙන් නම් එහි වලංගු කාලය ඉතිරි කොටස සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය : තවද, එසේ නිකුත් කරන ලද අනුපිටපතක් හෝ බලපත්‍රයක් යම් නියෝගයක විධිවිධානවලට අනුකූලව අවස්ථාවෝචිත පරිදි ප්‍රදානය කරන ලද හෝ නිකුත් කරන ලද සහතිකයක්, අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(2) යම් නිලධාරයකු හෝ බලධාරයකු වෙත යම් සහතිකයක්, අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් පවරාණය කිරීමේ හේතුව මත, ඒ නිලධාරයා හෝ බලධාරයා විසින් (1) වන උපවගන්තිය යටතේ කිසිම අනුපිටපතක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(3) (අ) යම් සහතිකයක, අවසර පත්‍රයක හෝ බලපත්‍රයක කිසිම අනුපිටපතක් නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට දී මිස, මේ වගන්තිය යටතේ කොමසාරිස් විසින් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(ආ) නැති වූ, විනාශ වූ හෝ විකෘති වූ හෝ පලුදු වූ ආදායම් බලපත්‍රයක් වෙනුවෙන් කිසිම මෝටර් වාහන ආදායම් බලපත්‍රයක් එම බලපත්‍රය ඉදිරියට වලංගු වන කාලය වෙනුවෙන් මාසික අනුපාතික ගාස්තුවක් අයකර මිස බලපත්‍රය නිකුත් කිරීමේ බලධාරයකු විසින් මේ වගන්තිය යටතේ නිකුත් කරනු නොලැබිය යුතු ය. මාස ගණන ගණන් බැලීම සඳහා සෑම දින 30ක් හෝ එයින් කොටසක් එක් මාසයක් ලෙස ගණනය කළ යුතු ය.

(4) සහතිකයක්, අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් නැතිවීමේ හෝ විනාශ වීමේ හේතුව මත (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු වෙත යම් අනුපිටපතක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක, සහතිකය, අවසර පත්‍රය හෝ බලපත්‍රය හෝ ඉන් යම් කොටසක් හදුනන්නාට ආපසු ලැබුණහොත්, ඒ සහතිකය, අවසර පත්‍රය හෝ බලපත්‍රය හෝ එකී කොටස ඒ තැනැත්තා විසින්, අනුපිටපත නිකුත් කරන ලද්ද වූ නිලධාරයා හෝ බලධාරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**125.** මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වරදක් පනත යටතේ සිදුකර ඇති බව සැක කිරීමට යම් පොලිස් නිලධාරයකුට හෝ ග්‍රාම නිලධාරයකුට හේතු ඇති අවස්ථාවේ දී මෝටර් වාහනයේ සිටි රියැදුරාගේ, කොන්දොස්තර කෙනෙකු වේනම් ඔහුගේ සහ ගමන් කළ තැනැත්තන්ගේ නම, ලිපිනය, විස්තරය පූර්ණ ක්‍රියා කලාපය සහ ආශ්‍රිත නැත් පිළිබඳව තමා සන්තකයේ ඇති සියලු තොරතුරු සැපයීමට ඔහු විසින් හෝ වෙනයම් පොලිස් නිලධාරයකු විසින් හෝ ග්‍රාම නිලධාරී විසින් නියම කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය. — මෝටර් වාහනයේ රියදුරු සහ ගමන් කරන්නන් පිළිබඳ තොරතුරු සැපයීම අයිතිකරුගේ කාර්යය බව.

**126අ.** මෝටර් වාහනයක් ධාවනය කිරීම සම්බන්ධව වරදක් පනත යටතේ සිදුකර ඇති බව සැක කිරීමට යම් පොලිස් නිලධාරයකුට හෝ ග්‍රාම නිලධාරියකුට හේතු ඇති අවස්ථාවක, තමාගේ නම සහ ලිපිනය දක්වමින් දෙන ලෙස ඒ මෝටර් වාහනයේ රියදුරුට ඒ පොලිස් නිලධාරයා විසින් හෝ නියම කරනු ලැබිය හැකි අතර, එසේ කිරීම ඒ රියදුරු පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් නැතහොත් ඔහු ව්‍යාජ නමක් හෝ ලිපිනයක් දුනහොත්, ඔහු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේ ය. — තමාගේ නම සහ ලිපිනය පිළිබඳ තොරතුරු රියදුරු විසින් සැපයිය යුතු බව.

**126.** මෝටර් වාහනයක අයිතිකරු විසින්, රියදුරකු හෝ කොන්දොස්තරවරයකු යොදවනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි ඔහුගේ රියදුරු බලපත්‍රයේ හෝ කොන්දොස්තර බලපත්‍රයේ අනුක්‍රමික අංකය සහ ඔහුගේ සම්පූර්ණ නම සහ ලිපිනය ඔහුගෙන් ලබාගත යුතු ය. — රියදුරන් සහ කොන්දොස්තරවරුන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම අයිතිකරුවන්ගේ කාර්යය බව.

**127.** මේ ප්‍රඥප්තිය යටතේ වරදක් පිළිබඳ හේතුවක් නිසා, පනත තුළ යම් මහා මාර්ගයකට, පාලමකට හෝ ලාම්පු කණුවකට, ස්ථාන පයින්පයකට, ටෙලිග්‍රාෆ් හෝ ටෙලිෆෝන් කණුවකට හෝ කම්බියකට හෝ ද්‍රව්‍ය මත හරස් පාරක ඇති බෝට්ටුවකට හෝ මහා මාර්ගයක හෝ ඒවා ආසන්නයෙන් සවිකර ඇත්තා වූ හෝ ඉදිකර ඇත්තා වූ ද ආණ්ඩුවේ හෝ බස්නාහිර පළාත් සභාවේ යම් දෙපාර්තමේන්තුවක් හෝ යම් පළාත් පාලන ආයතනයක් භාරයේ පවත්නා වූ ද — මහා මාර්ග, පාලම් ආදියට සිදුවන අලාභහානි අයකර ගැනීම.

සවිරාකාර විස්තරයක හෝ වෙනත් යම් සවි කිරීමකට හෝ උපකරණයකට යම් හානියක් සිදු කර ඇත්තේ නම්, දෙපාර්තමේන්තුව හෝ ආයතනය විසින් ඒ හානිය අලුත්වැඩියා කිරීමට සැලැස්විය යුතු අතර, අලුත්වැඩියාවක් කිරීමට පෙර හෝ පසුව හානිය සිදු කළ මෝටර් වාහනයේ අයිතිකරුගෙන් එම ඇස්තමේන්තු කළ හෝ සැබෑ වියදම් අයකර ගනු ලැබිය යුතු ය.

පරීක්ෂණ සහතිකය සාක්ෂි වශයෙන් ආවේශ විය යුතු බව.

**128.** මේ පුඥප්තිය යටතේ වූ යම් නඩු කටයුතුවල දී යම් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් මේ පුඥප්තියේ හෝ යම් වාහනයක් සම්බන්ධයෙන් මේ පුඥප්තියේ හෝ යම් නියෝගයක හෝ විධිවිධාන අනුව ක්‍රියාකාර තිබේද නැද්ද යන ප්‍රශ්නයක් පැනනගින් යම් රෝද තුලාවක්, කිරුම් පාලමක් හෝ මෝටර් වාහනවල බර කිරීම සඳහා වූ වෙනත් බර කිරීමේ යන්ත්‍රයක් නිවැරදිද නැද්ද යන ප්‍රශ්නයක් උද්ගත වූ අවස්ථාවක, තමා විසින් අවස්ථාවෝචිත පරිදි, වාහනය හෝ රෝද තුලාව, කිරුම් පාලම හෝ මෝටර් වාහනවල බර කිරීම සඳහා වූ වෙනත් කිරුම් යන්ත්‍රය හෝ පරීක්ෂා කරන ලද බවට වූ ද, තමාගේ පරීක්ෂණයේ ප්‍රතිඵල සඳහන් වන්නා වූ ද යම් පරීක්ෂකවරයකු, සහතික කිරීමේ නිලධරයකු හෝ වෙනත් නියමිත නැතැත්තකු විසින් නිකුත් කරන ලද සහතිකය, සාක්ෂි වශයෙන් ආවේශ විය යුතු අතර ප්‍රස්තුත කාරණයට අදාළව ඒ සහතිකයෙහි සඳහන් යම් කියවීමක් හෝ මතයක් සම්බන්ධයෙන් ප්‍රමාණවත්, මුල් බැල්මට පෙනෙන සාක්ෂි විය යුතු ය. තවද විත්තිකරු යම් අධිකරණයට පෙනී යන පටහැනි සාක්ෂි දෙනු ලැබ ඇතිනම් මිස හෝ යුක්තිය ඉටු වීම පිණිස හරස් ප්‍රශ්න ඇසීම අවශ්‍ය යයි යම් හේතුවක් නිසා අධිකරණය සලකනු ලබන්නේ නම් මිස සහතිකය සම්බන්ධයෙන් පරීක්ෂකවරයා, නිලධරයා හෝ වෙනත් නැතැත්තා හරස් ප්‍රශ්න ඇසීම සඳහා කැඳවීමට අධිකරණය විසින් අවසර නොදිය යුතු ය.

නියෝග සෑදීම සඳහා සාමාන්‍ය බලතල

**129.** (1) මේ පුඥප්තිය යටතේ නියෝග සෑදිය යුතු යයි නියම කරන ලද හෝ බලය දෙන ලද සියලු කරුණු නියම කළ යුතු යයි මේ පුඥප්තියෙන් ප්‍රකාශිත හෝ නියමිත සියලු කරුණු සහ ඒ කරුණුවලට අනුෂංගික හෝ සම්බන්ධිත වෙනත් සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර ඒ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයෙහි සඳහන් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතිය සඳහා බස්නාහිර පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලදැයි සැලකෙන්නේ යම් දිනයක සිට ද ඒ දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා ආණ්ඩුවේ සහ පළාත් සභා සේවයේ නැතැත්තන්ට හා මෝටර් වාහනවලට පුඥප්තිය අදාළ වන බව.

**130.** මේ පුඥප්තියේ අන්‍යාකාර විධිවිධාන සලසා ඇති පරිදි හැර මේ පුඥප්තියේ විධිවිධාන බස්නාහිර පළාත තුළ ශ්‍රී ලංකා ආණ්ඩුවේ හා පළාත් සභා සේවයේ යෙදවනු ලබන නැතැත්තන්ට සහ මෝටර් වාහනවලට අදාළ විය යුතු ය.

එසේ වුවද, ජනාධිපතිවරයා විසින් හෝ අග්‍රාමාත්‍යවරයා විසින් හෝ සාමාන්‍යයෙන් පාවිච්චි කරනු ලබන යම් මෝටර් වාහනයකට 2 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

131. මේ ප්‍රඥප්තියේ විධිවිධානවලින් හෝ අවශ්‍යතාවෝචිත පරිදි අවසර පත්‍රයකින් හෝ බලපත්‍රයකින් හෝ ඊට අනුයුක්ත කොන්දේසි කිසිවකින් ලැබෙන ප්‍රතිලාභ කිසිවක් නොකඩවා ලබා ගැනීමේ යම් අයිතියක්, ඒ යටතේ දෙන ලද හෝ නිකුත් කරන ලද අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් දරන්නකු වෙත මේ ප්‍රඥප්තියේ කිසිවකින් පවරනු ලබන්නේ යයි සලකනු නොලැබිය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. බලපත්‍ර යනාදිය ආරක්ෂා කිරීම.

## VII වන කොටස

### අර්ථ නිරූපණය

අර්ථ නිරූපණය. **132.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ප්‍රඥප්තියෙහි —

"අත් ට්‍රැක්ටරය" යන්නෙන්, (රියදුරු ඇතුළුව) තැනැත්තන් හය දෙනකුට නොවැඩි සංඛ්‍යාවක් සහ බඩු ගෙන යාම සඳහා යොදා ගනු ලබන, ට්‍රේලරයක් සවි කරන ලද රෝද දෙකේ ට්‍රැක්ටරයක් අදහස් වේ ;

"අධි ගමනය" යන්නට එකම දිශාවට ගමන් කෙරෙන වෙන යම් වාහන පසු කිරීම හෝ පසු කිරීමට තැත් කිරීම ඇතුළත් වේ ;

"ආබාධිතයන් සඳහා වූ රථය" යන්නෙන්, යම් ශාරීරික ඌනතාවකින් හෝ අබලතාවකින් පෙළෙන තැනැත්තන් විසින් පාවිච්චි කරනු ලැබීම සඳහා විශේෂයෙන් සැලසුම් කළ සහ සාදා ගත් හෝ සකස් කර ගත් රථයක් වන්නා වූ ද, ඒ තැනැත්තන් විසින් පමණක් පාවිච්චි කරනු ලැබීමට අදහස් කළ වූ ද මෝටර් වාහනයක් අදහස් වේ ;

"ආරක්ෂණ සහතිකය" යන්නෙන්, 24 (2) වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක් අදහස් වේ ;

"ඈඳූ වාහනය" යන්නෙන් අවස් මෝටර් වාහනයට අධිස්ථාපනය වන සේ සහ අමුණා ඇත්තා වූ ද බරින් ප්‍රමාණවත් කොටසක් මෝටර් වාහනය මගින් දරන්නා වූ ද ට්‍රේලරයක් අමුණා ඇති මෝටර් වාහනයක් අදහස් වේ ;

"ඉඩම් වාහනය" යන්නෙන්, මට්ටම් කිරීමේ, හෑරීමේ පස් ඉවත් කිරීමේ, කැලෑ කටයුතු කිරීමේ හෝ ඒ හා සමාන යම් ක්‍රියාකාරකමක් වැනි සාමාන්‍යාර්ථික හෝ ඉදිකිරීමේ කාර්යයක් සම්බන්ධයෙන් ඉඩම්වල පාවිච්චි කිරීම සඳහා අදහස් කරන ලද යාන්ත්‍රික වශයෙන් පදවනු ලබන (ට්‍රේලරයක් ද ඇතුළු) වාහනයක් අදහස් වේ. එහෙත් පාර තලන ගල් රෝලක් ඊට ඇතුළත් නොවේ ;

"කුලී ධාවනය" යන්නෙන්, මහා මාර්ගයක හෝ වෙනත් ස්ථානයක මගීන්ට කුලියට දීම සඳහා සිටුවා තැබීම හෝ සතර කර තැබීම අදහස් වේ ;

"කොමසාරිස්" යන්නෙන්, බස්නාහිර පළාතේ මෝටර් රථ ප්‍රවාහන පළාත් කොමසාරිස් අදහස් වේ ;

"කොළඹ" යන්නෙන්, කොළඹ නාගරිකය අදහස් වේ ;

"කොන්දොස්තර" යන්නෙන්, බස් රථයක මගීන් ගෙන යාමේ කටයුතු භාරව සිටින තැනැත්තා අදහස් වේ ;

"ග්‍රාම නිලධාරී" යන්නෙන්, පොලිස් කාර්යය ඉටු කිරීම පිණිස දිසාපතිවරයකු හෝ උප දිසාපතිවරයකු විසින් බලය දෙන ලද්දා වූ ද, බලය දෙන ලද නිල ඇඳුම හෝ පදක්කම පැළඳ සිටින්නා වූ ද ග්‍රාම නිලධාරියකු අදහස් වේ ;

"ට්‍රැක්ටරය" යන්නෙන්, වෙනත් වාහනයක බර ඇදීම සඳහා පමණක් නිර්මාණය කරන ලද්දා වූ ද, සැතැත්තන් හෝ බඩු ගෙන යාම සඳහා නො වූ ද මෝටර් වාහනයක් අදහස් වේ ;

"ට්‍රේලරය" යන්නට ලෑගුම් රථයක් සහ මෝටර් වාහනයකට ඈඳූ සහ මෝටර් වාහනයක් මඟින් ඇද ගෙන යනු ලබන්නා වූ සෑම විස්තරයක වාහනයක්ම ඇතුළත් වේ. එහෙත්, මෝටර් පාපැදියකට ඈඳූ පැති රථයක් ඊට ඇතුළත් නොවේ ;

"නාගරික ප්‍රදේශය" යන්නෙන් —

(අ) යම් මහ නගර සභාවක හෝ නගර සභාවක සීමා ඇතුළත පිහිටි යම් ප්‍රදේශයක් ; හෝ

(ආ) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා නාගරික ප්‍රදේශයක් ලෙස නියෝගයකින් ප්‍රකාශිත වෙනත් යම් ප්‍රදේශයක්

අදහස් වේ ;

"නැවතුම් ස්ථානය" යන්නෙන්, මගීන් නංවා ගැනීමේ හා බැස්සවීමේ කාර්යය සඳහා මෝටර් බස් රථ නතර කරනු ලැබිය හැකි ස්ථානයක් වශයෙන් මේ ප්‍රඥප්තිය යටතේ වෙන් කරන ලද ස්ථානයක් අදහස් වේ ;

"නියමිත" යන්නෙන්, මේ ප්‍රඥප්තියෙන් හෝ ඒ යටතේ යම් නියෝගයක් මඟින් නියමිත බව අදහස් වේ ;

"නියෝගය" යන්නෙන්, මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝගයක් අදහස් වේ ;

"තාර බර" යන්නෙන්, බඩු පටවා නොමැති විටක, ඇකිලුම්ප්ලේට්වල බර ද ඇතුළුව, එහෙත්, ජලය හෝ ඉන්ධන කිසිවක බර නොමැතිව සම්පූර්ණ උපකරණ සවි කළ මෝටර් වාහනයක සැබෑ බර අදහස් වේ ;

"ද්විකාර්ය වාහනය" යන්නෙන්, පුද්ගලයන් සහ භාණ්ඩ යන දෙකම එකවර ප්‍රවාහනය කිරීම සඳහා සැලසුම් කොට සාදනු ලැබ ඇති වාහනයක් අදහස් වේ. එසේ ද වුවත්, එකී ප්‍රවාහනය කළ යුතු පුද්ගලයන් සංඛ්‍යාව පෞද්ගලික මගී වාහනයක රැගෙන යාමට අවසර දී ඇති සංඛ්‍යාව (නමය) නොඉක්මවිය යුතු ය ;

"ප්‍රසිද්ධ රථ නැවතුම් පොළ" යන්නෙන්, බස් රථ, ලොරි හෝ යම් නිශ්චිත පංතියක හෝ වර්ගයක බස් රථ හෝ ලොරි කුලී සඳහා නතර කළ හැකි හෝ නතර කර තැබිය හැකි ස්ථානයක් වශයෙන් මේ ප්‍රඥප්තිය යටතේ වෙන් කර ඇති ස්ථානයක් අදහස් වේ ;

"පරීක්ෂක" යන්නෙන්, මේ ප්‍රඥප්තිය යටතේ පත් කරන ලද්ද වූ හෝ පත් කළ යුතු යයි සලකන ලද්දා වූ මෝටර් වාහන පරීක්ෂකවරයෙක් අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහා නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ ;

"පළාත" යන්නෙන් ගම්පහ, කොළඹ, කළුතර යන පරිපාලන දිස්ත්‍රික්ක තුනම ඇතුළත් බස්නාහිර පළාත අදහස් වේ ;

"පොලිස් නිලධාරියා" යන්නෙන්, නිල ඇඳුමින් සිටින පොලිස් හමුදාවේ සාමාජිකයකු අදහස් වේ ;

"පෞද්ගලික කෝච් රථය" යන්නෙන්, පෞද්ගලික කෝච් රථයක් වශයෙන් ලියාපදිංචි කරන ලද මෝටර් කෝච් රථයක් අදහස් වේ ;

"බලපත්‍ර නිකුත් කිරීමේ බලධාරියා" යන්නෙන් —

(අ) කොමසාරිස් හෝ ඔහු විසින් බලය පවරන ලද ප්‍රාදේශීය ලේකම්වරු අදහස් වේ ;

"බස් රථය" යන්නෙන්, බස් රථයක් වශයෙන් ලියාපදිංචි කළ මෝටර් කෝච් රථයක් අදහස් වේ ;

"මගියා" යන්නෙන්, බස්රථයක රැගෙන යනු ලබන තැනැත්තෙකු අදහස් වන අතර රියැදුරු හෝ කොන්දොස්තර ඊට ඇතුළත් නොවේ ;

"මහා මාර්ගය" යන්නට මහජනයාට මාර්ග අයිතියක් ඇත්තා වූ හෝ මහජනයාට හෝ මහජනයා අතරෙන් යම් කොටසකට ප්‍රවේශයක් දී ඇත්තා වූ සෑම ස්ථානයක් සහ පොලිස් නිලධාරියකු විසින් මෝටර් වාහන ක්‍රමවත්ව ධාවනය කරවනු ලබන්නා වූ සෑම ස්ථානයක් ම ඇතුළත් වේ ;

"මාර්ග සලකුණු" යන්නට, මහා මාර්ගය පාවිච්චි කරන තැනැත්තන්ට මග පෙන්වීම හෝ ඔවුන්ට උපදෙස් සැපයීම සඳහා මහා මාර්ගයක හෝ ඒ අසල ඉඳි කර හෝ සපයා ඇති විදුලි බලයෙන් හෝ යාන්ත්‍රිකව හෝ වෙනත් ක්‍රමයකින් ක්‍රියාත්මක කෙරෙන සියලු සංඥා සියලු අනතුරු ඇඟවීමේ සංඥා පුවරු මග පෙන්වීමේ කණු, සලකුණු, ලකුණු හෝ උපකරණ ඇතුළත් වේ ;

"මෝටර් අවමංගල්‍ය රථය" යන්නෙන්, මළ ශරීර භූමදාන කිරීම හෝ ආදාහන කිරීම සඳහා ගෙන යාම පිණිස විශේෂයෙන් සැලසුම් කරන ලද හෝ නිර්මාණය කරන ලද මෝටර් වාහනයක් අදහස් වේ ;

"මෝටර් කෝච් රථය" යන්නෙන්, මෝටර් ගිලන් රථයක්, මෝටර් අවමංගල රථයක් හෝ නොවන්නා වූ ද (රියැදුරු ඇතුළුව) තැනැත්තන් නව දෙනකුට වැඩි ගණනක් සහ ඔවුන් ගේ බඩු බාහිරාදිය ගෙන යාමට සාදා ගන්නා ලද හෝ යොදා ගනු ලැබ ඇති මෝටර් වාහනයක් අදහස් වන අතර එසේ සාදා ගන්නා ලද හෝ යොදා ගනු ලැබ ඇති ට්‍රේලරයක් ද ඊට ඇතුළත් වේ ;

"මෝටර් ගිලන් රථය" යන්නෙන්, සම්පූර්ණයෙන්ම හෝ ප්‍රධාන වශයෙන් රෝගී හෝ තුවාල වූ තැනැත්තන් ගෙන යාම සඳහා නිර්මාණය කරන ලද හෝ සකස් කර ගන්නා ලද මෝටර් වාහනයක් අදහස් වේ ;

"මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය" යන්නෙන්, කිලෝ ග්‍රෑම් හාරසියයක් නොඉක්මවන තාර බරක් ඇත්තා වූ ද, රෝද තුනක් මත ගමන් කිරීමට සැලසුම් කර ඇත්තා වූ ද, බඩු ගෙන යාම සඳහා සම්පූර්ණයෙන්ම හෝ ප්‍රධාන වශයෙන් සාද, හෝ සකස් කර ගෙන ඇත්තා වූ ද මෝටර් වාහනයක් අදහස් වේ ;

"මෝටර් ට්‍රයිසිකලය" යන්නෙන්, රෝද තුනක් මත ගමන් කිරීම සඳහා සැලසුම් කර ඇත්තා වූ ද, තාර බර කිලෝ ග්‍රෑම් හාරසීයක් නොඉක්මවන්නා වූ ද සම්පූර්ණ වශයෙන් හෝ ප්‍රධාන වශයෙන් තැනැත්තන් ගෙන යාම සඳහා සාද, ගන්නා ලද හෝ යොද ගනු ලැබ ඇති මෝටර් වාහනයක් අදහස් වේ ;

"මෝටර් ප්‍රවාහන උපදේශක සභාව" යන්නෙන්, මේ ප්‍රඥප්තියේ 108 වන වගන්තිය යටතේ පිහිටුවන ලද මෝටර් ප්‍රවාහන උපදේශක සභාව අදහස් වේ ;

"මෝටර් රථය" යන්නෙන්, මෝටර් සයිකලයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ගිලන් රථයක්, මෝටර් අවමංගල්‍ය රථයක් හෝ ආබාධිතයන් සඳහා වූ රථයක් හෝ නොවන්නා වූ ද (රියදුරු ඇතුළුව), තැනැත්තන් නව දෙනකුට නොවැඩි ගණනක් සහ ඔවුන්ගේ බඩු බාහිරාදිය ගෙන යාම සඳහා සාදන ලද හෝ යොද ගනු ලැබ ඇත්තා වූ ද (රියදුරු ඇතුළුව), තැනැත්තන් නව දෙනකුට නොවැඩි ගණනක් සහ ඔවුන්ගේ බඩු බාහිරාදිය ගෙන යාම සඳහා යොදා ගනු ලැබිය හැකි බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වන්නා වූ ද මෝටර් වාහනයක් අදහස් වන අතර එසේ සාදා ගන්නා ලද හෝ යොද ගනු ලැබ ඇති ට්‍රේලරයක් ද ඊට ඇතුළත් වේ.

"මෝටර් වාහන" යන්නෙන් —

(අ) මාර්ගවල පාවිච්චි කිරීම සඳහා අදහස් කරන ලද හෝ අනුවර්තිත, ට්‍රැක්ටරයක් හෝ ට්‍රේලරයක් ඇතුළු යම් යාන්ත්‍රානුසාරයෙන් ධාවනය කරනු ලබන වාහනයක් අදහස් වේ. එහෙත් ඊට ගල් රෝලත් හෝ මෝපෙඩයක් ඇතුළත් නොවේ ; තවද

(ආ) මට්ටම් කිරීම, මඩ කැණීම, පස් ඉවත් කිරීම, කාණු කැපීම හෝ ඊ සමාන යම් කටයුත්තක් වැනි කෘෂිකාර්මික හෝ ඉදි කිරීමේ කාර්යයක් සම්බන්ධයෙන් තොටබිම පාවිච්චි කිරීම සඳහා අදහස් කර ලද යම් යාන්ත්‍රානුසාරයෙන් ධාවනය කරනු ලබන වාහනයක් අදහස් වේ. එහෙත් ගල් රෝලත් හෝ මෝපෙඩයක් ඊට ඇතුළත් නොවේ ;

"මෝටර් සයිකලය" යන්නෙන්, මෝපෙඩයක් හෝ මෝටර් ට්‍රයිසිකලයක් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් හෝ නොවන්නා වූ ද අමුණා ඇති යම් පැති රථයක තාර බර ඇතුළුව කිලෝ ග්‍රෑම් දෙසීය පනහක් නොඉක්මවන තාර බරක් ඇත්තා වූ ද, රෝද තුනකට නොවැඩි ගණනක් මත ගමන් කිරීමට සැලසුම් කරන ලද්දා වූ ද මෝටර් වාහනයක් අදහස් වේ ;

"මෝපෙඩය" යන්නෙන්, පැදවීම පිණිස පැඩල් සවිකර ඇත්තා වූ සහ සෙන්ටිමීටර් පණසකට නොවැඩි ඝණ ධාරිතා පද්ධතියක් ඇති අභ්‍යන්තර දහන එන්ජිමක් සහිත වාහනයක් අදහස් වේ ;

"රක්ෂණ සහතිකය" යන්නෙන්, 23(4) වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක් අදහස් වේ ;

"රාත්‍රියේදී" යන්නෙන්, හිරු බැසීමෙන් පැය කාලකට පසු සහ හිරු නැගීමෙන් පැය කාලකට පෙර කාල සීමාව ඇතුළත වූ යම් වේලාවක් අදහස් වේ ;

"රියදුරු" යන්නෙන්, මෝටර් වාහනයක් ක්‍රියා කරවීමේ කාර්යය සඳහා තත් කාලයේ ඒ වාහනය භාරව සිටින තැනැත්තා අදහස් වේ ;

"ලොරිය" යන්නෙන්, බඩු ගෙන යාම සඳහා සම්පූර්ණයෙන්ම හෝ ප්‍රධාන වශයෙන් නිර්මාණය කර හෝ සකස් කර ගෙන ඇති මෝටර් වාහනයක් අදහස් වන අතර එසේ නිර්මාණය කර ගන්නා ලද හෝ සකස් කර ගන්නා ලද ට්‍රේලරයක් ද ට්‍රැක්ටරයක් ද ඒවා ඇතුළත් වන නමුත් ඉඩම් වාහනයක් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් ඒවා ඇතුළත් නොවේ ;

"වාහන" යන්නට, බයිසිකල්, ට්‍රයිසිකල්, මෝටර් වාහන, සෑම විස්තරයක වාහන, පයින් ගමන් කරන්නන්, පෙරහැරවල්, භට හමුදා, සහ පිට උඩ යන දක්කා ගෙන යන හෝ ගෙන යන සියලු සතුන් ද ඇතුළත් වේ ;

"වාහන අවහිරය" යන්නට, මහා මාර්ගයේ වාහනවලට අනතුරක් හෝ හානියක් වන යම් අවදානමක් සිදු විය හැක්කා වූ හෝ මහා මාර්ගයේ නීතියෙන් නියමිත හෝ අවසර දී ඇති යම් ආකාරයක ආබාධ වාහන ගමනා ගමනයකට බාධා විය හැක්කා වූ හෝ හිතාමතාම කළ යම් ක්‍රියාවක් හෝ මහා මාර්ගය අසාධාරණ ලෙස පාවිච්චි කිරීමක් ඇතුළත් වේ ;

"වාහන නැවතුම් ස්ථානය" යන්නෙන්, මෝටර් වාහන හෝ යම් නියමිත පංතියක හෝ විස්තරයක මෝටර් වාහන නවතා තැබිය හැකි ස්ථානයක් වශයෙන් මේ ප්‍රඥප්තිය යටතේ වෙන් කර ඇති ස්ථානයක් අදහස් වේ ;

"වාහන නිරීක්ෂක" යන්නෙන්, රථ වාහන පාලනය කිරීමේ කාර්යය සඳහා දිස්ත්‍රික්කයක පොලිස් අධිකාරිවරයා හෝ සහකාර පොලිස් අධිකාරිවරයා විසින් ලියවිල්ලකින් පත් කරන ලද්ද වූ ද, පොලිස්පතිවරයා විසින් අනුමත කරන ලද ඇඳුමක් ඇඳ සිටින්නා වූ ද තැනැත්තෙක් අදහස් වේ ;

"වාහනය නවතා තැබීම" යන්නෙන්, මෝටර් වාහනයක් ස්ථාවර තත්ත්වයකට ගෙන ඒම හෝ තැනැත්තන්, මගීන් හෝ බඩු වහාම නංවා ගැනීම හෝ බැස්වීමක් වෙන යම් කාර්යයක් සඳහා නතර කර තැබීමට නැවැත්වීම අදහස් වේ ;

"සතා" යන්නෙන්, ඇතා, අශ්වයා, බූරුවා, කොටළුවා, බැටළුවා, එළුවා හෝ ඌරා අදහස් වේ.

## උපලේඛනය – 110 (අ) වගන්තිය

| I<br>ප්‍රඥප්තියේ වගන්තිය | II<br>විස්තරය | III<br>දඩ මුදල<br>රු. ශ. |
|---|---|---|
| 2 | ආදායම් බලපත්‍රය ලබාගැනීමට අපොහොසත්වීම | 100 0 |
| 14 | ආදායම් බලපත්‍ර මෝටර් වාහනවල ගෙන යායුතු බව හා නියම කරනු ලැබූ විට ඉදිරිපත් කළ යුතු බව | 100 0 |
| 21 | ආදායම් බලපත්‍ර කල් ඉකුත්වීමෙන් මෝටර් වාහන පාවිච්චි කිරීම පිළිබඳ වූ සීමා කිරීම | 50 0 |
| 45 (1) (අ) | රියදුරු බලපත්‍රය නොමැතිව රිය ධාවනය කරගෙන කිරීම | 150 0 |
| 45 (1) (ආ) | රියදුරු බලපත්‍රයක් නොමැතිව තැනැත්තෙක් සේවා නියුක්ත කර ගැනීම | 150 0 |
| 45 (2) | වයස අවුරුදු 18ට අඩු රියදුරු | 150 0 |
| 49 | අධික වේගයෙන් රිය ධාවනය | 200 0 |
| 57 | මාර්ග නීති කඩ කිරීම | 200 0 |
| 57 | මාර්ග නීති කඩ කිරීම නිසා අනතුරු ඇතිවීම | 250 0 |
| 58 (1) | අනතුරු වැළැක්වීමට අපොහොසත්වීම | 250 0 |
| 60 (3) | නොසැලකිලිමත් කම නිසා අනතුරු ඇතිවීම | 250 0 |
| 61 | මෝටර් වාහනය ධාවනය කරන විට රියදුරුගේ තත්ත්වය | 100 0 |
| 62 | රියදුරන් විසින් දිය යුතු සංඥා | 100 0 |
| 63 | මෝටර් වාහන පිටුපසට ධාවනය කිරීම | 20 0 |
| 64 | ශබ්ද හෝ ආලෝක මගින් අනතුරු ඇඟවීම | 100 0 |
| 65 | මෝටර් වාහන පාලුවට ඇරදමා තැබී යාම හෝ තැබී යාමට අවසරදීම | 100 0 |
| 66 | මෝටර් රථවල ඉදිරිපස ආසනවල ගමන් කරන තැනැත්තන් ගණන | 100 0 |
| 66 (2) | මෝටර් සයිකල්වල පසු ආසනයෙහි එක් අයෙකුට වැඩියෙන් යෑම | 100 0 |
| 66 (3) | ආරක්ෂක හිස් වැසුම් පැළඳීම පැහැර හැරීම | 100 0 |
| 67 | ප්‍රධාරක දැල්වීම් බොඳ කිරීම | 150 0 |
| 68 | ශබ්ද විකාශන උපකරණ හා ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කිරීම | 150 0 |
| 71 | පොලිස් නිලධාරියෙක් දෙන රථවාහන හැසිරවීමේ සංඥාවලට අවනත නොවීම | 150 0 |
| 73 | මේ වගන්තිය යටතේ පනවන රෙගුලාසිවල දැක්වෙන වරදවල් | 150 0 |
| 74 (1) | වැංකියට පෙට්‍රල් ලබාගන්නා විට ආරක්ෂක විධි | 100 0 |
| 74 (2) | ඉන්ධන පිටකරන විට හෝ වත් කරන විට ගතයුතු ආරක්ෂක විධි | 100 0 |
| 75 | මහා මාර්ගයක මෝටර් වාහන අතහැර කිරීම හෝ නවතා තැබීම | 150 0 |
| 76 | මහා මාර්ගයක මෝටර් වාහනයක් නවතා තබනු ලැබූ හෝ අනාරක්ෂිතව තබා යන හෝ ක්‍රියා විරහිත වූ විට ගතයුතු ආරක්ෂක විධි | 150 0 |
| 83 | නියමිත ගණනට වඩා මගීන් ගෙනයාම | 150 0 |
| 86 | මගීන් පදනා තැරවු කිරීම | 100 0 |
| 89 (1) | බලපත්‍ර ලත් කොන්දොස්තරවරයකු නොමැතිව මගී රථයක් පාවිච්චි කිරීම | 100 0 |
| 89 (2) | කොන්දොස්තර ලාංඡනය පැළඳ නොසිටීම | 100 0 |
| 90 | වැඩිපුර බර පටවාගෙන යාම | 150 0 |
| 91 | ලොරියක ගෙන යා හැකි තැනැත්තන් | 150 0 |
| 98 (6) | රක්ෂණ සහතිකය වාහනයේ ගෙන නොයාම | 150 0 |